රළ සමග

ISSN 1391 - 1031
2016 නොවැම්බර්
22 වෙළුම 08 කලාපය

ආධාරය රු 30/=

# ඇ නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී

"අපගේ විප්ලවය ඉහත ඇතිවූ සියලු විප්ලවවලට වඩා වෙනස්ය. එය පොදු ජනතාව අතර ඉදි කිරීමේ සහ නිර්මාණය කිරීමේ අභිලාෂයක් ජනිත කර තිබේ. එය ඉතාමත් දුර බැහැර ගම්වල ජනතාව, නැතහොත්, සාර්වරුන්, ඉඩම් හිමියන් සහ ධනපතියන් විසින් නින්දාවට, පෑගීමට සහ පීඩනයට භාජනය කරනු ලැබූ ජනතාව කුල්මත් කර තිබේ. මෙය විප්ලවයේ කාල පරිච්ඡේදයකි. ග්‍රාමීය විප්ලවය දැන් සිදුවෙමින් පවතින්නක් හෙයින්, මෙය මේ දැන් සිදුකෙරෙන විප්ලවයේ කාලයකි. මෙය නව ජීවනයක් ගොඩනගන විප්ලවයේ කාලයකි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**8වන වෙළුම, 25 පිටුව**



**05 ආණ්ඩුව හොරුන්...**



අලුත් ආණ්ඩුව බිහිවූ වහාම එජාප ඇමතිවරුද පරණ 'ඇරියස් කවර් කිරීමේ' ක්‍රියාමාර්ගවලට...

**07 බොන ජලය...**



කර්මාන්ත ශාලාවලින් බැහැර කරන අප ජලය තුළ මිනිස් ශරීරයට අහිතකර ද්‍රව්‍ය අධික ප්‍රතිශතවලින්...

**11 ලෝකය විවිධත්වයේ...**



ලෝකයේ පැවැත්මේ මෙම ස්වරූපය වටහා ගත නොහැකි වුවහොත් ලෝකය...

සංවාදය........................ 03
තරුණ........................ 04
ආවර්ජනා........................ 06
ජාත්‍යන්තර........................ 08
කාන්තා........................ 10
කාලීන........................ 12
වේදිකාව........................ 13
විශේෂාංග........................ 14

# කෝප් සටනින් ආණ්ඩුව පරාදයි!

02 පිටුවට

## උස්ම කඳු මුදුනත නුඹ...

දිය වී වැටෙන කඳු අතර
තවමත් නොසෙල් වී
බැබැලෙන
උස්ම කඳු මුදුනත නුඹ

තරණයට එති බොහෝ අය
නුඹ "අපි" වගේ යැයි කියමින
මනස් විකාරම දොඩමින...

නුඹ නුඹ ම වූ විට
බැබැලිය හැකිද සතුරු
හිසකට
නුඹේ අසලින් වෙනස් අහසක

තවමත් මගේ මව් බිම
සිව් දිගම ගම් බිම්වල
දළුලා වැඩෙයි අලුත් තණපත්
නුඹෙන් දහරිය අරගෙන

අලුත් වන සෑම දිනකම
නුඹේ පාටට පැහැය අරගෙන
අලුත් ගම් බිම් බලයි කඳු හිස

සිහින මත්තේ හැපී මියැදෙන
මගේ මව්බිම සුවහසක් දන
නුඹ මතින් එන සූර්යෝදක
සැබෑ ජීවෙන් පණ ලබනු ඇත

උස්ව බැබලෙන නුඹේ සිරසට
ඉල්මහේ රතු මල් පිපෙන විට
මගේ මව් බිම
නුඹේ පැහැයෙන්
අලුත් ලෝකය ජය ලබනු ඇත

(2016 නොවැම්බර් 13 දිනට යෙදෙන 27 වැනි ඉල් මහ විරු සමරුව නිමිත්තෙනි)

**2016.10.26 දින වැට් බද්දට එරෙහිව පාර්ලිමේන්තු වටරවුමේදී...**




**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# ජනාධිපතිවරයාගේ ඇස් ඇරවන්න ලංගමයෙන් පෙත්සමක්

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය ක්‍රමානුකූලව විනාශ කිරීම සඳහා සැලසුම් කර ඇති ශ්‍රී ලංගමය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය නතර කිරීම ඇතුළු ඉල්ලීම් කීපයක් සඳහා ජනාධිපතිවරයාට සහ බලධාරීන්ට බලකිරීමේ පෙත්සමක් අත්සන් කිරීම පසුගිය 18වැනිදා පෙරවරුවේ පිටකොටුව මධ්‍යම බස්රථ නැවතුම්පොළේදී සිදු විය.

ආණ්ඩු වෙනස් වන වෙනස් වන වාරයක් පාසා දේශපාලන බල අධිකාරිය විසින් ශ්‍රීලංගමය තුළ සිදුකරන උසස්වීම් මාරු කිරීම්, වැඩ නැවැත්වීම්, රැකියාවන් අහිමි කිරීම්, සඳහටම නතර කිරීම සඳහා ශ්‍රීලංගමයට විධිමත් ජාතික ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීම සහ නීති විරෝධීව, සදාචාරවිරෝධීව කම්කරු ඇමති වශයෙන් සිටි ගාමිණී ලොකුගේ මැදිහත් වී කම්කරු දෙපාර්තමේන්තුවට පවරා ගන්නා ලද ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලය මගින් පවත්වා ගෙන ගිය අර්ථ සාධක අරමුදල් ගිණුම ඇතුළු සියලුම අරමුදල් නැවත ශ්‍රීලංගම ප්‍රධාන කාර්යාලයට ලබාදීම අනෙක් ඉල්ලීම් වේ.

සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමය විසින් මෙම පෙත්සම අත්සන් කිරීම සංවිධානය කර තිබුණි.



# අනියම් හා ආදේශක සේවකයින් ස්ථිර කරනු! දුම්රිය වෘත්තීය සමිති සටනට




පත්වන සෑම ආණ්ඩුවක් විසින්ම දේශපාලන පත්වීම් ලෙස අනියම් හා ආදේශක පත්වීම් ලබා දී සේවකයන් අතහැර දැමීම දුම්රිය දෙපාර්තමේන්තුව තුළ සාමාන්‍යකරණය වී තිබේ. සේවකයන්ගේ දේශපාලනය කුමක් වුවද සේවකයන් එලෙස අතහැර දැමීමට විරුද්ධව සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමය විසින් සේවක අයිතීන් වෙනුවෙන් මේ වන විට දැඩි සටනකට අවතීර්ණව සිටී. එහි මූලික පියවරක් ලෙස අවිධිමත් බඳවා ගැනීම් වහා නතර කර සුදුසුකම් සපුරා ඇති අනියම් හා ආදේශක සේවකයින් වහා ස්ථිර කරනු යන තේමාව යටතේ ආණ්ඩුවට බලකරන සමුළුවක් පසුගිය 06 පෙරවරුවේ දුම්රිය මුලස්ථාන ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමය හා රැකියා ස්ථිර නොවූ දුම්රිය සේවක එකමුතුව විසින් සංවිධානය කළ සමුළුව සඳහා විශාල පිරිසක් සහභාගි වූහ. පාලනාධිකාරිය විසින් මාධ්‍යවේදීන්ට සමුළුව පැවැත්වෙන ස්ථානයට පැමිණීමට බාධාකර තිබුණි. සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ සහෝදරයා මේ සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ කුමන බාධක පැමිණියද අසාධාරණයට පත්වූ සේවක අයිතීන් දිනා දීමේ සටන අත්නොහරින බවය.

# සුරාබදු නිලධාරී රාජකාරී බාහිරට පවරන්නේ මොන බලයකින්ද?

**කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා**

දෙපාර්තමේන්තුවට අයත් නොවන නිලධාරීන් යොදවා සුරාබදු දෙපාර්තමේන්තුව තුළ විශේෂ ඒකකයක් පිහිටුවන්නේ මුදල් ඇමතිවරයා කුමන බලයකින්ද යන්න වහාම ජනතාවට හෙළි කළ යුතු බවත් එම විශේෂ ඒකකය සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට වගකීමක් හෝ පාලනයක් නැති කණ්ඩායමක් සේ පවත්වාගෙන යාමට ඇති විශේෂ හේතුවද හෙලිකළ යුතු බවත්, සමස්ත ලංකා සුරාබදු සේවකයින්ගේ 09 වන නියෝජිත සම්මේලනයේ දී කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයා ප්‍රශ්න කර සිටියේය. එමෙන්ම මෙවැනි තත්වයක් යටතේ සුරාබදු දෙපාර්තමේන්තු සේවකයින් අලසව සිටීමට හේතුව කුමක්ද යන්නත් සොයා බැලිය යුතු බවත් ලාල්කාන්ත සහෝදරයා වැඩිදුරටත් ප්‍රකාශ කර සිටියේය.

'වැඩකරන ජනතා බලයක් ගොඩනැගීම, සුරාබදු




දෙපාර්තමේන්තුව රැකගැනීමට හා සුරාබදු සේවක අයිතීන් දිනාගැනීමට සේවකයින් පෙළගස්වමු' යන තේමාව යටතේ සමස්ත ලංකා සුරාබදු සේවා සංගමයේ 09වැනි වාර්ෂික සමුළුව, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති, කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පසුගිය 30වැනි දින පෙරවරුවේ ජාතික පුස්තකාල ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී.

# ලංකා ගුරුසේවා සංගමයේ ජාතික සමුළුව අභිමානවත් අයුරින්




'එකම හඬක් - එකම තැනක්' තේමාව කොටගත් ලංකා ගුරුසේවා සංගමයේ ජාතික සමුළුව පසුගිය 21වැනි දින මහරගම යොවුන් රඟහලේ දී විශාල ගුරුවරුන් පිරිසකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි. ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති සමුළුව සඳහා ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා සහ ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානය වෙනුවෙන් කේ.ඩී. ලාල්කාන්ත සහෝදරයාද සහභාගි විය.

මෙවර සමුළුවේ දී නව විධායක සභාවක් පත්කරගන්නා ලද අතර එමගින් ඉදිරියේ දී නව නිලධාරී මණ්ඩලය තෝරාගනු ඇත.

# අපරාධ පිළිබඳ පරීක්ෂණ හා නෛතික කටයුතු දුර්වල කරන ප්‍රකාශ එපා!

**ජනතා විමුක්ති පෙරමුණ**

පසුගිය කාලයේ මහජන මුදල් වංචා කළ, මූල්‍ය අපරාධ හා වෙනත් අපරාධවලට සම්බන්ධ අය පිළිබඳව කරන පරීක්ෂණ හා නෛතික කටයුතු දුර්වල කිරීමට කටයුතු නොකරන ලෙසත් මූල්‍ය වංචා හා අපරාධවලට සම්බන්ධ සියලු දෙනා පිළිබඳවද පරීක්ෂණ කඩිනම් කරන ලෙසත් ආණ්ඩුවට බලකරමින් පසුගිය 13වැනිදා ජ.වි.පෙ. දේශපාලන මණ්ඩලය නිවේදනයක් නිකුත් කළේය. එහි මෙසේ සඳහන්ය.

ඊයේ (ඔක්.12) පදනම් ආයතනයේ පැවැති උත්සවයකදී වත්මන් ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කරන ලද ප්‍රකාශයක් අද (13) සියලුම පුවත්පත් ප්‍රධාන ශීර්ෂපාඨය සහිතව වාර්තා කර තිබේ. සී.අයි.ඩී.ය, එෆ්.සී.අයි.ඩී. ය හා අල්ලස් කොමිසම දේශපාලන න්‍යායපත්‍රවලට අනුව කටයුතු කරන බවට සැක පළකරමින් කර තිබෙන එම ප්‍රකාශය ඉතා බරපතළ එකක් ලෙස අපි දකිමු. පසුගිය රාජපක්ෂ පාලන සමයේ සිදු වූ වංචා, දූෂණ හා අපරාධවලට එරෙහිව යහපාලනය හා ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් 2015 ජනවාරි 08 ජනාධිපතිවරණයේදී මෛත්‍රීපාල සිරිසේන මහතාට ඡන්දය දුන් ලක්ෂ 62ක ජනතාවගේ අභිලාශයට හා ජනවරමට ජනාධිපතිවරයා තම කතාවේදී අභියෝග කර තිබෙන බව පෙනේ.

පසුගිය කාලය තුළ සිදු වූ වංචා, දූෂණ හා අපරාධ පිළිබඳව පරීක්ෂණ පවත්වන ආයතන විසින් කරන කටයුතු වැරදියට අර්ථකථනය කරමින් ආණ්ඩුවට එරෙහිව ආරක්ෂක අංශ තුළ යම් මතයක් හැදීමට පරාජයට පත් රාජපක්ෂ කණ්ඩායම උත්සාහ දරන්නේ නම් කළ යුත්තේ, එම උත්සාහයන් පැරදවීම මිස පරීක්ෂණ පවත්වන ආයතන දුර්වල වන ලෙස හා අධෛර්යයට පත්වන ලෙස කටයුතු කිරීම නොවේ.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් මූල්‍ය අපරාධ කොට්ඨාසයත් අල්ලස හෝ දූෂණ කොමිසමත් දේශපාලන න්‍යායපත්‍රයකට අනුව කටයුතු කරන්නේ දැයි ප්‍රශ්න කරන ජනාධිපතිවරයාගේ ප්‍රකාශය සරල නැත. එය එසේ වන්නේ ඔහු වත්මන් ආණ්ඩුවේ නායකයාත්, රාජ්‍ය නායකයාත් වන නිසාය. ඉහත ආයතන හසුරුවන්නේ කාගේ හෝ දේශපාලන න්‍යාය පත්‍රයකට නම් ඒ කාගේදැයි ජනාධිපතිවරයා රටට පැහැදිලි කළ යුතුය. දැනටත් වත්මන් ආණ්ඩුවට සම්බන්ධව සිටින බරපතළ චෝදනා ඇති ඇමතිවරු කිහිප දෙනෙක් පිළිබඳවම විවිධ දූෂණ චෝදනා ඇතත් ඒ ගැන පරීක්ෂණ නොපවත්වන බව රටම දනී. ඒවා සිදු වන්නේද දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව දැයි පැහැදිලි විය යුතුය.

මෙහිදී ස්වාධීන කොමිෂන් සභා පිළිබඳවද ජනාධිපතිතුමා සදහන් කර තිබේ. ස්වාධීන කොමිෂන් සභා පත්කරනු ලැබුවේ 19 වන සංශෝධනයට අනුව වත්මන් ආණ්ඩුවේද මැදිහත් වීම සහිතවය. එය ජනතාවගේත් සිවිල් සමාජ කණ්ඩායම්වලත් ඉල්ලීමක් වූ අතර ආණ්ඩුව ජනතාවට දුන් ප්‍රධාන පොරොන්දුවක්ද විය. තනි පුද්ගලයෙක් විසින් ඉහත ආයතන මෙහෙයවනවා වෙනුවට සමහර අඩුපාඩු සහිතව වුවත් කොමිෂන් සභාවක් විසින් මෙහෙයවීම ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් ගත් කල හොඳ දෙයකි. ඒ නිසා ස්වාධීන කොමිෂන් සභාවලට සම්බන්ධ අය රාජ්‍ය පාලනය නොදන්නා අය ලෙස පවසා එම ආයතන හැල්ලු කිරීම කිසිසේත්ම අනුමත කළ නොහැක.

සැබෑ ලෙසම වංචාව දූෂණය හා අපරාධ පිළිබඳව කරන පරීක්ෂණ දුර්වල කිරීමට හේතු වන සේ ඊට අදාළ ආයතන දුර්වල කිරීමට හේතු වන ප්‍රකාශ හෝ ක්‍රියාමාර්ග ජනවරමේ අර්ථයට පිටු පෑමකි. එසේම එය පසුගිය පාලන කාලය තුළ මහා පරිමාණ මූල්‍ය වංචා හා අපරාධවලට සම්බන්ධ වූ බවට චෝදනා ලැබූවන් සතුටට පත් කිරීමක් හා පරීක්ෂණ පවත්වන ආයතනවලට එරෙහිව ඔවුන් නගන බොරු චෝදනාවලට දිරි දීමකි. පරීක්ෂණ පවත්වන ආයතන අක්‍රීය කිරීමකි. දැන් වර්තමාන ආණ්ඩුවේ සමහර අයටද අල්ලස් හෝ දූෂණ චෝදනා, බලය අනිසි ලෙස යෙදවීමේ චෝදනා, එල්ල වීමට පටන් ගෙන තිබේ. ඒවා පිළිබඳව පරීක්ෂණ පවත්වන ආයතන මෙලෙස බිය වද්දා දුර්වල කිරීම දැනටමත් වංචා දූෂණවල නියැලෙන හා ඉදිරියේ එසේ කිරීමට සැරසී සිටින අයට එවැනි අපරාධ කිරීම සඳහා ඉඩ දීමක්ද වේ.

එබැවින් පසුගිය කාලයේ මහජන මුදල් වංචා කළ, මූල්‍ය අපරාධ හා වෙනත් අපරාධවලට සම්බන්ධ අය පිළිබඳව කරන පරීක්ෂණ හා නෛතික කටයුතු දුර්වල කිරීමට කටයුතු නොකරන ලෙසත් තවමත් පරීක්ෂණ පටන් ගෙන නැති එහෙත් මූල්‍ය වංචා හා අපරාධවලට සම්බන්ධ සියලු දෙනා පිළිබඳවද පරීක්ෂණ කඩිනම් කරන ලෙසත්, ජනවරමට ගරු කරන ලෙසත් අපි ආණ්ඩුවට බලකර සිටිමු.

## කොප් සටනින්...

01 පිටුවෙන්

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතුවේදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ සොයා බැලීම සඳහා පාර්ලිමේන්තු පොදු ව්‍යාපාර කාරක සභාව (කෝප්) විසින් සිදු කරන ලද විමර්ශනයේ අවසන් වාර්තාව වෙනස් කරලීම සඳහා එ.ජා.ප.ය අවසන් මොහොත දක්වා දරන ලද උත්සාහය පරාජයට පත්වීම ආණ්ඩුව ලැබූ බරපතළ පරාජයක් බව දේශපාලන විචාරකයින්ගේ අදහස වී තිබේ.

2015 හා 2016 වර්ෂවල නිකුත් කරන ලද බැඳුම්කර ගනුදෙනු නිකුතු දෙකකදී රජයට පාඩු වන පරිදි හා එවකට මහ බැංකු අධිපතිවරයාගේ බෑණනුවන්ගේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට වාසි සැලසෙන පරිදි කටයුතු සිදුවී ඇති බවට ජ.වි.පෙ. ඇතුළු පක්ෂ හා සංවිධාන විසින් චෝදනා නගා තිබිණි. ඇතිවූ මතභේදාත්මක තත්වය හමුවේ හවුල් ආණ්ඩුව මේ පිළිබඳව පරීක්ෂණ සිදුකිරීම සඳහා නීතිමය අංශවලට භාරදෙනු වෙනුවට කෝප් කමිටුව විසින් ඒ ගැන පරීක්ෂණ සිදුකරමින් සිටිනේයැයි ඇඟ බේරාගැනීමට උත්සාහ කළේය. අග්‍රාමාත්‍යවරයා යටතේ තිබූ මහ බැංකුව පාර්ශවයෙන්ද ඒ අක්‍රමිකතාව පිළිබඳව පරීක්ෂණ සිදු නොවූ අතර කෝප් කමිටුවටම එහි වගකීම බැර කර තිබිණි.

කෙසේ වුවද කෝප් කමිටුව විසින් පරීක්ෂණ සිදුකිරීමේදී මහ බැංකුව අදාළ සහයෝගයන් නිසි ලෙස ලබා නොදුන් බවට චෝදනාද එල්ල වී තිබුණේ ආණ්ඩුව හිටපු මහ බැංකු සභාපති අර්ජුන් මහේන්ද්‍රන් අග්‍රාමාත්‍යවරයාගේ ආර්ථික උපදේශවරයෙකු බවට පත්කර ගෙන ඇති බවට පුවත් පළ වෙද්දීය. ආණ්ඩුව කෝප් කමිටුවේ එ.ජා.ප. මන්ත්‍රීවරුන් පාවිච්චි කරමින් වෙනම අවසන් වාර්තාවක් ඉදිරිපත් කිරීම මගින් මහ බැංකු අධිපතිවරයා බැඳුම්කර චෝදනාවෙන් නිදහස් කරලීමට උත්සාහ ගනු ලැබුවේද එහිම පියවරක් ලෙසය. කෙසේ වුවද කෝප් කමිටු සභාපති ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රී සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාගේ මැදිහත්වීම හේතුවෙන් එම කුමන්ත්‍රණය රටට හෙළිදරව් වීමත් සමග ඇති වූ බලපෑම් හමුවේ වෙනම වාර්තාවක් ඉදිරිපත් කිරීමේ අදහස හකුළා ගැනීමට ආණ්ඩුවට සිදුවිය.

මේ පිළිබඳව පසුගිය 28වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදී කරුණු දැක්වූ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා ප්‍රකාශ කළේ, රාජපක්ෂ පාලනය කාලයේදී ඉදිරිපත් වූ කෝප් වාර්තා 30ක් පමණ කුණු බක්කියට ගොස් තිබෙන බැවින් වංචා-දූෂණවලට එරෙහිව වේදිකාවේ කරන කතාවලට සීමා නොවී ආණ්ඩුව විසින් ක්‍රියාමාර්ග ගත යුතු බවය. එසේම දූෂිතයින්ට දඬුවම් ලබාදෙන තෙක් සහ රටට අහිමි වූ ධනය පවරා ගන්නා තෙක් සටන ඉදිරියට ගෙනයාමට ජ.වි.පෙ. සූදානම් බවද ඔහු මෙහිදී අවධාරණය කළේය.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

## අලුත් ආණ්ඩුව හා පැරණි මාවත

පොදු ජනතාව හිතන ආකාරයට අනුවත් ආණ්ඩුව ප්‍රකාශ කරන ආකාරයට අනුවත් මෙම ආණ්ඩුව අලුත් ආණ්ඩුවකි. 2015 පැවති මහ මැතිවරණයෙන් බලයට පත්වීමේ අර්ථයෙන් ගත් කල මෙය අලුත් ආණ්ඩුවක් වන බව සැබෑය. එහෙත් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග අනුව බලන විට මෙය පැරණි මාවතේම යන පැරණි ක්‍රියාමාර්ගම අනුගමනය කරන පරණ ආණ්ඩුවකි. ඊළඟ අයවැය සඳහා වූ විසර්ජන කෙටුම්පතට අනුව බැලුවත් කෝප් කාරකසභාවේ කලබැගෑනියට අනුව බැලුවත් මේ පැරණිකම දැකිය හැකිය.

කණ කොකාගේ සුද පෙනෙන්නේ ඉගිලෙන විටදී යයි ගම්වල කියමනක් තිබේ. මේ ආණ්ඩුව සම්බන්ධයෙන්ද එය සත්‍ය වේ. ආණ්ඩුව කුමන වර්ගයේද යන්න තේරුම් ගත හැක්කේ, ආණ්ඩුවේ නායකයින් කියන කථාවලින් හෝ පොරොන්දුවලින් නොව, ක්‍රියාමාර්ගවලිනි. බලය ගැනීමට පෙර ආණ්ඩුවේ නායකයෝ ජනතාවට පොරොන්දු වූයේ, අලුත් වෙනසක් කරන බවය. ආර්ථික කළමනාකරණයේ තමන් දක්ෂයින් බවද ආර්ථිකය නංවා ජනතාවට සහන දෙන බවද ඔවුහු කීහ; හොරකම් නැවැත්වීම ගැන, හොරු ඇල්ලීම ගැන ඇඟ කිළිපොලා යන කථා කීහ. එහෙත් ක්‍රියාවේදී තමන් පැරණි පාලකයිනට වඩා කිසිදු වෙනසක් නැති බව දැන් ඔවුහු ඔප්පුකරමින් සිටිති.

2017 සඳහා වූ අයවැයට පෙර ඉදිරිපත් කරනු ලබන විසර්ජන කෙටුම්පත පසුගිය ඔක්තෝබර් 20දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීය. ඉන් පෙන්වා තිබෙන්නේද ආණ්ඩුව පැරණි මාවතේම ගමන් කරන බවය. පසුගිය හැම ආණ්ඩුවකදීම මෙන් මෙහිදීද ආණ්ඩුවේ පිළිවෙත වී ඇත්තේ, ජනතාවගෙන් උදුරා ගැනීමත් පාලකයින්ට ඇති තරම් බෙදා ගැනීමත්ය. 2017 වසර සඳහා මුදල් වෙන් කිරීමේදී පොදු ජනතාවට කෙලින්ම බලපාන අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා මුදල් වෙන් කර ඇත්තේ, පසුගිය වසරට වඩා බොහෝ අඩුවෙනි. එලෙස ජනතාවගේ සේවා සඳහා වන වියදම් විශාල ලෙස අඩු කරද්දී ජනාධිපතිගේ හා අගමැතිගේ වියදම් සඳහා පසුගිය වසරට වඩා විශාල මුදලක් වෙන්කරගෙන තිබේ. 2016 වසර සඳහා ජනාධිපතිවරයාට වෙන් කර තිබුනේ රුපියල් කෝටි 240කි. එහෙත් 2017වසර සඳහා එම මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 645 දක්වා වැඩිකර ගෙන තිබේ. වැඩිවීම පමණක් කෝටි 405කි. එසේම 2016 වසර සඳහා අගමැතිවරයාට වෙන් කර තිබුනේ රුපියල් කෝටි 48කි. එහෙත් 2017වසර සඳහා එම මුදල් ප්‍රමාණය රුපියල් කෝටි 125 දක්වා වැඩිකර ගෙන තිබේ. හැන්ද අතේ තිබෙන අය තම තමන්ට බෙදා ගෙන තිබෙන්නේ එසේය.

ආර්ථිකය අර්බුදයක තිබෙන බවත් ණය ප්‍රමාණය වැඩිවී තිබෙන බවත් පැවසූ ආණ්ඩුව ආදායම් වැඩිකර ගැනීම සඳහා අනුගමනය කළේ, ජනතාව මත අධික බදු බරක් පැටවීමය. වැට් බද්ද 15% දක්වා වැඩිකළේ ඒ සඳහාය. එලෙස ජනතාව මත අසාධාරණ අධික බදු පනවා උපයා ගන්නා මුදල් ආණ්ඩුව යොදවා තිබෙන්නේ, ජනතාවගේ සේවාවන් වන අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍ර සඳහා නොව ජනාධිපතිගේ හා අගමැතිගේ වියදම් සඳහාය. මෙය කිසිසේත් සාධාරණ නොවේ.

අර්බුදයට ලක්වූ ආර්ථිකයේ බර ජනතාව මත පටවන, බදු ගෙවන ලෙස ජනතාවට බලකරන, බදු නොගෙවන අයට නඩු දමන බවට තර්ජනය කරන ආණ්ඩුව අනෙක් අතට කරන්නේ කුමක්ද? මහජන මුදල් කෝටි ගණනින් වංචා කළ හොරුන් රැකීමට එකිනෙකා හා තරඟ වැදීමය. මහ බැංකු බැඳුම්කර වංචාවෙන් අර්ජුන මහේන්ද්‍රන් බේරා ගැනීම සඳහා කෝප් කමිටුව අර්බුදයට පත්කර කමිටු වාර්තා වෙනස්කිරීමට එ.ජා.ප. මන්ත්‍රීන් ගත් උත්සාහය ඊට කදිම නිදසුනකි. ආණ්ඩුවේ ගජ මිතුරන්ට හොරකම් කිරීම සඳහාත් පාලකයින්ට නාස්තිකාරී ලෙස වියදම් කරමින් සැප විඳීම සඳහාත් අවශ්‍ය වත්කම් උපයා දීමේ බර දැරිය යුත්තේ ජනතාවය. බදු බර දරන්නේ ජනතාවය. කප්පාදුවට ලක් වන්නේ, ජනතාවගේ සේවාවන්ය. වසර 68ක් තිස්සේ සිදුවූයේ මෙයමය. මින් තහවුරු වන්නේ කුමක්ද? ඒ, අන් කිසිවක් නොව අලුත් ආණ්ඩුවද පරණ පාරේම යන බවය.

මේ තත්වය තුළ ජනතාවගේ වගකීම වන්නේ කුමක්ද? ඒ පැරණි ආණ්ඩුව වෙනුවට අලුත් ආණ්ඩුවක් තැනීම හෝ පැරණි මුහුණු වෙනුවට අලුත් මුහුණු සෙවීම නොවේ. පැරණි මාවත වෙනුවට අලුත් මාවතක ගමන් ඇරඹීමට සූදානම් වීමය. රට අලුත් මාවතක ගෙන යාමට සමත් නව ජනතාවාදී පාලනයක් වෙනුවෙන් පෙළගැසීමය. ඉතිහාසය උගන්වන පාඩම එයයි.

# ඉතිහාසය ඉල් මහ විරුවන්ට සාධාරණය ඉටුකරන දිනයක් ඒවි



**ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජික ජිනදාස කිතුලගොඩ සහෝදරයා**

***නියමුවා:-*** *අපි ඉල් මහ විරුවන්ගෙන් මේ සංවාදය ආරම්භ කරමු. ඉල් මහ විරුවන් කෙතරම් සමාජයට ආදරය කළ සැබෑ මිනිසුන් වුවත් තමන්ගේ ජීවිත පරිත්‍යාගයෙන් ඔවුන් සිදු කළ අරගලය තවමත් අධිපති සමාජ කතිකාවත තුළ චිත්‍රණය කෙරෙනුයේ බියජනක, අන්ධකාර නොපැහැදිලි එකක් ලෙසින්. ඒ ඇයි?*

***කිතුලගොඩ සහෝදරයා:-*** ඉල්මහ විරුවන් සම්බන්ධයෙන් සාකච්ඡා කරන විට, අපට දකින්න පුළුවන්, ශ්‍රේෂ්ඨ අරමුණු ගණනාවක් වෙනුවෙනුයි ඔවුන් තමන්ගේ ජීවිත පරිත්‍යාග කළේ. ඔවුන්ට පෙන්නන්නම බැරි දේ තමයි, සමාජ අසාධාරණය. මච්බිමේ සහ පීඩිත ජනතාවගේ නිදහස සියල්ලටම වඩා ඔවුන් විසින් අගය කරනු ලැබුවා. ජනතාව මුළාවට පත්කරන අවස්ථාවාදී දේශපාලනය පිටු දකින්නට ඔවුන්ට දැවැන්ත වුවමනාවක් තිබුණා. රජීව් ගාන්ධි ප්‍රමුඛ ඉන්දියානු ආක්‍රමණිකයින්ටත්, ජේ.ආර්. ජයවර්ධන නමැති නූතන දොන් ජුවන් ධර්මපාලටත් එරෙහිව ඉල්මහ විරුවන්ගේ ලේ කකියන්නට පටන් ගත්තා. ඒ සියල්ල වගේම පීඩිත පංති ව්‍යාපාරය දඩයම් කරන තිරශ්චීන මර්දනය විසින් ඔවුන් සටන් මඟට ඇද දැම්මා. ඉල්මහ විරුවන් ජීවිත පරිත්‍යාග යෙන් සටන් මඟ තෝරා ගන්නා තැනට පත්කළේ මේ සියලු තත්වයන් විසිනුයි. එහෙත් ඔවුන් එකී උතුම් අරමුණු වෙනුවෙන් සටන් කළත් එම අරගලය පරාජයට පත් වුණා.

ඕනෑම අරගලයකින් පසු අරගලයේ කතන්දරය ලියන්නේ ජයග්‍රාහී පාර්ශ්වයයි. ජයග්‍රාහකයා කිසි විටෙක තම ප්‍රතිවාදියාගේ වටිනාකම් ඉස්මතු කරන්නේ නැහැ. ඉස්මතු වෙන්න ඉඩ දෙන්නෙත් නැහැ. ඒ කතන්දරය ඔවුන් ලියන්නේ, තමන්ගේ නිරවද්‍යතාව, තමන්ගේ පිලේ වීරත්වය, තමන්ගේ සර්ව සාධාරණත්වය හුවා දැක්වීමටයි.

කියන්නේ සහ ලියන්නේ පට්ටපල් බොරු වෙන්නත් පුළුවන්. එහෙත් ඒවා ලියන්නේ අරගලයෙන් ජය ලැබූවන් වන නිසා, ඒ ලියූ දේ සත්‍ය තත්වය මුළුමනින්ම විකෘති කිරීමක් බව රටට කියන්නට පරාජිත පාර්ශ්වයේ කෙනෙක් ඉතිරි නොවී සිටින්නත් පුළුවන්. අහම්බෙන් ඉතිරි වූ කෙනෙක් සිටියත් අර මතය පරාජය කිරීමට තරම් ඔවුන්ගේ හඬ ප්‍රමාණවත් නොවෙන්නත් පුළුවන්. ඉතිං කොහොමද ඇත්ත දේ සමාජගත වෙන්නේ? ස්වාධීන ජනමාධ්‍ය හෝ රටේ සාහිත්‍ය කලාව සත්‍ය දේ ගැන සමාජයේ සංවාදයක් ගොඩනගනවා නම් අසත්‍යය හැමදාම සමාජගත කරන්නට නොහැකි වෙනවා. ඉල්මහ විරුවන් සම්බන්ධයෙන් වුණත් යථාර්ථය මතු නොවීමට ප්‍රධාන හේතුව ඒකයි. අධිපති මාධ්‍යයන්හි ලියූ ඉතිහාසය තුළ ඉස්මතුකර පෙන්නුවේ, අයුක්තියට, අසාධාරණයට එරෙහිව මව්බිමේ සහ ජනතාවගේ විමුක්තිය පතා ජීවිත පරිත්‍යාග කළ පිරිසක් හැටියට නොවෙයි; මව්බිමට එරෙහිවූ සහ ජනතා පරමාධිපත්‍යයෙන් පත්වූ ආණ්ඩුවක් පෙරළීමට උත්සාහ කළ පිරිසක් හැටියටයි. ඒ නිසාම ඔවුන් පිළිබඳ මතකය බියජනක, අන්ධකාර, නොපැහැදිලි චිත්‍රයක් ලෙසයි ජනතාවට චිත්‍රණය වන්නේ.

88/89 අරගලය සම්බන්ධයෙන්

> "කවුරු මොනව කිව්වත් එකක් පැහැදිලියි. අවස්ථා දෙකක් අති බිහිසුණු භීෂණ දෙකක් මඟින් මහපොළොවට සමතලා කළ පක්ෂයක් නැවත වතාවක් හිස ඔසවා අළු දූවිලි ගසා දමා, ජනතා විශ්වාසය තහවුරු කරමින් ධනපති පාලක පංතියට තියුණු අභියෝගයක් එල්ලකරමින් පෙරට ඇදෙමින් තිබෙනවා."

පමණක් නෙවෙයි, ලෝකයේ ඕනෑම අරගලයකින් පසුව ඇතිවන තත්වය ඒකයි. රුසියාවෙ ඔක්තෝබර් විප්ලවයෙන් පරාජයට පත්වුණේ සාර් පෙළපත සහ කෙරෙන්ස්කිගේ ධනපති ආණ්ඩුව වන නිසා අරගලයේ ඇත්ත තත්වය ලෝක ජනතාවට දැනගතහැකි වුණා. බැරිවෙලා හරි සාර් අධිරාජ්‍යයා හෝ ධනේශ්වර පාලනය ජයග්‍රහණය කළා නම්, ඔක්තෝබර් විප්ලවය පිළිබඳ ඉතිහාසය ලියන්නේ ඔවුන්. එසේ වුණා නම් ලෙනින් ජනතා ද්‍රෝහියෙකු ලෙසත් රුසියන් ජනතාව අමන අරගලයක නිරතවූ පිරිසක් ලෙසත් ලියවෙන්න ඉඩ තිබුණා. ලෝකයේ ඕනෑම අරගලයක ස්වභාවය ඒකයි.

අසත්‍ය ඉතිහාසය කණපිට හැරී ලියවෙන්නේ ඉල්මහ විරුවන් ජයග්‍රහණය අත්පත් කරගත්තා නම් පමණයි. අන්න එතකොටයි, ඉල්මහ විරුවන්ගේ සාධාරණත්වය, දේශප්‍රේමීත්වය, කැපකිරීම, ජනතාවට දැක් වූ අසීමිත ආදරය, අනුපමේය වීරත්වය මතුවන සේ ඉතිහාසය ලියවෙන්නේ. ඒත් එහෙම වුණේ නැහැ. නමුත් ඉතිහාසය ඉල් මහ විරුවන්ට සාධාරණය ඉටුකරන දිනයක් ඒවි.

***නියමුවා:-*** ***විවිධ හේතු මත අරගලයෙන් පළා ගියවුන් ජනමාධ්‍ය තුළ අරගලය හෙළා දැකීමටත් එහි තමන්ගේ භූමිකාව හුවා දැක්වීමටත් උත්සාහ කරනු අපට පෙනෙන්නට තිබෙනවා. ඔවුන්ගේ දෙබිඩි භූමිකාව ජනතාව තේරුම් කරගත යුත්තේ කොහොමද?***

***කිතුලගොඩ සහෝදරයා:-*** 88/89 කාලයේ පැන නැගුණු ජනතා අරගලය ගැන පමණක් නෙවෙයි, 1971 අරගලය සම්බන්ධයෙනුත් විවිධ අය විවිධ කතා කියමින් ඉන්නවා. ඇතැම් අය අරගලය නිවැරදියි නායකත්වය වැරදියි කියා කියනවා. තවත් සමහරු අරගලයත් වැරදියි, නායකත්වයත් වැරදියි කියා කියනවා. සමහර කුහක සරුව පිත්තල විප්ලවවාදීන් කියනවා, ධනපති ආණ්ඩුවට එරෙහිව අරගල කරන එක හොඳයි. ඒත් ජ.වි.පෙ. නායකත්වයෙන් කෙරෙන අරගලය වැරදියි කියලා. මේ කවුරු මොනව කිව්වත් එකක් පැහැදිලියි. අවස්ථා දෙකක් අති බිහිසුණු භීෂණ දෙකක් මඟින් මහපොළොවට සමතලා කළ පක්ෂයක් නැවත වතාවක් හිස ඔසවා අළු දූවිලි ගසා දමා, ජනතා විශ්වාසය තහවුරු කරමින් ධනපති පාලක පංතියට තියුණු අභියෝගයක් එල්ලකරමින්

15 වැනි පිටුවට





YES WE CAN

# තාරුණ්‍යය දත්ත කැවූ රොබෝ යන්ත්‍රයක් නොවීමට

පසුගිය කාලය පුරාම අසන්නට දකින්නට ලැබුණේ තාරුණ්‍යය බොඳකර හැරීමේ සිද්ධීන්ය. එම සිදුවීම් අහන දකින ඕනෑම අයකුට තරුණ්‍යය පිළිබඳව ඇතිවන්නේ අප්‍රසන්න හැඟීමකි. ඒ නිසා තාරුණ්‍යය ගැන වර්තමාන කියවීම ඛේදජනක යැයි කීවොත් එය නිවැරදිය. ඔවුන් තර්කානුකූලභාවයෙන් ඔබ්බට ගිය මානව දයාවෙන් තොර ආත්ම ධෛර්යය හීන වූ, සදාචාරයෙන් පීලි පනින ලද, "දත්ත කවන ලද හිතක් පපුවක් නැති රොබෝ කෙනෙකු" ලෙස අර්ථ ගැන්වී හමාරය.

නමුත් තාරුණ්‍යය එබඳුද? කිසි ලෙසකින්වත් නැත. තාරුණ්‍යය ඕනෑම අභියෝගයක් අභියෝගයක් ලෙස ගත හැකි ආත්ම ධෛර්යයෙන් යුතු වූ පිරිසකි. පෞද්ගලික බැඳීමෙන් ඔබ්බට ගිය අනෙකා වෙත විවර වූ හදවතක් ඇත්තෙකි. අව්‍යාජත්වය තම ආත්මය කොටගෙන ජීවත් වන්නෙකි. හැමවිටම අලුත් ලෝකය ගැන වෙනස් ලෙසකට විග්‍රහ කරන්නෙකි. හැමවිටම හැම මොහොතකම තර්කානුකූලත්වය හා විප්ලවීය ජීව ගුණය ආත්මය කොට වසන්නෙකි.

එබඳු තරුණයෙක් කාගේ නම් ඉලක්කයක් විය හැකිද? කාට නම් අභියෝගයක් විය යුතු ද? සැබවින්ම අසාධාරණ අයුක්ති සහගත ලෙස තම වුවමනාව වෙනුවෙන් සියල්ල හසුරුවනු ලබන ධනපති පංතියේ හා පාලකයන්ගේ නොමඳ දෝෂ දර්ශනයට ලක් විය යුතුය. එසේ නම් ඔවුන්ගේ මූලික ව්‍යාපෘතිය වී ඇත්තේ කශේරුකාව බිඳ දමන ලද අයාලේ ගිය තරුණ ප්‍රජාවක් බිහි කිරීමයි. තමන්ට තම පංතියට, තම පාලනයට එරෙහි නොවන එදිරිවාදිකම් නොකරණ තරුණ ප්‍රජාවක් ඇති කිරීමයි. ඔවුන්ගේ මනදොළ පිරෙන්නේ එවිටය. ඒ සඳහා ඔවුහු විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කරති. තාරුණ්‍යයට ආත්මාර්ථයේ සිහින මවා පාති. "තම හිසට තම අතමය සෙවණැල්ල" ආදී ප්‍රතිගාමී මතවාද ගොඩනගන සාමූහිකත්වයෙන් මානව දයාවෙන් ඉවතට ඇද දැමීමට වෙර දරති. ඊට හසු නොවූවන් ජීවිතය "ආතල්" එකේ ගත කිරීමට මත් ද්‍රව්‍ය හා සුරාවට සූදුවට යොමු කරති. තව පිරිසක් කුලී මිනීමරුවන් ලෙස, ස්ත්‍රී දූෂකයන් ලෙස, මංකොල්ලකරුවන් ලෙස සමාජගත කිරීමට වෙර දරති. නැතිනම් සිහින කුමර කුමරියන් ලෙස කිරුළු පළන්දවා නවීන තාක්ෂණයේ මෙවලම් ස්වල්පයක අයිතිකරුවන් ලෙස සමාජයේ අතරමං කරති. අධ්‍යාපනයෙන් පටමං කිරීම ඊට අදාළ උපාය මාර්ගය ලෙස යොදා ගැනේ.

ධනපති පංතිය පංතියක් ලෙස තාරුණ්‍යයේ කශේරුකාව බිඳ දැමීමට කොතරම් උත්සාහයක නිරත වුවත් එය අසාර්ථක වී තිබේ. මේ සමාජ ක්‍රමය වෙනස් කළ යුතුය, වෙනස් කළ හැකිය යන අධිෂ්ඨානයෙන් යුතු තරුණ ප්‍රජාවක් සිටීම ප්‍රාතිහාර්යයට කාරණයකි. ඔවුහු ධනපති පංතියේ පවුරු බිඳ දමා මානව දයාවේ යුක්තියේ, සාධාරණත්වයේ පවුරු ගොඩනගමින් සිටිති. බිඳ වැටෙන ධනවාදයේ ගොදුරක් වී විනාශයේ මාවත තෝරා ගන්නවා වෙනුවට මනුෂ්‍යත්වයේ මාවත තෝරාගත් ශක්තිමත් දිරිය තරුණ

ප්‍රජාවකගේ අවශ්‍යතාවය දැඩිව දැනෙමින් තිබේ. නමුත් තාරුණ්‍යයට ධෛර්යය සපයනවා වෙනුවට තාරුණ්‍ය අධෛර්ය කරන සිදුවීම් දිනෙන් දින ඉහළ යමින් තිබේ. මෙයින් ධනපති පංතියේ උවමනාවන් හා උපාය මාර්ගයන්ගේ සැලසුම් සහගත බව මනාව තේරුම් ගත යුතුය. එලෙසින් එය විග්‍රහ කරගත හැකි ධෛර්යය සම්පන්න, තාර්කික, සටන්කාමී තරුණ ප්‍රජාවක් අවශ්‍යය. හෙට පැහැබර වනුයේ තරුණයන් තම තමන්ගේ නිහඬතාවයන් බිඳ දමා එකා මෙන් එකම පුළුල් අරමුණක් වෙනුවෙන් පෙළගැසීමෙනි. එවිට ඔවුන්ගේ භාවිතයන් විසින් සාධාරණ සමාජයකුත් නිවහල් මිනිසෙකුත් යුක්තිගරුක සමාජයකුත් බිහිවනවා නොඅනුමානය.

# චේ දිනය රට පුරා

තරුණ

ජාතිවාදයෙන් මෝහනය වනවා වෙනුවට ජාත්‍යන්තරවාදය ශ්‍රේෂ්ඨ බවත්, පුද්ගලිකත්වය වෙනුවට සාමූහික බව ජයග්‍රහණ රැගෙන එන බවත්, කීර්තිය උදෙසා නොව ලෝකයේ යහපත උදෙසා පමණක්ම සටන් කළ යුතු බවත්, අධෛර්යයට පත්වී සැඟවෙනවාට වඩා එඩිතරව මුහුණ දීමෙන් ජයග්‍රහණය ලැබිය හැකි බවත්, ජීවිතයට සතුටත්, මරණයට අර්ථයත් රැගෙන ආ හැකි එකම මාවත එය බවත් ලෝකයට පසක් කළ සදාකාලික තාරුණ්‍යයේ සංකේතය ආදරණීය චේ ගෙවාරා සහෝදරයායි. ඔහු තම අවුරුදු 39ක් තරම් වූ කෙටි ජීවිත කාලයට සමුදෙමින් කප්පරක් වූ සිය ජීවිතාදර්ශයන් පිරි අවසන් සුසුම් පොද වා තලයට මුදා හැර දැන් වසර 49ක් ඉක්ම ගොසිනි. එබැවින් එකී ජීවිතාදර්ශයන්ගෙන් පණ පෙවුණු සමාජවාදී තරුණ සංගමය පසුගිය ඔක්තෝම්බර් 08 වන දා පටන් දිවයිනේ විවිධ ප්‍රදේශවලදී චේ දිනයන් සංවිධානය කරන ලදී.

එහි ප්‍රධාන උත්සවය පැවැත්වුණේ පසුගිය ඔක්තෝම්බර් 08 වන දින හොරණ, මොරගහහේන, යහලකැලේවත්ත චේ උද්‍යානයේ දී වන අතර එය ශ්‍රී ලංකාවේ හිටපු කියුබානු තානාපති ෆ්ලොරන්ටිනෝ බැටිස්ටා සහෝදරයා, ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා, ශ්‍රී ලංකා කියුබානු මිත්‍රත්ව සංගමයේ ප්‍රධාන ලේකම් සුබ්‍රමනියම් නාගේන්ද්‍ර මහතා සහ කියුබාවේ අධ්‍යාපනය ලද ඉංජිනේරු අසේල ලක්මාල් පල්ලේවෙල මහතාද සමඟින් සමාජවාදී තරුණ සංගමයේ බොහෝ තරුණ තරුණියන්ගේ ද සහභාගිත්වයෙන් යුතුව පැවැත්වුණි. එම අවස්ථාවේ සහ දිවයින පුරා පැවැත්වුණු අනෙකුත් චේ දින උත්සව අවස්ථාවන්හි දී සේයාරුවට නැගුණු ඡායාරූප හා විශේෂ අවස්ථා කිහිපයක් පහතින් දක්වේ.

**ත්‍රිකුණාමලය :**

තිකුණාමලය නගර වෙරළ තීරයේ දී පසුගිය 09 වැනිදා පැවැත්වුණු චේ දිනය සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලසභික සුනිල් හඳුන්නෙත්ති සහෝදරයාද සහභාගී වූ අතර සිංහල, දෙමළ, මුස්ලිම් විශාල තරුණ තරුණියන් පිරිසක් ද ඊට සහභාගී වී සිටියහ.

**ගාල්ල :**

ඔක්තෝම්බර් 13 වන දා ගාල්ල නගර ශාලාවේ දී පැවැති චේ දින උත්සවය සඳහා ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යමකාරක සභික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා හා හෘදය රෝග විශේෂඥ වෛද්‍ය නාමල් ගමගේ මහතා ද මෙන්ම තරුණ තරුණියන් රැසක් සහභාගී වූහ.

**මීගමුව :**

පසුගිය 16 වැනි දා මීගමුව බ්‍රවුන්ස් බීච්හි දී පැවති චේ දින උත්සවය සඳහා ජනතා විමුක්ති පෙරමුණේ දේශපාලන මණ්ඩලසභික පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් සහෝදරයා ඇතුළු පක්ෂයේ සහ තරුණ සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් සහභාගී වූ අතර රොඩ්නි වර්ණකුල, ශ්‍රේෂන් ජයමහ, කෞෂාන් විජේසූරිය ඇතුළු ප්‍රවීණ සහ නවපරපුරේ කලාකරුවෝ රැසක්ද සහභාගී වූහ.

**නුවර :**

ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයාගේ ප්‍රධානත්වයෙන් පැවති චේ දිනය පවත්වන ලද්දේ මහනුවර, බෝගම්බර දී පසුගිය ඔක්තෝම්බර් මස 29 වැනිදාය.




## කෝච්චිය සහ බෙල්ල....

තිබ්බා බෙල්ල ..
කෝච්චියට..
ධනපතියන්ගේ..
උඹ අහුවුණා..
කෝච්චියට නෙවේ.
යථාර්ථට පේන
මිත්‍යාවට..
උඹ මියැදුණා..
දෙපයින් නොවේ
දනින් ඇණ..
උඹ හිටියනම්
එන්න තිබුණා..
පෙරළන්න කෝච්චිය..
අපිත් එක්ක..
හෙටත් එකෙක්
බෙල්ල තියනකල් නොඉඳ..



# ආණ්ඩුව හොරුන් ඇල්ලීමද? හොරු ආණ්ඩුව ඇල්ලීමද?

පසුගිය දිනක කොළඹ පදනම් ආයතනයේ පැවැති උත්සවයකදී ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා විසින් කරනු ලැබූ ප්‍රකාශයක් නිසා දේශපාලන තලයේ කතාබහ උණුසුම් විය. අල්ලස් හා දූෂණ කොමිසම, මූල්‍ය අපරාධ කොට්ඨාශය හා රහස් පොලීසිය ගැන සඳහන් කරමින් එවා දේශපාලන න්‍යාය පත්‍රයකට අනුව මෙහෙයවනවා දැයි ජනාධිපතිවරයා විසින් ප්‍රශ්න කිරීමත් සමඟ මහා පරිමාණ මූල්‍ය වංචා හා අපරාධවලට එරෙහිව සිදුකෙරෙමින් තිබූ පරීක්ෂණ හා ක්‍රියාමාර්ග අඩාලවීමකට ලක්විය. එකී ප්‍රකාශයත් සමඟ පරීක්ෂණවලට ලක්ව සිටි රාජපක්ෂ කල්ලියේ හොර නඩයත් අමන්දානන්දයට පත්ව පරීක්ෂණ පවත්වන ආයතනවලට එරෙහි ප්‍රහාරය දැඩි කළේය. ඒ අතර පරීක්ෂණ පවත්වන ආයතනවල නිලධාරීහු අපහසුතාවයට පත්වූහ. අල්ලස් හා දූෂණ කොමිසමේ අධ්‍යක්ෂවරිය ඉල්ලා අස්වූවාය. රාජපක්ෂ කල්ලිය ජනාධිපතිවරයාගේ කතාව අගය කරමින් එය තම හොරකම් පිළිබඳ පරීක්ෂණ වසා ගැනීමට උපයෝගී කර ගනිද්දී රාජපක්ෂ පාලනය තුළ මහජන මුදල් හොරකම් කළ හා දැනට වත්මන් ආණ්ඩුවේ ඇමතිධුර ලබා සිටින 'මීළඟට නඩු වැටීමට නියමිත' අයද ජනාධිපතිගේ ප්‍රකාශය අගය කරමින් එය සාධාරණය කරනු ලැබූයේ 'දී කිරට බළල්ලුත් සාක්කි' යන කියමන සිහිපත් කරමිනි. මේ අතර වත්මන් පාලනය ගොඩ නැගීමට හා මෙම ඊනියා යහපාලනය ගැන විශ්වාසය තබා සිටි කණ්ඩායම් වික්ෂිප්තභාවයට හා කලකිරීමටද පත්විය.

මූල්‍ය අපරාධ හා වංචා පිළිබඳ සිදුකෙරෙන පරීක්ෂණ හා එම ආයතන අභියෝගයට ලක්කරමින් ජනාධිපතිවරයා විසින් සිදුකරනු ලැබූ ප්‍රකාශය එලෙස සිදුකිරීම සඳහා ජනාධිපතිවරයාට බලපෑ විවිධ හේතු හා කරුණු තිබෙනන්නට පුළුවන. විශේෂයෙන්ම හමුදා හා බුද්ධි අංශ නායකයින් අත්අඩංගුවට ගන්නා විට 'රණවිරුවන් දඩයම් කරන බවට' රාජපක්ෂ කල්ලිය විසින් පතුරුවන ප්‍රකාශයන් හා හමුදා තුළ ඇතිවිය හැකි මානසිකත්වයන් පිළිබඳ ජනාධිපතිවරයා කල්පනා කරන්නට ඇත. එහෙත් එම ගැටලුවලට නිවැරදි ආකාරයෙන් ප්‍රතිචාර දක්වනවා වෙනුවට ජනාධිපතිවරයා සිදුකරනු ලැබූයේ හොරුන්ට ඉනිමං තනන වර්ගයේ ප්‍රකාශයකි. මෙයින් පසු "හොරු ඇල්ලීමේ" ක්‍රියාවලියට එයට එරෙහිව ගොඩ නැගී තිබූ බරපතළම විවේචනය වූයේ වංචා, දූෂණ, මූල්‍ය වංචා හා අපරාධ පිළිබඳවය. ඉන්පසු බලයට පත් මෛත්‍රී-රනිල් හවුල් ආණ්ඩුවට පැවරුණ හා ආණ්ඩුව විසින් පවරාගන්නා ලද කටයුතු අතරින් එක් ප්‍රධාන කටයුත්තක් වූයේද මූල්‍ය අපරාධ හා වංචා දූෂණ පිළිබඳ පරීක්ෂණ පවත්වා හොරුන්ට දඬුවම් දීමය. එහෙත් ආරම්භයේ සිටම ආණ්ඩුව ඊට හරියට අත ගැසුවේ නැත. මේ පිළිබඳ සිදුවන්නේ කුමක්දැයි පැහැදිලි නැත. කෙසේ වෙතත් එකක් පැහැදිලිය. එනම් ධනපති ක්‍රමය එලෙස පවතිද්දීම හොරකම් කළවුන් හා හොරකම් කිරීම ආරම්භ කළවුන් ආණ්ඩුවේ ප්‍රබලයන්ව සිටියදීම 'හොරුන් ඇල්ලීම' යථාර්ථයක් නොවන බවය. සැබැවින්ම දැන් සිදුවෙමින් තිබෙන්නේ ආණ්ඩුව විසින් හොරු ඇල්ලීම නොව හොරු විසින් ආණ්ඩුව ඇල්ලීමය. සැබෑ ලෙසම හොරු ඇල්ලීමට කැමති, යහපාලනය අපේක්ෂා කරන ඕනෑම අයෙක් සිදුවූ සිදුවීම්වලින් පාඩම් උගෙන හොරු අල්ලන සැබෑ මඟ තනා ගැනීමට දැන්වත් ඉදිරිපත් විය යුතුය. ඒ සඳහා සිදුවූ දේ දෙස ආපසු හැරී බැලිය යුතුය.

2015 ජනවාරි 08දා පැවති ජනාධිපතිවරණයෙන් මහින්ද රාජපක්ෂ මහතා පරාජයට පත්ව රාජපක්ෂ පාලනයේ නිමාව සනිටුහන් වන විට ආණ්ඩුවේ මැදිහත්වීම අරාජික, වැනෙන සුළු, මන්දගාමී එකක් විය. සමාජයෙන් ආ තෙරපීමත් ජ.වි.පෙ. ඇතුළු සමහර සංවිධාන විසින් කළ හඬ නැගීම හා මැදිහත්වීමත් නිසා ආණ්ඩුව මූල්‍ය අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට ඉඩ දුන්නේය. එහෙත් ඒවාට අමාත්‍යාංශ මට්ටමේ අවශ්‍ය සහයෝගය ලබා දුන්නේ නැත. පසුගිය කාලයේ දිවිනැගුම, මඟ නැගුම ඇතුළු විවිධ ආයතන තුළ හා අමාත්‍යාංශ තුළ සිදුව ඇති මහා පරිමාණ වංචා පිළිබඳ ඊනියා යහපාලන ආණ්ඩුවේ එකදු ඇමතිවරයෙක් හෝ නිලධාරියෙක් පැමිණිල්ලක්වත් ඉදිරිපත් කළේ නැත. දැනට විභාග කරනු ලබන්නේ ජ.වි.පෙ.ත් දූෂණ විරෝධී හඬත් තවත් සිවිල් පුද්ගලයිනුත් කළ පැමිණිලි මිස ආණ්ඩුව කළ ඒවා නොවේ.

ධනපති ක්‍රමය තුළ ධනපති ආණ්ඩු විසින් රාජ්‍ය දේපළ, මහජන දේපළ වංචා කිරීම් හා හොරකම් පිළිබඳ කරන පරීක්ෂණවලට සීමාවක් තිබේ. එය පංතිමය සීමාවකි. හොරකම් කර ඇත්තේ, සාමාන්‍ය පුද්ගලයෙක් නම් රජයේ සේවකයෙක් නම් එය ඉතා කුඩා වුවත් පරීක්ෂණ කඩිනම්ය. සැකකරුවන්ට ඇප නැත. රෝහල් පහසුකම් නැත. ජනමාධ්‍යවල පම්පෝරි කථා සඳහා අවස්ථා නැත. ප්‍රසිද්ධිය නැත. එහෙත් සැකකරුවා ධනේශ්වර පංතියේ නම් විශේෂයෙන් රාජ්‍ය බලය දැරූ අයෙක් නම් එවිට පරීක්ෂණ ඉබි ගමනේය. එක රැයින් ඇප ලැබේ. නැතිනම් රෝහල් පහසුකම් ලැබේ. ප්‍රසිද්ධියද ලැබේ. හොරු වීරයන් බවට පත්කරනු ලැබේ. නීතිය සැමට සාධාරණය යන්න හිස් වදන් බවට පත්වේ. හිටපු හමුදාපතිවරුන් අධිකරණයට 'දැක්කීම' ගැන ජනාධිපතිවරයා කලබල වුවද සාමාන්‍ය පුද්ගලයින්ට එය අදාළ නැත.

අනෙක් අතට වත්මන් ආණ්ඩුව හැදුණු ක්‍රමයක්ද තිබේ. එය අරුම පුදුම විකෘතියකි. 2015 ජනාධිපතිවරණයේදී රාජපක්ෂ පාලනයට එරෙහි පිලේ අපේක්ෂකයා වූයේ, මෛත්‍රීපාල මහතාය. ජනාධිතිවරණයෙන් සන්ධානය පරාජයවී රාජපක්ෂ මහතාගේ ජනාධිපතිකම අහිමිවූ විට ජනාධිපති බවට පත්වූයේ මෛත්‍රීපාල මහතාය. එහෙත් 2015 අගෝස්තු මහ මැතිවරණයේදී මෛත්‍රීපාල මහතා කළේ ජනාධිපතිවරණයේදී තමන්ට එරෙහි පිල නියෝජනය කළ සන්ධානයේම නායකයා වීම හා එය වෙනම ඡන්දයට ඉදිරිපත් වීමය. එහිදී තම ප්‍රතිවාදියා වූ මහින්ද රාජපක්ෂට නාමයෝජනා දෙනු ලැබීය. එම ඡන්දයෙන් සන්ධානය හෝ එ.ජා.ප.ය හෝ දෙකෙන් එකකටවත් ආණ්ඩුවක් පිහිටුවීමේ බහුතර බලය නොවීය. එවිට ජනාධිපති මෛත්‍රීපාල මහතා ශ්‍රී.ල.නි.ප.ය නිල වශයෙන් එ.ජා.ප.ය හා එක්ව හවුල් ආණ්ඩුවක් පිහිටවනු ලැබීය. එහිදී ශ්‍රී.ල.නි.ප මහින්ද කල්ලිය විපක්ෂයේ සිටි අතර ශ්‍රී.ල.නි.ප පිරිසක් මෛත්‍රී සමඟ ආණ්ඩුවට සම්බන්ධ විය. ඔවුන්ට ඇමතිධුර පිරිනමන ලදී. එම පිරිසද රාජපක්ෂ පාලන සමයේ මහා පරිමාණ හොරකම් කළ අය වූහ. අවසානයේ ආණ්ඩුවට සිදුවූයේ හොරු ඇල්ලීම පසෙක තබා හොරු සමග' එක්ව ආණ්ඩුව අටවා ගැනීමය. එවිට හොරු ආණ්ඩුව ඇල්ලුවෝය.

ඉන්පසු ජනමතයේ බලපෑම නිසා ආණ්ඩුව 'හොරු ඇල්ලීමට' සීමිත ක්‍රියාමාර්ග ගත්තද එම ක්‍රියාමාර්ග ආණ්ඩුවට සම්බන්ධ අය දක්වා එනවිට තවදුරටත් හොරු ඇල්ලීම කළ නොහැකි වී ඇත. මන්ද එවිට හොරුන් වන්නේ ආණ්ඩුවම නිසාය. එසේම අලුත් ආණ්ඩුව බිහිවූ වහාම එජාප ඇමතිවරුද පරණ 'ඇරියස් කවර් කිරීමේ' ක්‍රියාමාර්ගවලට බැස්සෝය. වරායේ වාහන වංචා, මහබැංකු බැඳුම්කර වංචා, ගල් අඟුරු ටෙන්ඩර් වංචා එළියට එන්නට පටන් ගත්තේය. දැන් හොරු ඇල්ලීම පාරාවළල්ලක් වූ විට එය දුර්වල කරනවා හැර වෙන විකල්පයක් ආණ්ඩුවට නැත. මන්ද ආණ්ඩුවේ ප්‍රධානීන්ම කියන ලෙස සියල්ලට පෙර 'ආණ්ඩුව රැකගත යුතු' නිසාය. ධනවාදය තුළ හොරු ඇල්ලීමේ කලාව එසේය.

මෙහිදී වටහාගත යුතු තවත් කරුණක් තිබේ. පසුගිය කාලයේ සිදුවූ මහා පරිමාණ හොරකම් බොහොමයක් හුදකලා ඒවා නොව ජාලගත වූ ඒවා බවය. එක හොරකමකට බොහෝ දෙනෙක් සම්බන්ධය. සමහරු ආණ්ඩු පක්ෂයේය. සමහරු විපක්ෂයේය. හොරකමට එම වෙනස බලපා නැත. මේවාට දේශපාලන නායකයෝත් සම්බන්ධය. සමහර නිලධාරීනුත් සම්බන්ධය. එසේම මහා පරිමාණ හොර ජාවාරම්වලින් උපයාගත් කෝටි ප්‍රකෝටි කළු සල්ලිවලින් නඩත්තු වූ අය සිටිති. මෙම කළු සල්ලි අයිතිකරුවෝ දේශපාලකයන්ද, නීතියද සියල්ල මිලදී ගනිති. එවිට හොරු ඇල්ලීම ලේසි නැත. ඇවන්ට් ගාඩ් ගනුදෙනුව, මිග් යානා ගනුදෙනුව බැඳුම්කර ගනුදෙනුව ඊට නිදසුන්ය.

ඇවන්ට්ගාඩ් වංචාවේදී කළු සල්ලි පැතිර තිබූ ප්‍රමාණය කොතරම්ද යන්නත් එම සමාග මට විකිණී තිබූ පුද්ගලයන් කොතරම්ද යන්නත් සිතා ගැනීමට පවා නොහැකි විය. ඇවන්ට් ගාඩ් සමාගමට අයත්, ගාල්ලේදී අත්අඩංගුවට ගත් නැව පිළිබඳ

15 වැනි පිටුවට



> "අලුත් ආණ්ඩුව බිහිවූ වහාම එජාප ඇමතිවරුද පරණ 'ඇරියස් කවර් කිරීමේ' ක්‍රියාමාර්ගවලට බැස්සෝය. වරායේ වාහන වංචා, මහබැංකු බැඳුම්කර වංචා, ගල් අඟුරු ටෙන්ඩර් වංචා එළියට එන්නට පටන් ගත්තේය. දැන් හොරු ඇල්ලීම පාරාවළල්ලක් වූ විට එය දුර්වල කරනවා හැර වෙන විකල්පයක් ආණ්ඩුවට නැත. මන්ද ආණ්ඩුවේ ප්‍රධානීන්ම කියන ලෙස සියල්ලට පෙර 'ආණ්ඩුව රැකගත යුතු' නිසාය. ධනවාදය තුළ හොරු ඇල්ලීමේ කලාව එසේය."



"රජය සම්පූර්ණයෙන්ම අභාවයට යාමේ ආර්ථික පදනම වූ කලී කොමියුනිස්ට්වාදයේ සංවර්ධනයේ උසස් අවධියයි. මොළය හා කය වෙහෙසා වැය කරන ශ්‍රමය අතර ඇති භේදය නැතිවූ දාට වත්මන් කාලයේ තිබෙන එක් සමාජමය අසමානතාවයක උල්පත නැතිව යනු ඇත. නිෂ්පාදන මාධ්‍යයන් පොදු ජන දේපොළ බවට පත් කළ පමණින් හෝ ධනපතින්ගේ දේපොළ උදුරා ගැනීමෙන් හෝ සැණෙකින් වෙනස් කළ නොහැකි සමාජමය අසමානතාවයේ උල්පතකි මෙය."

**ලෙනින්,**
**රජය හා විප්ලවය,**
**106 පිටුව**

# උස-මිටි න්‍යායට එරෙහිව



ප සුගිය ඔක්තොම්බර් මාසයේ මැද හරියේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස සියඹලා ගසක් යට වාඩි වී තම අමාත්‍යාංශයේ රැකියා සඳහා තරුණ තරුණියන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයක් පවත්වන අවස්ථාවක වීඩියෝවක් අන්තර් ජාලයේ ප්‍රචාරය විය. සාමාන්‍යයෙන් මෙරට දේශපාලනයට මෙවෙනි සිදුවීම් අලුත් දෙයක් නොවුණත් යහපාලන ආණ්ඩුවේ නිරුවත තවත් පැතිකඩකින් රටට හෙළිදරව් විය. පැවති පාලනයේ මෙවැනි ක්‍රියා විවේචනය කරමින් බලයට පැමිණි වත්මන් පාලනය ඉතාමත් කෙටි කාලයක් තුළ පැවති රාජපක්ෂ පාලනය ගිය මඟම ගමන් කරන තත්වයට වැටී ඇත.

එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක අමාත්‍ය සජිත් ප්‍රේමදාසගේ මේ ක්‍රියාවට එරෙහිව පසුගිය ඔක්තොම්බර් 24වැනිදා සමාජවාදී තරුණ සංගමය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලදී

මේ අවස්ථාව සඳහා සමාජවාදී තරුණ සංගමය ජාතික සංවිධායක එරංග ගුණසේකර, ජාතික කමිටු සාමාජිකයින් වන අසිත නිරෝෂන, අංජන අමරසිංහ නීතිඥ තුෂාර ගුණරත්න යන සහෝදරවරු සහභාගි වූහ.

# වැට් විරෝධය




ම හ බැංකුවේ සිදුකරන ලද බැදුම් කර වංචාව පිළිබඳ කෝප් කමිටුවේ සිදුවන සංවාදය පිළිබඳව රටේ ජනතාව අවධානය යොමු කර සිටියදී එනම් පසුගිය ඔක්තොම්බර් 26වැනිදා වැට් පනත සම්මත කර ගැනීමට යහපාලන ආණ්ඩුව කටයුතු කළේය.

වැට් පනතට එරෙහි ජ.වි.පෙ. මෙන්ම දිවයින පුර පිහිටි වෙළඳ සංගම්ද දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාවලියක නිරතව සිටි මොහොතක ඒකාබද්ධ විපක්ෂය යයි කියා ගන්නා මහින්ද කල්ලියේ පිරිසක් මෙම වැට් සංශෝධනවලට එරෙහිව අධිකරණ ක්‍රියා මාර්ග යකට අවතීර්ණ විය. ඒ තත්වය තුළ ගොඩනැගෙමින් තිබූ වැට් විරෝධී සටන් ක්‍රියා මාර්ග සියල්ල අඩපණ වූ අතර මහින්ද පිලේ මේ ක්‍රියා මාර්ගය වැට් පනත ගෙන ඒමට යහපාලන ආණ්ඩුවට මහත් ආශිර්වාදයක් විය.

කෙසේ නමුත් වැට් පනත පාර්ලිමේන්තුවට ගෙන එන ඔක්තොම්බර් 26වැනිදා මධ්‍යහ්නයේ පාර්ලිමේන්තු වටරවුමේදී පාර්ලිමේන්තුව තුළ සම්මත කිරීමට සූදානම් වන වැට් පනතට එරෙහිව දැවැන්ත උද්ඝෝෂණයක් ජ.වි.පෙ. විසින් සංවිධානය කර තිබුණි. මේ උද්ඝෝෂණය සඳහා ජ.වි.පෙ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මෙන්ම එහි ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ඇතුළු සාමාජික සාමාජිකාවෝ විශාල පිරිසක් සහභාගි වූහ.

# එකම හඬක් - එකම තැනක්




"එකම හඬක් - එකම තැනක්" යන තේමාව යටතේ ලංකා ගුරු සේවා සංගමයේ ජාතික සමුළුව පසුගිය ඔක්තොම්බර් 21 වෙනිදා මහරගම යොවුන් රඟහලේදී පැවැත්විණි. වෘත්තිය සමිති ව්‍යාපාරයට පමණක් සීමා නොවූ ලංකා ගුරු සේවා සංගමයට රටේ ජනතාවගේ පොදු ගැටලුවලදී ජනතාවගේ පාර්ශවයේ සිට ගනිමින් ඒවාට මැදිහත් වූ ඉතිහාසයක් නියෝජනය කරනු ලබයි. මේ වන විට ගුරු ක්ෂේත්‍රයේ ප්‍රබලතම වෘත්තිය සමිතිය බවට පත් වී ඇත්තේද ලංකා ගුරු සේවා සංගමයයි. අධ්‍යාපන සමූකාරයේ අති බහුතර බලය ගුරු සේවා සංගමයට හිමිකර ගැනීමට හැකිවීමෙන් මේ බව සනාථ විය. වෘත්තිය සමිතියක් ලෙස මෙවන් ඉදිරිගාමී ගමනක් යෑමට ජ.වි.පෙ. විසින් දෙන ලද දේශපාලන නායකත්වය මහත් පිටිවලක් විය.

ඔක්තොම්බර් 21වැනිදා පැවති මෙම සමුළුවේ ප්‍රධාන ආරාධිතයා ලෙස ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා සහභාගි වූ අතර, ජාතික වෘත්තීය සමිති සම්මේලනයේ සභාපති ලාල් කාන්ත, ලංකා ගුරු සේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයතිස්ස සහෝදරයා ඇතුළුව දිවයිනේ සතර දිග් භාගයෙන් පැමිණි ගුරු සංගම් නියෝජිතයින්ගෙන් සමුළුව වර්ණවත් විය.

# කළුතරට අලුත් වැසි



'සාහිත්‍ය කන්නදැයි' ඇසුවේ 1977 බලයට පත් එ.ජා.ප. නායක ජේ.ආර්.ය. එතරම් කලාව හා සාහිත්‍යය ඔවුන්ට පිළිකුල් විය. මෙය ඔවුන්ගේ පෞද්ගලික වුවමනාවකට වඩා තම ආර්ථික ක්‍රමය පවත්වාගෙන් යාමට එය වඩාත් යෝග්‍ය බව ඔවුන් දැන සිටියා විය හැක. කලාව හෝ සාහිත්‍යය නොමැති තැන බිහි වන්නේ රෝබෝවරුන් වැනි මිනිසුන්ය. ප්‍රශ්න කිරීම් නැති, දෙන දෙයක් කා, වෙන දෙයක් බලාගෙන සිටින මිනිසුන්ය.

ජ.වි.පෙ. කලාව හා සාහිත්‍යයෙන් මිනිසුන් පරිපූර්ණ කිරීමට නිරන්තර අරගලයක යෙදෙනුයේ මානව බැඳීම්වලින් යුත් මිනිසුන් බිහි කිරීමට කලාව හා සාහිත්‍ය අනිවාර්ය බව පසක් කර ගෙන සිටින නිසාවෙනි. මෙවන් පසුබිමක් තුළ කළුතර දිස්ත්‍රික් දිරිය පුරවැසි සමිති විසින් සංවිධානය කරන ලද "අලුත් වැස්ස" දිරිය පුරවැසි කලා මහෝත්සවයේ සමාප්ති උළෙල පසුගිය ඔක්තොම්බර් 02 වෙනිදා කළුතර නගර සභා පරිශ්‍රයේදී පැවැත්විණි. මෙය ජනතා විමුක්ති පෙරමුණේ දිරිය පුරවැසි සමිති සීයයක සහභාගිත්වයෙන් පවත්වන ලදී. කලා උළෙල වෙනුවෙන් පැවති චිත්‍ර තරඟයෙන් ජයග්‍රහණය කළ චිත්‍ර තුන්සියයක් පමණ මෙහි ප්‍රදර්ශනයට තබා තිබූ අතර ජාතික සමගිය හා පරිසරය සුරකිමු යන තේමාව යටතේ මෙම චිත්‍ර ඇඳ තිබුණි. සංගීත ප්‍රසංග, සාහිත්‍ය දේශණ, ප්‍රදර්ශන කුටි, වීදි නාට්‍ය හා චිත්‍ර ඇඳීමේ වැඩමුළුවලින් නගර සභා පරිශ්‍රය විචිත්‍රවත් වී තිබුණි. එදින පැවති ත්‍යාග ප්‍රදානෝත්සවය සහ සංස්කෘතික ප්‍රසංගය ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, දිරිය පුරවැසි කලා මහෝත්සවයේ ප්‍රධාන සංවිධායක පාර්ලිමේන්තු මන්ත්‍රී වෛද්‍ය නලින්ද ජයතිස්ස යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ ප්‍රවීන ගීත රචක රත්න ශ්‍රී විජෙසිංහ, ප්‍රවීන ලේඛිකා සෝමා ජයකොඩි, ලේඛක බටුවන්ගල රාහුල හිමි, ප්‍රවීණ රංගවේදිනී දීපානි සිල්වා යන මහත්ම මහත්මීන්ගේ සහභාගිත්වයෙන් පැවත්වුණි. මෙහි කැපී පෙනෙන ලක්ෂණය වූයේ කිසිදු පක්ෂ බේදයකින් තොරව විශාල පිරිසක් මෙම කලා උළෙලට සහභාගි වී සිටීමයි.

# බොන ජලය විස කරන ධනවාදය

"කිලෝමීටර් 145 ක දිගින් යුත් වර්ග කිලෝ මීටර 2292ක ගංගා වර්ග ඵලයක් ඇති කැළණි ගඟ ඒ ආශ්‍රිතව ඇති කර්මාන්තයන්හි සීඝ්‍ර වර්ධනය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ඉතාම දූෂිත ගංගාව බවට පත්ව තිබේ. කැළණි ගඟ දූෂණය වීමේ ප්‍රධාන මූලාශ්‍ර ගොඩබිම පදනම් කර ගත් හේතුකාරක වේ. පිරිපහදු කළ සහ නොකළ කර්මාන්ත අපද්‍රව්‍ය, කෘෂිකාර්මික අපද්‍රව්‍ය, ගෘහාශ්‍රිත සහ නගරාශ්‍රිත බැහැර කිරීම් ආදිය ඒ අතර වේ."

ඉහත සඳහන් කර ඇත්තේ කැළණි ගඟේ ජලයේ තත්වය හඳුන්වාදීම සඳහා මධ්‍යම පරිසර අධිකාරිය විසින් සකස් කළ වාර්තාවක මුල් පරිච්ඡේද කිහිපයකි.

සැබැවින්ම ජලය යනු සීඝ්‍රයෙන්ම දූෂණය වන ස්වාභාවික සම්පත බවට පත්ව තිබේ. නමුත් මේ පිළිබඳව රටේ ජනතාවට මෙන්ම පාලකයන්ටද ඇත්තේ ඉතා අවධානයකි. එ කෙසේ වුවත් මේ වන විට රට පුරා පිහිටි භූගත මෙන්ම මතුපිට ජලයද මිනිස් පරිභොජනයට නුසුදුසු තත්වයට පත් වෙමින් තිබේ. නමුත් මේ ජල දූෂණය සම්බන්ධයෙන් මාධ්‍ය, පරිසර හා සමාජ සංවිධාන, පරිසර ක්‍රියාකාරකයින් පවා අතර ඇත්තේ දැඩි නිහඬතාවකි. ඇතැම් විට ඔවුන්ගේ හඬ කිසියම් බලවේගයක් විසින් යටපත් කොට තිබෙන්නටද පුළුවන.

එවන් වටපිටාවක් තුළ මෙවර අප "ගවේෂණ" මගින් අවධානය යොමු කරනු ලබන්නේ මේ ජල දූෂණයේ දිග පළල පිළිබඳවය.

## රසායනික අවුල

ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් බවට අපට උගන්වනු ලබන්නේ පාසලේ පහළ වසරවල සිටය. වී වගාව, එළවළු, පළතුරු මෙන්ම තේ,පොල්, රබර් වැනි වගාවන්ද මෙරට ප්‍රචලිතව පවතී. ඒ සෑම වගාවක් සඳහාම කෘෂි රසායන යෙදීම අද අනිවාර්යයක් ව පවතී. රට තුළද රසායනික පොහොර ඕනෑද එපාද? වශයෙන් කථිකාවක්ද ගොඩ නැගී තිබේ. ඒ කථිකාව කෙසේ වුවද අප මෙහිදී අවධානයට යොමු කරනු ලබන්නේ, රසායනික පොහොර, පළිබෝධ නාශක, වල් පැලෑටි මර්දනයට යොදා ගන්නා රසායනික ද්‍රව්‍ය ආදිය ජල ප්‍රභවයන් කෙරෙහි කෙසේ බලපානවාද යන්නයි.

සාමාන්‍යයෙන් ජලයේ ඇති විශේෂිත ලක්ෂණයක් නම් එයට ඕනෑම දෙයක් පාගේ දියකර ගැනීමට ඇති හැකියාවයි. ජලයේ මේ තත්වයද එය ඉක්මණින් දූෂණය වීමට ඉවහල් වී ඇත. අපේ රටේ මධ්‍ය කඳුකරයෙන් ආරම්භ වන ගංගා පද්ධතියේ මුල් සීමාවේ හැරෙන්නට එය මහ සයුර හා එක් වන තෙක්ම එයා ගලා යන්නේ ගොවි බිම් හරහාය. එම ගොවි බිම්වල වගාවන් වී, එළවළු, පළතුරු, තේ ආදී කුමන වගාවක් වුවද ඒ සෑම වගාවක් සඳහාම රසායනික පොහොර යොදනු ලබයි.

කෘෂි රසායනික එක් කිරීම නිසා භූගත මෙන්ම පොළොව මතුපිට ඇති ජලාශවලට සිදුව ඇති හානිය පිළිබඳව සිදු කළ පර්යේෂණයකදී හෙළිව ඇත්තේ අනුරාධපුර, පොළොන්නරුව ආදී දිස්ත්‍රික්කයන්හි බහුතරයක් ජලාශයන්හි පොස්පරස් ප්‍රතිශතය ඉහළ ගොස් ඇති බවයි. සාමාන්‍යයෙන් ජලයේ පොස්පරස් ප්‍රතිශතය ඉහළ ගිය විට සිදුවනුයේ අධි සනත්වයෙන් යුතු ඇල්ගී උඩමණ්ඩි ආදිය වර්ධනය වී විෂ කාරක ජලයට එක් කිරීමයි. උතුරු ඇමරිකාවේ ප්‍රධාන විල් පහෙන් එකක් වූ ඊරී (Erie) විලද විනාශ වූයේ පොස්පරස් ප්‍රතිශතය ඉහළ යෑමෙන් ඇති වූ ඇල්ගී තත්වයක් හේතුවෙන් බව කියවේ. ඒ අවට පෙදෙස්වල අධික ලෙස පොස්පරස් අඩංගු පෙහොර භාවිතා කිරීම මෙන්ම සබන් වර්ග භාවිතයද මෙයට හේතු වී ඇති අතර විලෙහි සිටි මත්ස්‍යයන්ද විශාල වශයෙන් මිය ගොස් තිබේ.

2013 වසරේ උල්හිටිය ජලාශයෙන්ද ඇල්ගී උඩමණ්ඩි තත්වයක් වර්ධය වූ අතර ඒ වන විට එම ජලාශයේ ජලය ලීටරයක පොස්පරස් මිලි ග්‍රෑම් 0.18 ක් තිබී ඇත. නමුත් යුරෝපීය සංගමයේ ඒකාබද්ධ පර්යේෂණ මධ්‍යස්ථානයේ (Joint Research Center Of The Europen Union) වර්ගීකරණයට අනුව ජලය ලීටරයක මිලි ග්‍රෑම් 0.1 ට වඩා පොස්පරස් තිබේ නම් එය අතිශය දූෂණයට ලක් වූ ජලශයක් බවට නම් කෙරේ. මෙරට ජලාශවලින් බොහොමයක් උල්හිටිය ජලාශය මෙන් දූෂණය වී ඇති බවට කරුණ සැලවී තිබේ.

විශේෂයෙන් වියළි කළාපයේදී ජලය තුළ කෘෂි රසායනවල ක්‍රියාකාරීත්වය වඩා තීව්‍ර වන තැනට කරුණු පෙළ ගැසී තිබේ. ඒ මෙසේය, සාමාන්‍යයෙන් වියළි කලාපයේ භූගත ජලයේ දිය වී ඇති සංයෝග ප්‍රමාණය එනම් ලවණ ප්‍රමාණය ආදිය ඉහළ අගයක් ගනී. සාමාන්‍යයෙන් වර්ෂාපතනයකදී සිදු වන්නේ එම වැසි ජලය භූ ගත වී එම ලවණ සාන්ද්‍රණය අඩු කිරීමට කටයුතු කිරීමයි; එනම් තනුක කිරීමේ ක්‍රියාවලියයි. නමුත් පරිසරයේ සිදුව ඇති නොයෙක් අසංතුලිතතා හේතු කොට ගෙන වර්ෂාපතනය නිසි පරිදි නොලැබීම සහ ජලය වාෂ්පීකරණ වීම තුළ ජලයේ ලවණ සාන්ද්‍රණය මෙන්ම අනෙකුත් සංයෝගයන්ගේ සාන්ද්‍රණයද ඉහළ අගයක් ගනී. සාමාන්‍යයෙන් මේ තත්වයකදී පවා ජලයේ ගුණාත්මකභාවය පහත වැටී ඇති නිසා පානයට හෝ ආහාර ද්‍රව්‍ය පිළියෙළ කර ගැනීමට හෝ කිසිසේත්ම සුදුසු තත්වයක නොපවතී. මෙසේ ලවණ මෙන්ම අනෙකුත් සංයෝගයන්ගෙන් සාන්ද්‍ර වූ ජලයට කෘෂි රසායන එකතු වීම හේතුවෙන් මේ ජලයේ ගුණාත්මකභාවය අතිශයින්ම පහළ වැටෙන බැවින් එම ජලය පරිභෝජනයට ගැනීමෙන් අහිතකර සෞඛ්‍ය ගැටලු රාශියක මුහුණ දීමට සිදුවේ.



## කර්මාන්ත අපද්‍රව්‍ය

කෘෂි රසායනවලට අමතරව ජලය දූෂණය වන තවත් ප්‍රධාන ආකාරයක් වන්නේ, කර්මාන්තශාලාවලින් අපද්‍රව්‍ය නිකුත් කිරීමය. අද වන විට තනි තනි කර්මාන්ත ශාලා මෙන්ම බියගම, කටුනායක, මීරිගම, හොරණ, කොග්ගල, සීතාවක ආදී වශයෙන් ආයෝජන කලාපවල තිබෙන කර්මාන්ත සමූහයන් මගින්ද අපද්‍රව්‍ය බාහිරට එකතු කරනු ලබයි. 1980 ජාතික පරිසර පනතේ 23 (a)ම කොටස අනුව අපජලය පරිසරයට එකතු කරන කර්මාන්ත ශාලා සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා දී තිබේ. මධ්‍යම පරිසර අධිකාරිය මගින් නිකුත් කර ඇති බලපත්‍රයේ පවතින නිර්ණායකයන්ට අනුව අපජලය බැහැර කිරීමට එම කර්මාන්තශාලා නීත්‍යානුකූලව බැඳී සිටී.

බහුතරයක් කර්මාන්තශාලා පරිසරයට මෙම අපජලය බැහැර කිරීමට පෙර පරිසර බලපත්‍රයට අදාළ කිසිදු නිර්ණායක් සලකනු ලබන්නේ නැති බවට තොරතුරු ලැබී ඇත. විශේෂයෙන් මේ කර්මාන්ත ශාලාවලින් බැහැර කරන අප ජලය තුළ මිනිස් ශරීරයට අහිතකර ද්‍රව්‍ය අධික ප්‍රතිශතවලින් පවා පැවතිය හැක. විෂ කාබනික සංයෝග, බැර ලෝහ ආදිය ඒ අතර ප්‍රමුඛතාවයක් ගනී.

ආසනික්, කැඩ්මියම්, ක්‍රෝමියම්, ඊයම්, රසදිය ආදිය බැර ලෝහ ලෙස හඳුන්වන අතර මේවා අවම ප්‍රමාණයන්ගෙන් ශරීර ගත වීමද ඉතා හානි කර විය හැක. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පානීය ජලයේ දියවී තිබිය හැකි බැර ලෝහයන්ගේ ආරක්ෂිත සීමාවන් මෙසේ දක්වා ඇත. එනම් ජලය ලීටරයක ආසනික් මිලි ග්‍රෑම් 0.05ක්ද ඊයම් හා ක්‍රෝමියම් මිලි ග්‍රෑම් 0.005ක්ද කැඩ්මියම් හා රසදිය මිලි ග්‍රෑම් 0.001ක්ද යනාදි වශයෙනි. මේ සීමාවන් ඉක්මවා බැර ලෝහ දිය වී ඇති ජලය අප භාවිතයට ගතහොත් ප්‍රධාන වශයෙන් මොළයේ ක්‍රියාකාරීත්වය විනාශ වීම, වකුගඩු ආශ්‍රිත රෝග, මානසික රෝග, පෙනහලු සහ චර්ම රෝග, පිළිකා, අස්ථි විකෘතිතාවයන් මෙන්ම රුධිර සංසරණ පද්ධතියටද අහිතකර බලපෑම් යනාදිය සිදු විය හැක.

## මණ්ඩලයට පුළුවන්ද?

ඒ අනුව ජලය උණු කර පෙරා ගැනීමෙන් හෝ නැතිනම් වෙළඳ පොළේ පවතින ජල පෙරණයන් භාවිතා කිරීම වැනි සරල ක්‍රම වලින් මෙයට විසඳුම් සෙවිය නොහැකි බව තහවුරුය. ජනතාවට පානීය ජලය ලබා දීම සඳහා මෙරට පිහිටවා ඇති රාජ්‍ය ආයතනය වන්නේ ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයයි. එහි ජලය මිනිස් පරිභෝජනය සුදුසු තත්වයට පත් කරන ලබන ක්‍රමවේදය වන්නේ ජලයේ අවලම්භිත ද්‍රාවණ "ඇලම්" වර්ග යොදා ඉවත් කිරීම. වාතනයට ලක් කිරීම. PH අගය 7ට ආසන්න වන තෙක් අළුහුණු එක් කර ක්ලෝරීන් මිශ්‍ර කර ජනතාවගේ පානීය අවශ්‍යතා සඳහා ලබා දීමයි. එහෙත් යම් හෙයකින් පානය වෙනුවෙන් සකස් කරන ජලයේ බැර ලෝහ අයන දියවී ඇත්නම් ඒ ප්‍රමාණයන් පරික්ෂා කිරීමට හෝ ඒවා ඉවත් කිරීමට කිසිදු ක්‍රමවේදයක් ජල සම්පාදන මණ්ඩලය සතුව නොමැත. එසේම ජලයට ඩීසල්, පෙට්‍රල් හෝ ග්‍රීස් වැනි ලිහිසි ද්‍රව්‍ය මිශ්‍ර වී තිබුණහොත් ඒවා ඉවත් කිරීමටද ක්‍රමයක් මණ්ඩලය සතුව නොමැති බවද වාර්තා වේ.

මේ ආකාරයට ජලය දූෂණය වී ඇත්නම් ඒ සඳහා ඇති එකම විකල්පය පිරිසිදු කළ බෝතල් ජලය බවට මතයක් සමාජ ගත වී තිබේ. මේවා නිපදවන බොහෝ ආයතන සිදු කරනු ලබන්නේ, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් SLS සහතිකයද, ජල සම්පාදන මණ්ඩලයෙන් ලබා ගත් සහතිකයද මත සිට කර්මාන්තය පවත්වාගෙන යාමයි. මේ සඳහා ජලය ලබා ගන්නේ කවර මූලාශ්‍රවලින්ද, ඒවායේ ගුණාත්මක බව කවරේද? යන්න පිළිබඳ නිසි පසු විපරමක් අදාළ සහතික දුන් ආයතනවලින්ද සිදු නොවේ. මේ බෝතල් ජලයේ නිතරම බලනු ලබන සාධක වන්නේ, එම ජලයේ PH අගය සහ බොරතාවය පමණි. එම ජලයේ බැර ලෝහ අයන දියවී තිබේද, නැතිනම් වෙනත් සංයෝග දියවී තිබේද යන්න පරික්ෂා කිරීමට කිසිදු ක්‍රමවේදයක් එම නිපදවන ආයතන තුළ නැත.

## විසඳුම් නැද්ද?

මීට මාස කිහිපයකට පෙර කොකො කෝලා සාමාගම් විසින් මිනිස් ශරීරයට හානි කර යමක් කැළණි ගඟට මුදා හැර ඇති බවට වන ප්‍රවෘත්තියක් ඇතැම් පුවත්පත්වල මෙන්ම අන්තර්ජාලයේද සැරිසරන ලදී. මේ පිළිබඳව මධ්‍යම පරිසර අධිකාරියෙන් මෙන්ම ජල සම්පාදන හා ජලාපහාන මණ්ඩලයෙන්ද ජල සාම්පල් ගෙන පරීක්ෂා කර තිබේ. මෙම ජල සාම්පල් පරික්ෂාවෙන් පසු පරිසර අධිකාරිය සඳහන් කර ඇත්තේ, සමාගමෙන් මුදා හැර ඇත්තේ ඩීසල් බවයි. ජල සම්පාදන මණ්ඩලය මෙම ජල සාම්පල් ඉන්දියාවේ පර්යේෂණ ආයතනයක් වෙත යවා පරික්ෂා කිරීමේදී පෙනී ගොස් ඇත්තේ, සමාගම විසින් ගඟට මුදා හැර තිබෙනුයේ 4 - මෙතිලිමයිඩසෝල් නම් විෂ කාබනික සංයෝගයක් බවයි. අද අපේ රට මුහුණ දී ඇති යථාර්ථය ඉහත සිදුවීමෙන් වඩා හොඳින් තේරුම් ගත හැක.

රටේ පරිපාලනය මෙහෙයවන දේශපාලන අධිකාරිය මෙන්ම නිලධාරි යාන්ත්‍රණයද මේ ජල ප්‍රභවයන් දූෂණය වීම හඳුන්වන්නේ මිනිස් ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ලෙසය. මෙය හුදෙක් තමන්ගේ ඇඟ බේරා ගැනීම සඳහා මේ සියල්ල මිනිස් ක්‍රියාකාරකම් යන වාක්‍යයට ලඝු කිරීමට ඔවුන් ගන්නා උත්සාහ කළද මෙය මිනිස් ජීවිත නොසලකන කෑදර ධනවාදයේ ප්‍රතිඵලයක් බව ඉතා පැහැදිලිය.



"තමන්ගේ සියලු වැරදි සහ ශක්තීන් සහිත මනුෂ්‍යයෝ සමාජ ව්‍යාපාරයක යාන්ත්‍රණය සංයුක්ත කරති. ඔවුන් වැරදි කළ යුතුය. එසේම වැරදිවලින් පාඩම් උගත යුතුය. වඩ වඩාත් වැරදි කළ යුතුය. එම වැරදිවලින් අලුතින් උගත යුතුය. ඔවුන් ජයග්‍රහණය මෙන්ම පරාජයද රස බලා, ඒ එක් එක් අවස්ථාව සමග ජීවත්වන්නේ කෙසේදැයි සොයා ගත යුතුය. කාලය සහ ක්‍රියාව ගුරුවරුන්ය."

**මාටින් ලූතර් කිං**

# BRICS පුළුල් ගෝලීය භූමිකාවක් ඉල්ලයි



බ්‍රසීලයේ, රුසියාවේ, ඉන්දියාවේ, චීනයේ සහ දකුණු අප්‍රිකාවේ ජනාධිපතිවරු ලෝකය පුරා සිදුවන යුදමය මැදිහත්වීම් හෙළා දකිමින් ගෝවේ ප්‍රකාශනය නිකුත් කළහ. මෙම ප්‍රකාශනය නිකුත් කරනු ලැබුවේ ඉහත රටවල් පහ එක්වී සාදාගත් BRICS සංවිධානයේ අටවන සමුළුව අවසානයේදීය.

මෙවර සමුළුව පැවැත්වූයේ ඉන්දියාවේ ගෝවේ අගනුවර වන පනාජි නගරයේදී ඔක් 15-16 දෙදිනයි. මෙම සමුළුවේදී ඉන්දියාවට එහි සභාපතිත්වය හිමිවිය. ලෝකයේ දැවැන්තම සහ වර්ධනය වන ආර්ථිකයන් අතර සිටින මෙම රටවල දළ දේශීය නිෂ්පාදිතය ලෝකයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් 30%කි. ලෝක ජනගහනයෙන් 53%ක්ම සිටින්නේ මෙම රටවලය. මෙම රටවල භූමි ප්‍රමාණය ලෝකයේ භූමි ප්‍රමාණයෙන් 26%කි. මෙම රටවල් අතර වෙළඳාමෙහි වටිනාකම ඩොලර් බිලියන 244ක් පමණ වන අතර එය ලෝක වෙළඳාමෙන් 10%ක් පමණ වේ.

මෙවර BRICS සමුළුවේ විශේෂත්වයක් වූයේ, බ්‍රසීලයේ හිටපු ජනාධිපතිවරයා වූ ඩිල්මා රොසෙෆ් එළවීමෙන් පසු එරට ජනාධිපති වූ මයිකල් ටේ‍රමර් මුල් වරට BRICS සමුළුවට සහභාගී වීමයි. ඔහු එක්සත් ජනපද හිතවාදියෙකු වන අතර බ්‍රසීලය නව ලිබරල්වාදී ප්‍රතිපත්තිය මත ගෙනයාමට කටයුතු කරන්නෙකි. (රුසියානු ජනාධිපති අනෙක් සෑම රටකම රාජ්‍ය නායකයින් සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා සිදුකළද ඔහු සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡාවක් නොකළේය.)

ගෝවේ ප්‍රකාශනය මගින් BRICS රටවල් වඩා යුක්තිසහගත, ප්‍රජාතන්ත්‍රවාදී, බහු කේන්ද්‍රීය ලෝකයක් ඉල්ලා සිටියහ. ඔවුහු ලෝකය පුරා සිදුවන ආර්ථික හා යුදමය මැදිහත්වීම් හෙළා දුටු අතර ජාතීන් අතර සබඳතා ජාත්‍යන්තර නීතිය හා විශ්වීය වශයෙන් පිළිගත් සාමාන්‍යයන් මත සිදුවිය යුතු යයි අවධාරණය කළහ. ජාත්‍යන්තර ගැටුම් විසඳාලිය යුත්තේ දේශපාලනික හා රාජ්‍යතාන්ත්‍රික ක්‍රමවලින් මිස, ජාතීන්ගේ ස්වෛරීත්වය කෙළෙසමින් හා යුදමය මැදිහත්වීම්වලින් නොවිය යුතු බවද ප්‍රකාශ කළහ.

සිරියාවේ තත්වය පිළිබඳ සඳහන් කරමින්, එම ප්‍රකාශය මගින් ඉල්ලා සිටියේ, රුසියානු අර්බුදය සාමකාමී ආකාරයෙන් එම රටේ ජනතාවගේ නීත්‍යානුකූල ආයතනයන්ගේ මැදිහත්වීමෙන්, රාජ්‍යතාන්ත්‍රික වශයෙන් විසඳාලිය යුතු බවයි. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශ අංක 2254 සහ 2268 අනුව ක්‍රියාකළ යුතු බවයි.

මීට අමතරව ඔවුහු එක්සත් ජාතීන්ගේ සංවිධානයේද ප්‍රතිසංස්කරණයන් කළ යුතු යැයි යෝජනා කළහ. එහිදී විශේෂයෙන් ආරක්ෂක මණ්ඩලය තුළ මීට වඩා වැඩි නියෝජනයක් සැදිය යුතු යැයිද එය වඩා ප්‍රතිඵලදායී සහ කාර්යක්ෂම විය යුතු යැයිද යෝජනා කර තිබුණි. එහිදී ඔවුහු සිය ධුර කාලය අවසන් කරන බෑන්කී මූන්ටද අභිනව එක්සත් ජාතීන්ගේ මහ ලේකම් ඇන්තෝනියෝ ගුටරේටිස්ටද සුභ පැතූහ.

මෙම ප්‍රකාශය මගින් BRICS සංවිධානයේ නව සංවර්ධන බැංකුව මගින් ලබාදීමට යෝජිත පළමු ණය ලබාදීම අනුමත කර තිබුණි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහිද ප්‍රතිසංස්කරණ කළ යුතු යැයි යෝජන කළ මෙම සමුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විධායක මණ්ඩලයේ යුරෝපා සංගමය දරන තනතුරු දෙක අත්හරින ලෙසටද ඔවුන්ට යෝජනා කළේය. තවද මෙම ප්‍රකාශනය මගින් චීන මුදල් ඒකකය වන රෙන්මින් ජාත්‍යන්තර මුදල් ඒකකයක් ලෙස නම් කිරීම පිළිබඳව සිය සතුට පළකර තිබුණි. එසේම එක්සත් ජනපදය විසින් අත්සන් කිරීමට බලාපොරොත්තුවන TPP සහ TTIP ගිවිසුම්වලට අසතුට ප්‍රකාශ කළ මෙම ප්‍රකාශනය WTO සංවිධානයේ එකඟතාවන්ට අනුව කටයුතු කරන ලෙසද ඉල්ලා සිටියේය.

BRICS සංවිධානයේ නව වන සමුළුව, 2017 වසරේදී චීනයේ පැවැත්වීමටද මෙහිදී තීරණය විය.

චීනයේ හා රුසියාවේ මැදිහත්වීමෙන් ක්‍රියාත්මක වන BRICS සංවිධානය මූලික වශයෙන්ම ආර්ථිකමය සංවිධානයක් වුවද ලෝක දේශපාලන බල තුලනයේදී වැදගත් කාර්ය කොටසක් ඉටු කරයි. විශේෂයෙන් එක්සත් ජනපද හා යුරෝපා හවුලට එරෙහිව බහු කේන්ද්‍රීය ලෝකයක් වෙනුවෙන් පෙනී සිටී.

## කියුබාව වෙනුවෙන් ඓතිහාසික ඡන්දයක්

කියුබාව මෙවර එක්සත් ජාතීන්ගේ සංවිධානයේදී පෙර නොවූ විරූ ජයග්‍රහණයක් අත්කර ගත්තේය. ඒ කියුබාව මගින් එක්සත් ජනපදයේ ඒක පාර්ශ්වික සම්බාධකවලට එරෙහිව ගෙන ආ යෝජනාව වෙනුවෙන් පැවැත්වූ ඡන්දයේදීය. එහිදී සියලුම රටවල් කියුබාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ. විරුද්ධව එක් හෝ ඡන්දයක් නොලැබූ අතර ඊශ්‍රායලයත් එක්සත් ජනපදයත් ඡන්දය දීමෙන් වැළකුණි. ඡන්ද ප්‍රතිඵලය වූයේ, කියුබාවට පක්ෂව ඡන්ද 191ක්, විරුද්ධව 0 සහ ඡන්දය දීමෙන් වැළකී සිටීම 02 ලෙසය.




## බ්‍රිතාන්‍යය මන්දපෝෂණයේ

මහා බ්‍රිතාන්‍යයේ මහජන සෞඛ්‍ය පද්ධතිය 2015 වසරේදී පමණක් බ්‍රිතාන්‍යය තුළින් මන්දපෝෂණයෙන් පෙළෙන්නන් 16,000ක් හඳුනාගෙන තිබේ. මෙම සංඛ්‍යාව මීට වසර 10කට පෙරදී තත්වයට වඩා සිවු ගුණයක වැඩිවීමකි. මෙයට හේතුව ලෙස සඳහන් වී ඇත්තේ ඉහළ යන ආහාර මිලයි. දශකයකට අඩු කාලයක් තුළදී බ්‍රිතාන්‍යයේ ආහාර මිල ගණන් 12%කින් වැඩි වෙද්දී වැටුප් (මූර්ත) අගය 7%කින් පහළට වැටී ඇත.

ලිවර්පූල් සරසවියේ මහජන සෞඛ්‍ය පිළිබඳ මහාචාර්ය සහ මහජන සෞඛ්‍ය පීඨයේ උප සභාපති සයිමන් කේප්වෙල් පවසන්නේ ලෝකයේ 05වන පොහොසත්ම රටවන බ්‍රිතාන්‍යය දැන් වික්ටෝරියානු යුගයේ රෝගාබාධවලින් එනම් මන්දපෝෂණය, රිකට්ස්ය, ස්කර්වි ආදී රෝගවලින් පෙළෙන්නට පටන් ගෙන ඇති බවයි.

වාර්තා වූ මන්දපෝෂිත රෝගීන් අතරින් 900ක් පමණ ඒ හේතුවෙන් මරණයට පත්වීමට ඉඩ තිබූ අයයි. බ්‍රිතාන්‍යයේ මන්දපෝෂණය හේතුවෙන් රෝහල්ගත වන පිරිස මෙන් පස් ගුණයක් බාහිර රෝගී අංශයෙන් ඒ සඳහා ප්‍රතිකාර ලබාගන්නා බවත් පස් ගුණයක් පමණ දෙනා පුද්ගලික වෛද්‍ය මධ්‍යස්ථානවලින් ප්‍රතිකාර ලබා ගන්නා බවත් වාර්තා වේ.



## ගෝලීය උෂ්ණත්වය ඉහළට

මානව වර්ගයාගේ බිහිවීමෙන් පසු වාර්තා වන වැඩිම වායුගෝලීය කාබන් ඩයොක්සයිඩ් ප්‍රමාණය මේ වන විට වාර්තා වී තිබේ. ලෝක කාලගුණ සංවිධානය (WMO) ප්‍රකාශ කරන්නේ වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මිලියනයකට කොටස් 400ක් දක්වා ඉහළ ගොස් ඇති බවයි.

කාබන්ඩයොක්සයිඩ් වායුව ගෝලීය උණුසුම වැඩිකිරීමට හේතුවන ප්‍රධාන සාධකයයි. ගෝලීය උණුසුම වැඩිවීම නිසා ආපසු හැරවිය නොහැකි කාලගුණ විපර්යාසයන් රාශියක්ම ඇතිවේ. බරපතළම කාරණය වන්නේ වරක් මෙලෙස කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය වැඩිවූ පසු එය අඩුවීමට වසර දහස් ගණනක් ගතවීමයි.

ලෝක කාලගුණ සංවිධානයට අනුව එල්නිනෝ ක්‍රියාවලිය නිසා 2016 වසරේදීද වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය ඉහළ යා හැකිය. එබැවින් මීට එකම විසඳුම වන්නේ, කාබන්ඩයොක්සයිඩ් විමෝචන අඩු කිරීම සහ වනාන්තර එළිකිරීම නැවැත්වීමයි. මීට පෙර ලෝකයේ යම් යම් ස්ථානවල කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණය මිලියනයකට කොටස් 400කට ළඟා වුවද ලෝක පරිමාණයෙන්ම වෙනස් වූ පළමු අවස්ථාව මෙයය. කාර්මීකරණයට පෙර එනම් ධනවාදයට පෙර මෙම අගය මිලියනයකට කොටස් 278ක් විය.

වායුගෝලීය කාබන්ඩයොක්සයිඩ් ප්‍රමාණයෙන් කොටසක් සාගරය විසින් අවශෝෂණය කරගනු ලබන අතර කොටසක් ශාක විසින් ප්‍රභාසංස්ලේෂණයේදී අවශෝෂණය කර ගනී. කාබන්ඩයොක්සයිඩ් වායුව ප්‍රධාන වශයෙන්ම වායුගෝලයට නිදහස් වන්නේ පොසිල ඉන්ධන දහනයෙනි.



# කෝප් කමිටු වාර්තාව හෙළිකරන මහ බැංකු බැඳුම්කර මගඩිය

## කෝප් කාරක සභාවේ නිර්දේශ

2015-2016 යන වසර දෙක තුළදී ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදුකරන ලද බැඳුම්කර නිකුත් කිරීම්වලදී, අප පරීක්ෂාවට භාජනය කළ 2015 පෙබරවාරි 27වැනි දින ගනුදෙනුවේදී එවකට මහ බැංකුවේ අධිපතිව සිටි අර්ජුන මහේන්ද්‍රන් මහතා මැදිහත්වීමක් හෝ බලපෑමක් සිදුකළ බවට සාධාරණ සැකයක් ඇතිවිය හැකි ආකාරයේ සාක්ෂි හා කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

කාරක සභාව විසින් කරන ලද පරීක්ෂණ හා සාක්ෂි විභාග කිරීම්වලදී, ඇතැම් ගනුදෙනුවල උපරිම පාරදෘශ්‍යභාවය නොමැති බවද, එහිදී කටයුතු කළ ආකාරයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්වාසනීයත්වය පළුදු වී ඇති බවද යන්න පිළිබඳව සාධාරණ සැකයක් ඇතිවිය හැකි ආකාරයේ සාක්ෂි හෝ කරුණු කාරක සභාව ඉදිරියේ හෙළිදරව් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

එසේම, ඒ කාලයේ සිදුවී ඇති බැඳුම්කර ගනුදෙනු හරහා ප්‍රාථමික ගනුදෙනුකරුවන්ගෙන් එක් ආයතනයක් වන පර්පෙචුවල් ට්‍රෙෂරීස් ඉතා විශාල මූල්‍යමය ලාභ උපයාගෙන ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරයි.

එබැවින්,-

- එසේ මෙම ගනුදෙනුවලට වගකිව යුතු මහ බැංකුවේ නිලධාරීන් හා ආයතනයන්ට එරෙහිව පැනවිය යුතු දණ්ඩනයන් හා වෙනත් නියමයන් නිර්දේශ කිරීම සඳහාත්,
- එකී අයථා කටයුතු හේතුවෙන් රජයට හා මහජනතාවට සිදුවී ඇති අලාභය හෝ පාඩුව එකී වගකිව යුතු පුද්ගලයන්ගෙන් හෝ ආයතනවලින් අයකර ගත යුතු බව නිර්දේශ කරන අතර ඒ සඳහා අවශ්‍ය අධිකරණමය ක්‍රියාමාර්ග ගත යුතු බව කාරක සභාව අවධාරණය කරයි.
- එසේම, නිර්දේශිත දණ්ඩනයන් හෝ වෙනත් නියමයන් අවශ්‍ය අයුරින්ම ක්‍රියාත්මක වන බව සොයා බැලීම සහ සහතික කිරීම සඳහාත්, ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහාත්,
- එමෙන්ම, එබඳු ආකාරයේ කටයුතු මින් ඉදිරියට සිදු නොවීම සඳහා අවශ්‍යයෙන්ම ගත යුතු සියලු පියවර, ආවේක්ෂණ හා තුළනයන් ක්‍රියාත්මක කිරීම සඳහාත්,
- එකී ආවේක්ෂණ හා තුළනයන් මහ බැංකුව විසින් නිසි පරිදි ක්‍රියාවේ යොදවන බවට සොයා බැලීම සහ සහතික කිරීම සඳහාත්, ඒ පිළිබඳව පසු විපරම් කිරීම සඳහාත්,

පාර්ලිමේන්තුව සෘජුව මැදිහත් විය යුතු අතර එය පාර්ලිමේන්තුව සතු රාජ්‍ය මූල්‍ය පාලනයට අදාල මූලික වගකීම බව කාරක සභාව අවධාරණය කරයි.



එසේ ක්‍රියාත්මක කිරීමෙන් රජයට සිදුවූ අලාභයන් අයකර ගැනීම සහ පවතින නීති යටතේ ක්‍රියාත්මක වීම පාර්ලිමේන්තුව සතු වගකීමක් ලෙස ඉතා ඕනෑකමින් කාරක සභාව නිර්දේශ කරයි. එසේම යළි එවැනි තත්වයක් ඇතිවීම වැළැක්වීමට පියවර ගැනීම ශ්‍රී ලංකා මහ බැංකුව තුළ සහ ඊට අනුෂාංගික අනෙකුත් ආයතන තුළ සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක වීම එම ආයතන විසින් පාර්ලිමේන්තුවට සහතික විය යුතු බව කාරක සභාව අවධාරණය කරයි,

එසේම,

රටේ මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සඳහා වගකිව යුතු ප්‍රධානතම ආයතනය වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ටෙන්ඩර් නිකුත් කිරීම් හා ප්‍රදානය කිරීම්වලදී ඒ පිළිබඳව කටයුතු අධීක්ෂණය කිරීම සඳහා අවශ්‍ය සියලු පසු විපරම් කිරීම සඳහාත් විධායකය මගින් විශේෂ නිරීක්ෂණ කණ්ඩායමක් වහාම පත්කළ යුතු යැයිද කාරක සභාව නිර්දේශ කරයි.

1. මහ බැංකුවේ නිලධාරීන් විසින් එක් තනි ආයතනයක් ලෙස පර්පචුවල් ට්‍රෙෂරීස් ආයතනයට අයථා වාසියක් ඉපැයීමට හැකිවන ලෙස කටයුතු කිරීමටත් එසේම ප්‍රාථමික ගනුදෙනුකරුවෙකු ලෙස අදාළ ආයතනයද එම වාසි ලබාගැනීමේ අරමුණ සහිතව ක්‍රියාත්මක වීමත් මහ බැංකුවේ මූල්‍ය පාලනයේ විනිවිදභාවය හා විශ්වාසනීයත්වය සඳහා බරපතල ලෙස අහිතකර තත්වයක් වන බැවින් එම තත්වය පිළිබඳව නීතිමය බලය සහිත පිළිගත් ආයතනයකින් පුළුල් විමර්ශනයක් කිරීමත් නැවත එවැනි තත්වයක් ඇතිවීම වැළැක්වීමට ගත හැකි සියලු පියවර ගැනීමත් නිර්දේශ කරයි.

2. බැඳුම්කර ක්‍රියාවලිය හරහා රටට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමේදී රජයේ හදිසි මූල්‍ය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි රාජ්‍ය මූල්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතු බව නිර්දේශ කරන කාරක සභාව, ඒ සඳහා ප්‍රතිපාදන සලසන වගන්ති මහ බැංකුවේ මෙහෙයුම් අත්පොත ඇතුළු අනෙකුත් අදාළ ලේඛනවලට ඇතුළත් කළ යුතු යැයි මහ බැංකුවට නිර්දේශ කරයි.

3. මෙම ප්‍රශ්නගත බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය ප්‍රාථමික ගනුදෙනුකරවෙකු ලෙස ඉතා කෙටි කාලයක් තුළ අධික ලාභයක් උපයා ඇති අතර එසේ ලාභ ඉපැයීමේ ක්‍රියාවලිය පිළිබඳ පූර්ණ බලැති යාන්ත්‍රණයක් මගින් පරීක්ෂණයක් කළ යුතු අතර එමගින් ඔවුන්ගේ කටයුතු හරහා මහ බැංකුවට හා රජයට මූල්‍යමය පාඩුවක් සිදුවී ඇත්දැයි ඉතා කඩිනමින් අනාවරණය කර ගැනීම මහ බැංකුවේ වගකීමක් ලෙස කාරක සභාව තරයේ විශ්වාස කරයි.

4. ඉදිරියේදී මෙවැනි මූල්‍ය අක්‍රමිකතා ඇතිවීම වැළැක්වීම සඳහා ප්‍රාථමික වෙළෙඳුන්ගේ වෙළඳපොළ කටයුතු සහ ද්විතීයික වෙළඳපොළ ක්‍රියාකාරිත්වය පිළිබඳ පසු විවරණය කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම නිර්දේශ කරන අතර එමගින් මහ බැංකුව රජයේ මූල්‍ය අවශ්‍යතා සඳහා මූල්‍ය සම්පාදනය සිදුකරන ආකාරය පසු විපරම් කිරීමේ හැකියාව ලැබෙනු ඇත.

5. මේ දක්වා යාවත්කාලීන නොකරන ලද රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තමේන්තු මෙහෙයුම් අත්පොත වහාම යාවත්කාලීන කළ යුතු අතර, එහි බැඳුම්කර හරහා රජයට මූල්‍ය සම්පාදනය කිරීමේදී එසේ මූල්‍ය සම්පාදනය කළ හැකි රාජ්‍ය ආයතන සඳහා ප්‍රමුඛතාවය දීමේ ප්‍රතිපාදන ඇතුළත් කළ යුතු බව නිර්දේශ කරයි.

6. මෙම ප්‍රස්තුත බැඳුම්කර ගනුදෙනුව සඳහා හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතා සෘජුවම වගකිව යුතු අතර ඔහුට සහ මහ බැංකුවේ අදාල නිලධාරීන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කරයි.

7. මෙවැනි ගනුදෙනුවලදී විනිදභාවය සහ මහ බැංකුවේ විශ්වාසනීයත්වය ආරක්ෂා කිරීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් සැකසීම සහ දැනට පවත්නා විනිමය කොමිෂන් සභා පනත ඇතුළු නීති-රීති අන පනත් කඩිනමින් සංශෝධනය කළ යුතු බව නිර්දේශ කරයි.

ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වැනි වගන්තිය ප්‍රකාරව රාජ්‍ය මූල්‍ය පාලනය සම්පූර්ණයෙන්ම පැවරී ඇති මෙම උත්තරීතර පාර්ලිමේන්තුව වෙත, කාරක සභාවට මෙතෙක් ඉදිරිපත් වී ඇති සියලු ලේඛන, තොරතුරු හා සාක්ෂි (එකී ඇතැම් තොරතුරු සංවේදී යැයි ප්‍රකාශ වුවද) ඉතා ඉක්මනින් ඉදිරිපත් කිරීම කාරක සභාවේ දැඩි වගකීමක් බවද කාරක සභාව විශ්වාස කරයි.

එම වගකීමට අනුව මෙම නිර්දේශ සහ විගණකාධිපතිවරයාගේ නිර්දේශ හා නිගමන සහිත වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන අතර මෙම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් පසු පාර්ලිමේන්තුව තුළ ඒ පිළිබඳව විවෘත සංවාදයක් ඇතිකළ යුතු බවටත් කාරක සභාව නිර්දේශ කරයි.



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
අටවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සැසිවාරය)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක 109

2015 පෙබරවාරි සිට 2016 මැයි මස දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරන ලද භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුවලදී සිදුවී ඇති මූල්‍ය අක්‍රමිකතා සොයාබැලීම සඳහා විශේෂ කාරක සභාවක් වශයෙන් කටයුතු කළ

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ

වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්

2016 ඔක්තෝබර් මස 28 වැනි දින
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.



"මධ්‍යතනවාදය සමග සංසන්දනය කරන කල ධනපති ප්‍රජාතන්ත්‍රවාදයෙන් මහා ඓතිහාසික ඉදිරිගමනක් සලකුණු වන නමුත්, එට කවදත් සීමාකළ, කප්පාදුකළ, ව්‍යාජ සහ වංචනික ප්‍රජාතන්ත්‍රවාදයක්ද, ධනපතියන්ට පරාදීසයක් සහ සූරාකනු ලබන්නන්ට, දුප්පතුන්ට උගුලක් හා රැවටිල්ලක්ද වූයේය. ධනපති ක්‍රමය යටතේ එය එසේම පැවතීම නොවැළැක්විය හැකිය."

**ලෙනින්,**
**වෙළුම 9,**
**23 පිටුව**

## විගණකාධිපති විශේෂ විගණන වාර්තාවේ නිගමන

(i). විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දෙනු ලැබූ වළක්වාගත හැකිව තිබූ රු.889,358,050ක ඇස්තමේන්තුගත අවාසිය සහ එහි 5.2.3 ඡේදයේ දැක්වෙන වළක්වා ගත හැකිව තිබූ රු. 784,898,755ක ඇස්තමේන්තු ගත අවාසිය ලෙස 2015 පෙබරවාරි 27 සහ 2016 මාර්තු 29 දින පැවති භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි දෙකේදී වළක්වා ගැනීමට හැකිව තිබූ එකතුව රු. 1,674,256,805ක ඇස්තමේන්තුගත අවාසිය වළක්වා ගැනීමට කටයුතු නොකිරීම පිළිබඳව බලධාරීන් වගකිවයුතු බව නිගමනය කරනු ලබයි.

තවද, සෘජු ක්‍රමයට භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවීමට තීරණය ගත් 2015 පෙබරවාරි 27 දින සිට 2016 මැයි මාසය දක්වා සිදුකර ඇති බැඳුම්කර නිකුත් කිරීම්වලට අදාළවද ඇස්තමේන්තුගත අවාසිය තවදුරටත් ඉහළයාමේ හැකියාවක් පැවැතීමද බැහැර කළ නොහැකි බව නිගමනය කරනු ලබයි.

(ii). මෙම වාර්තාව සැකසීමේ දී විගණකාධිපති වෙත අනාවරණය වූ කරුණු සහ ඉහත සඳහන් ඡේදවලින් අවධාරණය කර ඇති කරුණු අනුව මහ බැංකු අධිපතිවරයෙකුගෙන් අපේක්ෂා කරනු ලබන මට්ටමේ වෘත්තීමය විචක්ෂණභාවයකින් (Professional Due Care) යුතුව කටයුතු කර ඇති බව තහවුරු නොවූ බව නිගමනය කරනු ලබයි.

(iii). මෙම වාර්තාව පිළියෙල කිරීමේදී විගණකාධිපති වෙත හිමි බලතල හා විෂය සීමාව තුළ කටයුතු කර ඇති බව අවධාරණය කරනු ලැබේ. ඉන් ඔබ්බට සාපරාධී හෝ විගණකාධිපතිට නිගමනය කළ නොහැකි මට්ටමේ නීති විරෝධී කටයුතු සිදු වී ඇත්දැයි යන්න මෙහිදී පරීක්ෂාවට ලක් නොවුණු හෙයින් එවන් පරීක්ෂාවක් අවශ්‍යය යැයි හැඟී යන්නේ නම් ඒ සඳහා විශේෂිත වූ ආයතනයන්හි සහය ලබා ගැනීම සුදුසු බව නිගමනය කරනු ලබයි.

## ඉල් මතක...

හබල බින්ද මුත් ජයගොස ගිගුම් දිදී
දුබල නොවුණ සිත් තිබුණා නොසෙල්වෙවී
පබල නුඹට සම නොවුණත් සැකක් නැතී
ඔරුව, මහ නැවකි බෝ නියමුවන් ඇතී

බීර පෙණ නැගුණු සීතල විමන් යට
සාද කතා පිනවයි දකිමින් සිහින
ලන්සු තබන මුත්, උන් නුඹෙ අභිමනට
අලෙවි නොවන පාඩම මතකයි අපිට

හොරකම් හොරෙන් කරමින් හොරු රකින්නේ
පැරණිම සිංදුවයි අදටත් වැයෙන්නේ
කෝලම්කාරයින් අත්වැල් ගයන්නේ
සගයිනි, නුඹෙ අඩුව රටටයි දැනෙන්නේ

සොයුරෙකු, පියෙකු, ලෙන්ගතු මිතුරෙකු ලෙසට
නුඹ අප ළගම ජීවත් වෙයි මතු දිනද
හරි මග දකින්නට කිසි සැකයක් නැතිව
නෙත් දුන් මහඟු මිනිසා නුඹමය සොයුර

සීතල ඉල්මහේ ළය උණුසුම් කරන
සම් ඇට නහර හා ලේ මස් තුළ දුවන
හෙට ගොඩ නගන ලෝකය සවිමත් කරන
රතු ලෙය නුඹම මිස වෙන කිසිවෙක් නොවන





# පහර දිය යුත්තේ ඇයටද?

පසුගිය මාසයේ අගභාග යේදී මැදපෙරදිග රටවල නීති සිහිගන්වන ආකාරයේ ඉතා කනගාටුදායක සිදුවීමක් පුත්තලමින් අසන්නට ලැබිණි. ඒ, ලිංගික අතවරයකට ලක් වූ මුස්ලිම් කාන්තාවකට දඬුවමක් ලෙස පොල් පිති පහර සියයකට ලක්වන්නට සිදුවීමකි. මෙසේ පොල් පිති පහර දඬුවම නියෝග කර ඇත්තේ පුත්තලමේ එක්තරා මුස්ලිම් පල්ලියක පරිපාලන සභාවේ සිව්දෙනෙකු විසින් බවද ඔවුන් මේ වනවිට රක්ෂිත බන්ධනාගාරගත කළ බවද පැවසේ.

මේ සිදුවීම අනාවරණය වූයේ එම කාන්තාව නිහඬව නොසිට නීතිඥයකු මාර්ගයෙන් පොලීසියේ පැමිණිල්ලක් කළ බැවිනි. මෙවැනි සිදුවීම්වලින් යළි අපට සිතන්නට බල කෙරෙන දෙයක් ඇත. ඒ, වර්තමානයේ තවමත් අප ජීවත් වන්නේ ශිෂ්ට සම්පන්න ලෝකයකද යන්නය.

ලොව පැරණිම නීති පද්ධතිය ලෙස සැලකෙන්නේ හමුරාබි නීතියයි. අතීතයේ පැවැති අත් පා කැපීම වැනි දඬුවම් සහිත නීති රීති වෙනුවට ශිෂ්ට සම්පන්න ලෝකය අනුමත කරන නව නීති රීති මාලාවන් සම්මත කරගෙන ඇත්තේ පෙර ඒවායේ තිබූ අඩුලුහුඬුකම්, දුර්වලතා හේතුවෙනි. එහෙත් අතීතයේ තිබූ නීති අණ පනත්වලට සමාන ආකාරයේ නීති අණ පනත් වර්තමානයේදීත් ඇතැම් රටවල් තුළ ආගමික පදනමින් හෝ වෙනත් පදනමකින් තවමත් ක්‍රියාත්මක වීම ඛේදජනකය. ජාත්‍යන්තර මානව හිමිකම් සංවිධාන විසින් මානව අයිතීන් වෙනුවෙන් කොතෙක් නීති රෙගුලාසි සකස් කර තිබුණද ඒ වෙනුවෙන් පෙනී සිටියද මෙවැනි සිදුවීම් හමුවේ නැවත පසක් කරලන්නේ මානව අයිතීන් උල්ලංඝනය වන ආකාරයේ සමාජීය සාධක මුළුමනින්ම ඉවත් කිරීමට මෙතෙක් හැකියාවක් ලැබී නොමැති බව නොවේද?

මෙසේ අසාධාරණයට හා පීඩනයට ලක් වන ජන කණ්ඩායම් පමණක් නොව විශේෂිත සමාජ පාර්ශ්වයන් අද පමණක් නොව අතීත සමාජයන් තුළදීද අපට හමුවේ. වහල් හිමි සමාජයේ වහලුන්ද, වැඩවසම් සමාජයේ ප්‍රවේණිදාසයන්ද එසේ තම අයිතීන් අහිමි කරනු ලැබූ පංතීන්ය. ඉතිහාසයේ තිබූ එවැනි සමාජ ක්‍රම පෙරළා දමා ධනපති ක්‍රමය ස්ථාපිත වූයේ සමාජය පෙරට වඩා ශිෂ්ට සම්පන්න කරන බව පවසමිනි.

කෙසේ වෙතත් තමන් ශිෂ්ට යැයි කියාගන්නා ධනපති ක්‍රමය තුළත් ධනපති පංතිය මගින් පොදුවේ නිර්ධන පංතිය පීඩනයට ලක්කොට ඇතිවා සේම සමාජය තුළ සිටින කාන්තාවන් හා ළමුන් වැනි විශේෂිත ජන කොටස්ද හිංසනයට හා පීඩනයට ලක් වෙමින් සිටී. එහිම දිගුවක් ලෙස අපට ඉහත සිදුවීමද ගත හැක.

ලෝකය තුළත්, ලංකාව තුළත් ඒ සම්බන්ධයෙන් ඇති සංඛ්‍යාලේඛන දෙස බැලූ විට එම තත්වයේ බරපතළකම හොඳින් වැටහේ. ලෝකය තුළ සෑම විනාඩි 2.5කදී කාන්තාවක් ලිංගිකව දූෂණයට ලක්වන බවත් සෑම විනාඩියකදීම ළමා අපචාරයක් සිදුවන බවත් අධ්‍යයනවලින් හෙළි වී ඇත. අප රට තුළද සෑම විනාඩි 90කදී කාන්තාවක් ලිංගික දූෂණයකට ලක්වන බව හෙළි වී ඇත. තවද කාන්තාවන්ට හා ළමුන්ට එරෙහිව සිදු වන ලිංගික අපරාධ හා හිංසනයන් වසරින් වසර වර්ධනය වෙමින් තිබෙන බව නිකුත් වන සංඛ්‍යාලේඛන දෙස බැලූ විට පෙනේ.

රට තුළ තත්වය මෙතරම් බරපතළ වුවද අදාළ බලධාරීන්ගේ ඇස් තවමත් මේ සම්බන්ධයෙන් යොමු නොවීම රටේ අවාසනාවකි. කුමන ආගමකට අයත් වුවද කාන්තාවන් හා ළමුන්ගේ අයිතීන් සම්බන්ධයෙන් දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කළ යුතු තත්වයක් තිබියදීත් ඒවා ක්‍රියාත්මක වන්නේ ඉබි ගමන් විලාසයකිනි. ඒ බව මෙවැනි අපරාධ සම්බන්ධයෙන් ලක්ෂ ගණනින් ගොනු කර ඇති පැමිණිලි හා නඩු විභාගවලින්ද ඒවායින් මෙතෙක් දඬුවම් ලැබී ඇති සංඛ්‍යාත්මකව ඉතා සුළු අපරාධකරුවන්ගේ ප්‍රමාණයෙන්ද අවබෝධ කරගත හැක.

මෙයින් ප්‍රකට වන සත්‍යය නම් සමාජ ප්‍රශ්නයක් බවට පත් වී ඇති කාන්තා, ළමා අපරාධ හා හිංසනයන් සම්බන්ධයෙන් අදාළ බලධාරීන් ප්‍රමාණවත් අයුරින් මැදිහත් නොවන බවය. අපරාධ දෙස බලා හූල්ලමින් නිහඬව සිටීමෙන් හෝ ඒවා පිළිබඳව කතා කිරීමෙන් පමණක් ඵලක් නොවනු ඇත. මෙවැනි අපරාධ සිදුවීමේ ප්‍රවණතාවයක් සහිත සමාජ වටපිටාව අප තේරුම් ගැනීම වැදගත්ය. ආර්ථික වශයෙන් පරිහානියට පත් වූ සමාජයක අනෙකුත් ක්ෂේත්‍ර සේම සදාචාරය පිරිහීමද නොවැළැක්විය හැකිය. එනිසා සමාජය තුළ සිදුවන කාන්තා හා ළමා ලිංගික අපරාධ වැළැක්වීම සඳහා කාන්තාවන් ලෙස අපටද යම් කාර්යභාරයක් ඇත. ඒ, පොල් පිති පහර ගැසිය යුතු වැරදිකරුවන් නිවැරදිව හඳුනා ගැනීමය. එසේ හඳුනාගෙන අපටත් අපගේ අනාගත පරපුරටත් අයිතිවාසිකම් ලැබෙන යහපත් සමාජයක් බිහි කරලීමේ උදාර කර්තව්‍යයට අපගේ දායකත්වයද ලබාදීමය.

## සිව්දෙසින

### අසමාන වැටුපට එරෙහිව වීදි බසී!

අයිස්ලන්තයේ වැඩ කරන කාන්තාවන් ලිංගිකත්වය මත පදනම්ව අසමාන වැටුප් ගෙවීමට එරෙහිව එරට අගනුවර ප්‍රධාන චතුරස්‍රයට දහස් ගණනින් රැස්ව උද්ඝෝෂණයක නිරත වුණි.

ඔක්තෝබර් 25 දින අයිස්ලන්ත කාන්තාවන් පස්වරු 2.38ට සිය රැකියා ස්ථානවලින් බැහැරව මෙසේ සිය විරෝධය පළ කරන ලදි.

අයිස්ලන්තයේ පිරිමින් උපයනවාට වඩා කාන්තාවන් තවමත් උපයන්නේ 14%-18%ක් අඩුවෙන් බවත් පැය 8 සෑම වැඩ දිනකම පස්වරු 2.38 සිට ගෙවීමකින් තොරව කාන්තාවන් වැඩ කරන බවත් ඔවුන් පවසයි.

මීට පෙර 2005, 2008 වසරවලදීද ලිංගිකත්වය මත පදනම් වූ අසමාන වැටුප් පරතරයට එරෙහිව ඔවුන් විරෝධතාවල යෙදිණි.



### කාන්තා හිංසනයට එරෙහිව...

ආජන්ටිනාවේ කාන්තාවන්ට සිදුවන හිංසනයට එරෙහිව ඔක්තෝබර් 19 වන දින එරට බුවනෝස් අයර්ස් නගරයේ ප්ලාසා ඩි මායෝ ඓතිහාසික චතුරස්‍රයට කාන්තාවන් දස දහස් ගණනින් රැස්ව විරෝධතාවක යෙදුණි.

පසුගිය මාසයේ 16 හැවිරිදි පාසල් ශිෂ්‍යාවක් ලිංගික දූෂණයකට ලක්කර මරා දැමීම හේතු කරගෙන මෙම විරෝධතාව සිදුකළ අතර ආජන්ටිනාව තුළ කාන්තාවන්ට හා ළමුන්ට එරෙහි හිංසනය වර්ධනය වෙමින් පවතින සමාජ ගැටලුවක්ව පවතින බව ඔවුන් පවසයි.

කාන්තාවන්ට එරෙහිව සිදුවන අපරාධ හේතුවෙන් සෑම පැය 30කට වරක් ආජන්ටිනාවේ කාන්තාවක් මිය යන බව අධ්‍යයනවලින් හෙළි වී ඇත.



# ලෝකය විවිධත්වයේ ඒකත්වයක් ලෙස

සමස්ත ප්‍රකෘතියත් එහි සිදුවන සිදුවීම් හා ක්‍රියාකාරකමුත් නිවැරදිව වටහා ගැනීමට අත්‍යාවශ්‍ය වන අධ්‍යයනයේ පොදු ආකාර 6ක් ගැන මාක්ස්වාදය උගන්වයි. ඒවා මෙසේය,

1. විශ්වීයත්වය, විශේෂිතය සමඟ හුදකලාව
2. අඩංගුව හා ආකාරය
3. හරය හා පෙනුම
4. හේතුව හා ඵලය
5. අනිවාර්යය හා අහම්බය
6. හැකියාව හා තාත්විකත්වය

එම ආකාර හය වේ. යමක් නිවැරදිව වටහා ගැනීමේදී ඒ දෙස මෙම ආකාර හය මගින්ම හෝ ඉන් කිහිපයක් මගින් බැලීමෙන් අදාළ දෙය පිළිබඳ වඩාත් නිවැරදි දැනුමක් ඇතිකර ගැනීමට හැකිවේ. අපගේ චින්තනය තුළ වන දැනුම සත්‍ය වන්නේ එවිටය. නැතිනම් අපේ චින්තනය සාවද්‍ය වේ. මෙම කරුණු එකින් එක බැලීමෙන් ඉන් අදහස් වන දේ තේරුම් ගැනීමටත් එම ක්‍රමවේදය හරහා ලෝකය අවබෝධ කර ගැනීමට පුරුදුවීමටත් අයෙකුට හැකි වේ.

**විශ්වීයත්වය, විශේෂිතය සමඟ හුදකලාව**

මෙම ආකාරය මගින් උගන්වනු ලබන්නේ එක් අතකින් අප දැනුම ඇතිකර ගන්නා අකාරයත් අනෙක් අතින් ලෝකය තුළ දේවල් පවතින ආකාරයත්ය. අප අවට සිදුවන දේ හෝ අප අවට පවතින අපගේ පංචේන්ද්‍රියයන් මගින් ග්‍රහණය කරගන්නා දේවල් 'දැනුම' දක්වා සංවර්ධනය වන්නේ මෙම රටාව අනුවය. කිසියම් කෙනෙක් හැම විටම කිසියම් වස්තුවක් ක්‍රියාකාරකමක් හෝ සිදුවීමක් සංජානනය කරයි. නැතිනම් පංචේන්ද්‍රියයන් මගින් ග්‍රහණය කර ගනී. එහිදී ලබාගන්නා මුල් සංවේදනය හුදකලාව හෙවත් තනි එකක් වේ. ඉන්පසු වහාම එහි පොදු ලක්ෂණ සහිත පොදු සංකල්පය ඇතිකර ගනී. එය විශ්වීයත්වය වේ. නැතිනම් පොදු දැනුම වේ. ඉන් පසු අදාළ දෙය පිළිබඳ විශේෂ දැනුම සඳහා අධ්‍යයනය කිරීම හා තර්ක කිරීම අවශ්‍ය වේ. විශේෂ කරුණු හෝ අදාල වස්තුව අනෙක් වස්තුන්ගෙන් වෙනස්වන ආකාරය හෙවත් එහි විශේෂය යමෙක් තේරුම් ගන්නේ අධ්‍යයනය ක්‍රියාවලියක් මගිනි.

මෙය උදාහරණයකින් පැහැදිලි කර ගන්නේ නම් මෙසේය. කෙනෙක් ගසක අත්තක වසා සිටින කුරුල්ලෙකු දැක්කේ යයි සිතන්න. එම කුරුල්ලා හුදකලා වස්තුවක් වේ. හුදකලාව හෙවත් තනි එක ලෙස හඳුන්වන්නේ එයයි. ඒ වහාම ඒ 'කුරුල්ලෙක්' යන පොදු සංකල්පයට අදාල පුද්ගලයා එළඹේ. එය පොදු දැනුම හෙවත් විශ්වීයත්වය වේ. එහිදී කුරුල්ලන්ගේ පොදු ලක්ෂණ පමණක් සැලකිල්ලට ලක්වේ. එහෙත් මෙම කුරුල්ලා කුමන වර්ගයේද යන්න තේරුම් ගැනීමට, ඒ ගැන වැඩි දැනුමක් ලැබීමට ප්‍රජානනය හෙවත් අධ්‍යයනය හා තාර්කික ක්‍රියාවලියක් අවශ්‍ය වේ. පොදුවේ කුරුලු යන පොදු වර්ගය තුළ මේ කුරුල්ලා කවුද යන්න වටහා ගැනීම විශේෂිතයට ළංවීමක් වේ. එවිට එම කුරුල්ලාගේ විශේෂ ලක්ෂණ වටහා ගන්නා අතර කුරුල්ලන්ට පොදුවේ අදාළ පොදු ලක්ෂණ මෙන්ම මෙම කුරුල්ලා කුමන වර්ගයේද යන්නට අදාළ විශේෂ ලක්ෂණ අපේ චින්තනය තුළ පරාවර්තනය වේ. මෙය මිනිසා, පොත, ගස, සර්පයා, එළවළු, පළතුරු ආදී සියලු දේට අදාළය. ඒ අනුව කෙනෙක්ගේ චින්තනය තුළ දැනුම නිර්මාණය වන ක්‍රමය වන්නේ ජීවමාන සංජානනය හෙවත් යම් දෙයක් (හුදකලාව) සංජානනය කිරීම ඒ පිළිබඳ පොදු සංකල්පය (විශ්වීයත්වය) ඇතිකරගැනීම හා ඉන්පසු අධ්‍යයනය ක්‍රියාවලිය මගින් එහි විශේෂ ලක්ෂණ (විශේෂිතය) අවබෝධ කර ගැනීම නැමති රටාවට අනුව වේ.

**ප්‍රකෘතිය පවතින හැටි**

ප්‍රකෘතිය හෙවත් අප අවට ලෝකය පවතින්නේ හුදකලා වස්තූන් ලෙසම නොවේ. එසේත් නැත්නම් පොදු තනි ලෝකයක් ලෙසටත් නොවේ. එය පවතින්නේ විවිධත්වයේ ඒකත්වයක් ලෙසය. එසේම ඒකත්වය තුළ විවිධත්වයක් ලෙසය. ලෝකය තේරුම් ගත හැක්කේ එසේය. එහිදී ඕනෑම තනි තනි සිදුවීමක් තනි වස්තුවක් 'හුදකලාව' ලෙස සැලකේ. ඒ අතර එම වර්ගයේ විශේෂ ලක්ෂණ ඇති වස්තු 'විශේෂය' ලෙස සැලකෙන අතර එහි ඇති පොදු ලක්ෂණ සහිත සියල්ල පොදු දෙය හෙවත් 'විශ්වීයත්වය' වේ.

උදාහරණයක් ලෙස කැලෑව යන සංකල්පය ගනිමු. කැලෑවක් යනු ගස් වැල්වල එකතුවකි. අධ්‍යයනයේදී කැලෑව යනු පොදු දෙය හෙවත් විශ්වීයත්වයයි. එම කැලෑවේ ඕනෑම තනි ගසක් හෝ තනි වැලක් 'හුදකලාව' නියෝජනය කරයි. ඊළඟට එහි ඇති විවිධ ගස් වර්ග එනම් පොල්, දෙල්, කිතුල්, ආදී වර්ග 'විශේෂිතය' නියෝජනය කරයි. මෙය බැලූ බැල්මට සරල වුවද චින්තනය තුළ සත්‍යමය දැනුම ගොඩ නැගීමේදී මෙම වෙනස්කම් ඉතාම තීරණාත්මක වේ. අප පළතුරු ගැන කතා කරමු. පළතුරු යනු පොදු සංකල්පයකි.

ලෝකයේ පැවැත්මේ මෙම ස්වරූපය වටහා ගත නොහැකි වුවහොත් ලෝකය අවබෝධ කර ගැනීමේදී බරපතළ වැරදි සිදුවේ. ධනවාදී අධ්‍යාපන ක්‍රමය තුළ හා තර්කන ක්‍රමය තුළ මෙම වැරදි වටහා ගැනීම නිතර සිදුවේ. පොදුවේ ගත්විට ලෝකය පවතින්නේ, පොදු දේවල් හා ඒ තුළ වන විශේෂයන් ලෙසය. ලෝකය මේ ආකාර දෙකෙන්ම තේරුම් ගත යුතුය.

එනම් එය යමක පැවත්මේ විශ්වීයත්වය නියෝජනය කරයි. එහෙත් පළතුරු යන පොදු සංකල්පය සෑදී තිබෙන්නේ විශේෂිතයන්ගෙනි. ඒවා නම් අඹ, පේර, අන්නාසි, පේර, දෙළුම්, නාරං, දොඩම්, ඇපල් ආදී ලෙසය. ඉන්ද තනි ගෙඩියක් ගත් විට එය 'හුදකලාව' නියෝජනය කරයි. මෙම උදාහරණය ලෝකයේ සමාජ ක්‍රම හා සසඳා බලන විට විට තවමත් මෙහි පොදු දෙය ලෙස පවතින්නේ ධනවාදී සමාජ ක්‍රමය වේ. ඒ අතර සමාජවාදී රටවල් විශේෂය වේ. ඉන් එක් රටක් වෙනම ගත් කල එය හුදකලාව වේ.



**ගස් නොදැක කැලෑව දැකීම**

ලෝකයේ පැවැත්මේ මෙම ස්වරූපය වටහා ගත නොහැකි වුවහොත් ලෝකය අවබෝධ කර ගැනීමේදී බරපතළ වැරදි සිදුවේ. ධනවාදී අධ්‍යාපන ක්‍රමය තුළ හා තර්කන ක්‍රමය තුළ මෙම වැරදි වටහා ගැනීම නිතර සිදුවේ. පොදුවේ ගත්විට ලෝකය පවතින්නේ, පොදු දේවල් හා ඒ තුළ වන විශේෂයන් ලෙසය. ලෝකය මේ ආකාර දෙකෙන්ම තේරුම් ගත යුතුය. පොදු දේවල් තුළ විශේෂයක් නොදැකීම මෙන්ම විශේෂයන් පොදු දේවල් ලෙස දැකීමද වැරදිය. කැලය දකින තැනැත්තා ඒ තුළ ගස්ද දැකිය යුතු අතර එම ගස්වල විශේෂයන්ද දැකිය යුතුය. ගස් නොදැක කැලය පමණක් දැකීම යනු වැරදි දැනුමක් ඇතිකර ගැනීමකි. එස්ම තනි ගසක් යනු කැලයක් නොවන බවද තේරුම් ගත යුතුය. කැලය නිර්මාණය වී ඇත්තේ තනි තනි ගස්වලින් හා විවිධ වර්ගයේ ගස්වැල් විශේෂයන්ගෙන් වන අතර කැලය නම් පොදු දෙය හෙවත් විශ්වීයත්වයන් ගස් නම් විශේෂ හා තනි ගසක් ලෙස එය තේරුම් ගත යුතුය.

මෙහිදී සිදුවිය හැකි වටහා ගැනීමේ වැරදි ක්‍රමය මෙලෙස තේරුම්ගත හැකිය. කිසියම් කැලෑවකට යමෙක් ඇතුල්වන විට ඔහු මුලින්ම ගසක් හෝ ගස් කිහිපයක් දකී. ඔහු මුලින්ම ඇතදීම දකින ගස අඹ ගසක් ලෙස සිතමු. එම ගස දැකීම සමඟ ඔහු මේ කැලෑවම අඹ කැලෑවක් ලෙස උපකල්පනය කළහොත් එය ඔහුගේ චින්තනය තුළ දැනුම වැරදියට පරාවර්තනය වීමක් වේ. මේ කැලෑවක් බවත් එය සෑදී තිබෙන්නේ විවිධ ගස් වැල් වර්ගවලින් බවත් අඹ යනු එහි එක් විශේෂයක් යනුවෙනුත් වටහා ගත්විට එය නිවැරදි වේ. මෙහි අනෙක් පැත්තද තිබේ. යමෙක් කැලෑව දුටුවද ඒ තුළ වන විශේෂයන් ලෙස අඹ ගස් දැකීමට අසමත් නම් එම දැනුමද සත්‍ය නොවේ. කැලෑව දකින තැනැත්තා එහි ඇති ගස්ද දැකිය යුත්තේ ඒ නිසාය.

මෙලෙස කෙනෙක් පළතුරු කෑවා යයි කියන විට පළතුරු මොන රසදැයි ඇසුවොත් ඔහු විමතියට පත්වේ. ඒ පළතුරු යනු පොදු සංකල්පයක් වන නිසාය. අප පළතුරු කෑවා යයි කියන්නෙ පළතුරු නැමති පොදු සංකල්පයට අයත් අඹ, කෙසෙල්, අන්නාසි, දොඩම් වැඩි දේවල් අනුභව කර තිබෙන නිසාය. ඒ නිසා ඔබ පළතුරු අනුභව කර නැති බවත් අනුභව කර ඇත්තේ අඹ, කෙසෙල්, , පැපොල් ආදී වර්ග බවත් කියා තර්ක කිරීමටද කෙනෙකුට හැකිය. එය වැරදි තර්කයක් වුවත් එවැනි තර්කයක් තිබේ. ඉන් පැහැදිලි වන්නේද ඒකත්වය සෑදී ඇත්තේ විවිධත්වය මගින් බවය.

**මිනිසුන් වටහා ගැනීමේදී**

පොදු දේ හා විශේෂය වැරදි ලෙස වටහා ගැනීමෙන් සිදුවිය හැකි හානි තේරුම් ගැනීමට මිනිසා වෙතම හැරෙමු. මිනිසුන් තේරුම් ගැනීමේදී බොහෝ විට බොහෝ දෙනා වරද්දා ගන්නා බව පොදු සත්‍යයකි. මිනිසුන් තුළ හොඳ හා නරක ගතිගුණ යන වර්ග දෙකම තිබේ. සමහරුන් තුළ හොඳ වැඩියෙන් හා නරක අඩුවෙනුත් සමහරුන් තුළ නරක වැඩියෙන් හා හොඳ අඩුවෙනුත් තිබිය හැක. එහෙත් හොඳම හා නරකම ලෙස මිනිසුන් පැතලි, කළු, සුදු ලෙස වර්ග කළ නොහැක. දැන් ගැටලුව ඇතිවන්නේ කෙසේද? අපට කෙනෙක් මුණ ගැසුණු විට අප මුලින්ම ඔහුගේ හොඳක් දුටු වහාම මේ 'හොඳ මිනිහෙකි' යනුවෙන් අවසන් නිගමනයක් දීම හෝ අපට කෙනෙක් හමුවුණ විට අප මුලින්ම ඔහුගේ නරකක් දුටු නිසා මේ 'නරක මිනිහෙක්' යනුවෙන් අවසන් නිගමනයක් දීම හරිද? නැත. අපේ බොහෝ දෙනා මෙම වැරැද්ද

02 වැනි පිටුවට



"ධනපතින්ට එදිරිව තම විමුක්තිය සඳහා කම්කරු පංතිය ගෙනයන අරගලයේදී ප්‍රජාතන්ත්‍රවාදය අති විශාල තේරුමක් ගෙන දෙයි. එහෙත් ප්‍රජාතන්ත්‍රවාදය වූකලී පසුබා යා නොහැකි සීමාවක් නොවේ. රදළවාදයේ සිට ධනපතිවාදය දක්වා යන මාර්ගයේ සහ ධනපතිවාදයේ සිට කොමියුනිස්ට්වාදය දක්වා යන මාර්ගයේත් අවධි වලින් එකක් පමණකි ප්‍රජාතන්ත්‍රවාදය."

**ලෙනින්,**
**රජය හා විප්ලවය,**
**110 පිටුව**

# විකුණන, බිලිදෙන ප්‍රතිපත්තිය හමුවේ

# දේශීය ආදායම් සේවාවේ හෙට දවස

රාජ්‍ය ආදායම, බදු ආදායම සහ බදු නොවන ආදායම ලෙස කොටස් දෙකකි. මුළු රාජ්‍ය ආදායමින් 89% ක් පමණ බදු ආදායම වන අතර, ඉතිරිය බදු නොවන ආදායම ලෙස ලැබේ. රාජ්‍ය බදු ආදායම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, රේගු දෙපාර්තමේන්තුව හා සුරා බදු දෙපාර්තමේන්තුව යන ප්‍රධාන ආයතන තුන මගින් පරිපාලනය කෙරේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රජයේ මුළු ආදායමින් 40% ක් පමණ එකතු කරනු ලබයි.




රජයේ මුළු බදු ආදායම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය (රු. බිලියන)

| වර්ෂය | මුළු රාජ්‍ය ආදායම | රජයේ මුළු බදු ආදායම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ දායකත්වය | මුළු බදු ආදායමේ ප්‍රතිශතයක් ලෙස දේශීය ආදායම් දායකත්වය |
|---|---|---|---|---|
| 2010 | 834.2 | 724.7 | 422.5 | 58.3% |
| 2011 | 983.0 | 845.7 | 443.8 | 52.5% |
| 2012 | 1067.5 | 908.9 | 443.4 | 48.8% |
| 2013 | 1153.3 | 1005.9 | 492.5 | 49.0% |
| 2014 | 1204.6 | 1050.4 | 514.1 | 49.1% |
| 2015 | 1460.9 | 1355.8 | 526 | 39.1% |

රාජ්‍ය බදු ආදායමින් වැඩි පංගුවක් එකතු කරන ආයතනයක් ලෙස දේශීය ආදායම් සේවාවද රාජ්‍ය ආයතන විකිණීමේ ආණ්ඩුවේ ආර්ථික උපාය මාර්ගය හමුවේ අර්බුදයට පත්ව තිබේ. වර්තමාන ආණ්ඩුවේ ආර්ථික උපායමාර්ගය හා දේශපාලන න්‍යාය පත්‍රයට අනුව මෙම ආයතනය හසුරුවා ගැනීම සඳහා ආණ්ඩුව ආකාර කීපයකින් ක්‍රියාත්මක වෙමින් සිටී.

එක් අතකින් බදු එකතු කිරීමේ කටයුතු විදේශීය සමාග මකට පැවරීමටත් අනෙක් පැත්තෙන් දේශීය ආදායම් සේවාවේ බඳවාගැනීමේ පටිපාටියට පරිබාහිරව දේශපාලන පත්වීම් 1500ක් ලබාදීමටත් කටයුතු කරමින් සිටී. එසේම, දැනට බදු පරිපාලනය සඳහා පවතින 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත අහෝසි කොට ඊනියා නව පනත් කෙටුම්පත් දෙකක් සැකසීම හරහා ඇමතිවරයාගේ බලතල අසීමිත ලෙස වැඩිකර ගැනීමට උත්සාහ කරමින් සිටී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන බදු කටයුතු මැකෙන්සි නැමැති විදේශීය සමාගමට (Mckensy and company) පැවරීම සඳහා මේ වනවිට ගිවිසුම් අත්සන් කොට ඇති අතර ඒ සඳහා කැබිනට් අනුමැතිය පවා ලබාගෙන ඇති බව ප්‍රකාශ වේ. බදු පැනවීම තුළින් ආදායම් උපයා ගැනීම ආණ්ඩුවේ ප්‍රධාන ආදායම් උපයන ක්‍රමවේදය බවට පත්කර ගෙන ඇති තත්වයක් තුළ ආණ්ඩුවේ නාස්තිකාර වියදම් පියවා ගැනීම වෙනුවෙන් ජනතාව වෙත කුමන හෝ පීඩාවක් එල්ල කොට හෝ තම ඉලක්කය සපුරා ගැනීම මෙහි මූලික අරමුණ වී ඇත. එසේම, මෙම සමාගම සමඟ ඇතිකරගෙන ඇති එකඟතාව මත බදු කටයුතුවලට මැදිහත් වීම වෙනුවෙන් මසකට රුපියල් මිලියන 23 (රු. ලක්ෂ 230ක) මුදලක් ගෙවීමට එකඟ වී ඇති අතර, කොමිස් මුදල් ලෙස 10%ක ප්‍රතිශතයක් ගෙවීමටද යෝජනා වී ඇත. රටේ ජනතාව පීඩාවට පත්කරමින් එකතු කරන බදු මුදල් රටේ ජනතාවගේම සුබසාධන වෙනුවෙන් යොදවනවා වෙනුවට විදේශීය සමාග ම්වලටත් ඒ හරහා දේශපාලන බලවතුන්ගේ සාක්කුවලටත් ගලායාමට මේ මගින් ඉඩකඩ සලසා ඇත.

එසේම, විදේශීය සමාගම්වලට බදු එකතු කිරීමට ඉඩකඩ සලසා දීම මගින් බදු ගෙවන්නන්, බදු පදනම සහ ආර්ථිකයට අදාළ රහස්‍ය තොරතුරු මෙම සමාගම් අතට පත්වීම ජාතික ආරක්ෂාවටද දැඩි තර්ජනයක් වීම වැළැක්වීමට නොහැකි වනු ඇත. අනෙක් අතට රටේ බදු ආදායම විදේශ රටවලට ඇදී යාම මගින් පවතින ආර්ථික අර්බුදය තව තවත් උග්‍රවීම අනිවාර්යයක් බවට පත්වනු ඇත.

දේශීය ආදායම් සේවාවේ බඳවා ගැනීම් පටිපාටියට පිටින් 1500ක පිරිසක් බඳවාගැනීමටද ආණ්ඩුව මේ වනවිට සැලසුම් සකස් කරමින් සිටී. රාජ්‍ය ආයතනයකට බඳවා ගත යුත්තේ ගැසට් මගින් ප්‍රකාශයට පත්කොට විධිමත් ක්‍රමවේදයකට අනුවය. දේශීය ආදායම් සේවයටද එසේමය. නමුත්, තම දේශපාලන හෙංචයියන්ගෙන් මෙම ආයතන පිරවීමට සැලසුම් කරන්නේ, තම දේශපාලන වුවමනාව මුදුන් පමුණුවා ගැනීමට බව පැහැදිලිය. රැකියා ලබාදෙන බව පුරසාරම් දොඩා ආණ්ඩුව රට තුළ රැකියා උත්පාදනය නොකර පවතින ආයතන පද්ධතිය විනාශකොට තම

> "මෙම සමාගම සමඟ ඇතිකරගෙන ඇති එකඟතාව මත බදු කටයුතුවලට මැදිහත් වීම වෙනුවෙන් මසකට රුපියල් මිලියන 23 (රු. ලක්ෂ 230 ක) මුදලක් ගෙවීමට එකඟ වී ඇති අතර, කොමිස් මුදල් ලෙස 10%ක ප්‍රතිශතයක් ගෙවීමටද යෝජනා වී ඇත. රටේ ජනතාව පීඩාවට පත්කරමින් එකතු කරන බදු මුදල් රටේ ජනතාවගේම සුබසාධන වෙනුවෙන් යොදවනවා වෙනුවට විදේශීය සමාග ම්වලටත් ඒ හරහා දේශපාලන බලවතුන්ගේ සාක්කුවලටත් ගලායාමට මේ මගින් ඉඩකඩ සලසා ඇත."

හිතවතුන්ට රැකියා දෙන ප්‍රතිපත්තියක් වෙත තල්ලු වී තිබේ. මෙම පත්වීම් මගින් බදු එකතු කරන ආයතන තම දේශපාලන අවශ්‍යතාවයන්ට අනුකූලව හසුරුවා ගැනීම පහසු වේ. මෙමගින් තම දේශපාලන හා ව්‍යාපාරික හිතවතුන්ගෙන් බදු අය නොකර සිටීමටත් විරුද්ධවාදීන් පීඩාවට පත්කොට බදු අයකිරීමටත් ඉඩකඩ විවර කර ගැනෙනු ඇත.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු කටයුතු සිදුවන්නේ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතිනි. මෙම පනත අනුව ආයතන ප්‍රධානියා පත්කිරීම කැබිනට් මණ්ඩලයටත් අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් පත්කිරීමේ බලය රාජ්‍ය සේවා කොමිෂන් සභාවටත් හිමිව තිබේ. නමුත්, වර්තමාන ආණ්ඩුව මෙම පනත අහෝසි කොට 'දේශීය ආදායම් පනත 2016' සහ 'ආදායම් පරිපාලන පනත 2016' ලෙස නව පනත් කෙටුම් පත් දෙකක් සකසා ඇත. එමගින් පැවති පනත දෙකඩ කොට අයතන ප්‍රධානියා සහ මාණ්ඩලික නිලධාරීන් පත්කිරීමේ බලය ඇමතිවරයා වෙත පවරාගෙන ඇත. ඊට අමතරව බදු කටයුතු පිළිබඳ ඊනියා උපදේශකයන්, නියෝජිතයින් සහ විශේෂඥයින් ඇතුළු තමන්ට අවශ්‍ය දේශපාලන ගජ මිතුරන් පත්කර ගැනීමේ බලයද මෙම පනත් කෙටුම්පත් මගින් ලබාගැනීමට කටයුතු කොට තිබේ. එසේම, සේවක ප්‍රජාව මෙතෙක් භුක්ති විඳි සියලු සුබසාධන වරප්‍රසාද කප්පාදු කොට තිබේ.

මේ අනුව, තත්වය පැහැදිලිය. ආණ්ඩුවේ වුවමනාව කෙසේ හෝ එදා දවස ගැටග සාගෙන ආණ්ඩුව දුවවන්නටය. ඒ වෙනුවෙන් නිවැරදි දැක්මක්, හැකියාවක් පැවති ආණ්ඩුවට මෙන්ම මේ ආණ්ඩුවටද නැති බව සක්සුදක් සේ පැහැදිලිය. ඉතිරිව ඇත්තේ විකිණීම සහ බිලිදීම පමණි. රාජ්‍ය ආයතනවල සේවක ප්‍රජාවට, ජනතාවට හෝ රටට කවර අහිතකර තත්වයක් ඇතිවුවද ආණ්ඩුවට එහි වගකීමක් නොමැත. බදු මූලධර්ම, ජාතික ආරක්ෂාව, රාජ්‍ය සේවයේ ස්වාධීනත්වය ආදී කිසිවක් ආණ්ඩුවේ ආර්ථික උපායමාර්ග සහ දේශපාලන වුවමනාවන් හමුවේ වැදගත් සාධක ලෙස නොගැනේ.

මෙම තත්වය දේශීය ආදායම් සේවාවට පමණක් අදාළ කරගත යුතු නොවේ. හෙට දවසේ වෙනත් ඕනෑම ආයතනයක් තම ආර්ථික වුවමනාව හමුවේ බිලිදෙනු ලැබිය හැක; විකුණනු ලැබිය හැක. එමගින් රටටත් ජනතාවටත් අත්වන සෙතක් නොමැති අතර, ආර්ථිකය තව තවත් අර්බුදයට යාමත්, ජන ජීවිතය තවත් දුෂ්කර වීමත් පමණක්ම මින් සිදුවන අනිවාර්ය ප්‍රතිඵලය වේ. එබැවින්, රාජ්‍ය ආයතන විකිණීම, බිලිදීම මගින් රටත් ජන ජීවිතයත් අර්බුදයෙන් අර්බුදයට පත්කරන මෙම වැරදි ආර්ථික ක්‍රමවේදය සහ එහි නියමුවන් එකවිට පරාජය කිරීම මගින් ඉහත ජන පීඩක ක්‍රියාමාර්ග වළක්වා ගැනීම සඳහා රටේ ජනතාව ලෙස පෙරට පැමිණිය යුතු බව මෙමගින් නැවත නැවතත් පසක් කරන සත්‍යයම බව අවධාරණය කරගත යුතු වෙමු.



15වැනි පිටුවට

ජනතා විමුක්ති පෙරමුණේ මහජන නියෝජිතයින් විසින් පළ කළ අදහස් වෙනුවෙන් නියමුවා වේදිකාව වෙන්වෙයි.

2016 ඔක්තෝබර් 05

# තේ,රබර් අපනයනකරුවාගෙන් ගන්නා සෙස් බද්දත් ආණ්ඩුව කොල්ලකනවා

## පාර්ලිමේන්තු මන්ත්‍රී නලින්ද ජයතිස්ස සහෝදරයා

(අපනයන සංවර්ධන පනතේ සංශෝධන පිළිබඳ විවාදයට එක්වෙමින්)



රබර් සඳහා වන අපනයන සෙස් බද්ද රුපියල් 15 සිට රුපියල් 4 දක්වා අඩු කිරීමට අද යෝජනා කර තිබෙනවා. එහි පරමාර්ථය බවට පත් වෙලා තිබෙන්නේ දේශීය රබර් අපනයනකරුවන් දිරි ගැන්වීමයි. කාලයකදී අපේ රටේ ප්‍රධාන අපනයන මාර්ග බවට පත් වෙලා තිබුණේ තේ, රබර් සහ පොල් විශේෂයෙන් කළුතර ගාල්ල, රත්නපුර, වැනි දිස්ත්‍රික්කවල රබර් කර්මාන්තය ඉතාම වේගයෙන් ව්‍යාප්ත වෙලා තිබුණා.

ඒ විතරක් නොවෙයි. එක්තරා කාලයකදී රටේ දේශපාලන බලය හෙබවීම සඳහාත් මහා පරිමාණ රබර් වතු අයිතිකරුවන් ප්‍රවිෂ්ට වුණා. මට මතකයි, අපේ රටට නිදහස් අධ්‍යාපන පනත හඳුන්වා දීපු කන්නන්ගර මැතිතුමා 1947 මැතිවරණයේදී මතුගම ආසනයෙන් පරාජය වෙලා, එතුමා වෙනුවට රාජ්‍ය මන්ත්‍රණ සභාවට තේරුණේ පස්දුන් කෝරළයේ හිටපු " රබර් රජ්ජුරුවෝ." රටටම නිදහස් අධ්‍යාපනය දුන්නු කෙනාට වඩා, රටට කොතරම් බලපෑමක් කරන්න රබර්වලට පුළුවන් වුණාද කියන එක එදා දේශපාලනයෙන් ඔප්පු වුණා.

"1983දී අපි රබර් කිලෝග්‍රෑම් මිලියන 125ක් අපනයනය කර තිබෙනවා. 2015 වර්ෂය වනකොට එය කිලෝග්‍රෑම් මිලියන 10 දක්වා අඩු වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් මත ඉතාම වේගයෙන් රබර් ඉඩම් කුට්ටි කරන කොට, රබර් නිෂ්පාදකයා රබර් වගාවෙන් ඈත් වනකොට ආණ්ඩුවේ වගකීම තමයි, මේ සෙස් බද්ද පාවිච්චි කරලා ඒ නිෂ්පාදකයා යම් කාලයක් ආරක්ෂා කර ගැනීම."

අද වන කොට ගත්තොත්, රබර් කර්මාන්තය කඩාගෙන වැටිලායි තිබෙන්නේ. මේ වෙන කොට රබර් කිලෝ එකක මිල ආසන්න වශයෙන් රුපියල් 205, 210 මට්ටමට කඩාගෙන වැටිලා තිබෙනවා. මීට කලින්, දින සියයේ ආණ්ඩුව තිබෙන කාලයේ නොම්මර 1 සහ 2 රබර් සඳහා රුපියල් 350 ගණනේ සහනාධාර ලබා දුන්නා. හැබැයි, ඊට වසර හය හතකට කලින් රබර් කිලෝ එකට රුපියල් 600, 625 ලැබුණු කාලයකුත් තිබුණා. අද වන කොට ඒ මිලෙන් තුනෙන් පංගුව දක්වා - රුපියල් 200, 210 - රබර් කිලෝ එකක මිල බැහැලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මීට කලින් රුපියල් 300ට තිබුණු ඔට්ටපාලු කිලෝ එකක් රුපියල් 70ට, 75ට බැහැලා තිබෙනවා. ඒ නිසාම, අපේ දිස්ත්‍රික්කයේ පමණක් ඔට්ටපාලු කර්මාන්තශාලා 20කින් දැන් වැඩ කරන්නේ තුනයි. රබර් වගා කරපු ජනතාව දැන් කිරි කපන එක අත හැරලායි තිබෙන්නේ. ගස් නඩත්තු කිරීම, වල් පැළ ගැලවීම, පොහොර දැමීම -මේ සියල්ල- අත හැරලා දැන් රබර් ගස් ගලවන්න පටන් අරගෙන තිබෙනවා.

ඇත්තටම ලෝකයේ ඕනෑම ආණ්ඩුවක් සෙස් බද්දක් ක්‍රියාත්මක කරන්නේ, එවැනි අර්බුදකාරී අවස්ථාවකදී නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්නයි. සෙස් බද්ද කියන්නේ භාණ්ඩාගාරයට අරගෙන ඒක ආණ්ඩුවේ ආදායමක් ලෙස සලකන බද්දක් නොවෙයි. සෙස් බද්ද පනවන්නේම නිෂ්පාදකයා අර්බුදයකට ගියාට පස්සේ, ඒ නිෂ්පාදකයා ආරක්ෂා කර ගැනීමේ අරමුණෙන්.

මේ වනකොට ලෝක වෙළෙඳ පොළේ රබර් මිලේ පහළ යෑමක් තිබෙන බව අපි දන්නවා. හැබැයි, රබර් මිල පහළ යනකොට රබර් ගොවියා ආරක්ෂා කර ගන්න නම්, එවැනි සහනාධාරයක් අනිවාර්යයෙන් රබර් ගොවියාට ලබා දිය යුතුයි. දැන් මේ ප්‍රශ්නයට වියට්නාමය මුහුණ දීලා තිබෙනවා; තායිලන්තය මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා ඒ ආණ්ඩු වසර දෙක-තුනක කාලයක් තිස්සේ කරන්නේ රබර් ගොවියාට සහනාධාරයක් ලබා දීලා, ඒ රබර් වගාකරුවන් යම් ප්‍රමාණයකින් ක්ෂේත්‍රයේ රඳවා ගන්න එකයි. අපේ රටේ වර්තමානයේ බලයේ සිටින ආණ්ඩුවත් මැතිවරණය කාලයේ පොරොන්දුවක් දුන්නා. රබර් කිලෝවක් රුපියල් 300ට, 350ට ගන්නවා කියාලා. නමුත්, රබර් කිලෝවකට රුපියල් 300ක් ලැබුණේ පසුගිය අවුරුද්දේ ජුනි මාසය වන තෙක් පමණයි. එතැනින් එහාට පුළුවන් ප්‍රමාණයකට කර ගන්න කියලා දැන් රුපියල් 200ට රබර් කිලෝවක මිල පහළ දමා තිබෙනවා. දැන් අපි ඇත්තටම ආණ්ඩුවට යෝජනා කරන්නේ, මේ මොහොතේ රබර් වගාව ආරක්ෂා කර ගන්න මේ සෙස් බද්ද ප්‍රයෝජනයට ගන්න කියලායි.

ආසියානු කලාපයේ ඉස්සෙල්ලාම රබර් වගාව කරපු රට තමයි අපි. ඒ නිසාම ලෝකයේ රබර් අපනයනය කරන රටවල් අතරින් හයවන ස්ථානයත්, ලෝකයේ රබර් නිෂ්පාදනය කරන රටවල් අතරින් අටවන ස්ථානයත් අපට හිමි වෙලා තිබුණා. හැබැයි, ලෝකයේ රබර් නිෂ්පාදනයට අපේ දායකත්වය සියයට 1.8 යි. අපි මුලින්ම රබර් වගාව පටන් ගත්තාට, ආසියානු කලාපයේත් අපි ඉන්නේ පිටුපසින්. දැන් ලෝකයේ රබර් නිෂ්පාදනයෙන් සියයට 95ක් කරන්නේ ආසියානු කලාපයෙන්. අප්‍රිකානු කලාපයෙන් කරන්නේ සියයට 5යි. ආසියානු කලාපයේ සියයට 95නුත්, අපේ පංගුව, දායකත්වය ඉතා සොච්චමයි. මෙහෙම තත්ත්වයක් තමයි තිබෙන්නේ. ඒ නිසා ඓතිහාසිකව බලද්දී මේ වනකොට රබර් කර්මාන්තය කඩා වැටෙමින් තිබෙනවා.

මගේ ළඟ තිබෙන සංඛ්‍යාලේඛන අනුව, 1983දී අපි රබර් කිලෝග්‍රෑම් මිලියන 125ක් අපනයනය කර තිබෙනවා. 2015 වර්ෂය වනකොට එය කිලෝග්‍රෑම් මිලියන 10 දක්වා අඩු වෙලා තිබෙනවා. මෙවැනි තත්ත්වයක් මත ඉතාම වේගයෙන් රබර් ඉඩම් කුට්ටි කරන කොට, රබර් නිෂ්පාදකයා රබර් වගාවෙන් ඈත් වනකොට ආණ්ඩුවේ වගකීම තමයි, මේ සෙස් බද්ද පාවිච්චි කරලා ඒ නිෂ්පාදකයා යම් කාලයක් ආරක්ෂා කර ගැනීම.

මේ සන්තෑසියම තමයි තේ වගාවටත් වෙලා තිබෙන්නේ. තේ වගාවට ගහන සෙස් බද්ද කිලෝ එකට රුපියල් 13.50ක් වෙලා තිබුණා. මගේ මතකයේ හැටියට 2003 වර්ෂය දක්වා ඒ බදු ආදායම කෙළින්ම තේ මණ්ඩලයට ගියා. ඒ හරහා තේ සහනාධාරයක්, තේ වගාකරුවන්ට යම් සහනයක් ලබා දුන්නා. හැබැයි, එතැන් සිට ඒ බද්ද ගියේ භාණ්ඩාගාරයට. පසුගිය දිනවල නවීන් දිසානායක ඇමතිතුමා මාධ්‍යවලට කියනවා අපි දැක්කා, "භාණ්ඩාගාරයේ තිබෙන තමන්ට නියමිත කොටස දුන්නේ නැත්නම්, ආණ්ඩුවෙන් යනවා" කියලා. තේ වගාවට අදාළව පමණක් රුපියල් මිලියන 65කට ආසන්න ප්‍රමාණයක සෙස් බද්දක් මේ වනකොට භාණ්ඩාගාරයේ තිබෙනවා. මේ වෙලාවේ එම මුදල් යොදවන්න ඕනෑ ආණ්ඩුවේ ආර්ථික අර්බුදය ක්ෂණිකව පියවා ගන්න නොවෙයි. තේ වගාව ආරක්ෂා කර ගන්න නම්, කුඩා තේ වතු හිමියාට ඒ සෙස් බද්දේ සහනය දිය යුතුයි. නමුත්, එවැනි දේකට වඩා රටේ එදා වේල පිරිමහ ගන්නා තත්වයක් තමයි අද අපි දකින්නේ. දැන් මේ රට මෙතැනට පත් වෙලා තිබෙන්නේ ඇයි? රබර් අපනයනකරුවාගෙන් ගන්නා සෙස් බද්දත් කොල්ල කන, තේ අපනයනකරුවාගෙන් ගන්නා සෙස් බද්දත් කොල්ල කන තැනකට රට පත් වෙලා තිබෙනවා.

2016 ඔක්තෝබර් 06

# මේ රටේ මිනිස්සුන්ගෙ ඉඩම් ප්‍රශ්න දශක ගණන් දිග්ගැහිලා

(ඉඩම් අත්පත් කරගැනීමේ පනතේ සංශෝධන පිළිබඳ විවාදය)

## පාර්ලිමේන්තු මන්ත්‍රී බිමල් රත්නායක සහෝදරයා



දැනට රටේ මැනුම් කටයුතු කෙරෙන්නේ අපේ රටේ පරණම දෙපාර්තමේන්තුව වන මිනින්දෝරු දෙපාර්තමේන්තුව මගින්. ඒ වාගේම පෞද්ගලික දේශීය මිනින්දෝරුවන් මගින්. දැනට රජය මගින් මේ මැනුම් කටයුතු කරනවා. විශේෂයෙන්ම බිම් සවිය ව්‍යාපෘතියට අදාළව කරන මැනුම් කටයුතු සහ පොදුවේ කරන මැනුම් කටයුතු විදේශීය පෞද්ගලික සමාගමකට ලබා දෙන්නට යනවාය කියන ප්‍රශ්නය පිළිබඳව මිනින්දෝරුවන් අතරත්, පොදුවේ රටේ ජනතාව අතරත් සාකච්ඡාවට ලක්වෙමින් පවතිනවා.

දැනට දැන ගන්න තිබෙන විධියට මෙය ගුවන් මඟින් රටේම භූමිය මනින, සිතියම් කරන ව්‍යාපෘතියක්. මගේ දැනීමේ හැටියට ඩොලර් මිලියන 127ක් වාගේ විශාල මුදලකට තමයි මේක ලබා දෙන්න යන්නේ. ඒ නිසා අපි බල කර කියා සිටිනවා, මේ ගැන සොයා බලන්නය කියා. එකක් තමයි, අසීමාන්තික මුදලක් මේ සඳහා වැය කිරීම. මා හිතනවා, අමාත්‍යාංශයේ නිලධාරීන්ට මෙයින් හතරෙන් පංගුවකට, පහෙන් පංගුවකට වාගේ මේක කරන්න පුළුවන්කම ඇති කියලා. අනෙක් පැත්තෙන් රටේ මැනුම් කටයුතු පෞද්ගලික විදේශීය සමාගම්වලට ලබා දීමේ කිසිදු හදිසි අවශ්‍යතාවක් තිබෙනවායි කියලා අපි දකින්නේ නැහැ. එහෙම අවශ්‍යතාවක් අපි දකින්නේ නැහැ. මේකෙන් වෙන්නේ රටේ මුදල් නාස්ති කිරීමකුත්, ඒ වාගෙම ඉතාම වෘත්තීය මට්ටමක් තිබෙන මිනින්දෝරු දෙපාර්තමේන්තුව අකර්මණ්‍ය කිරීමත් පමණයි. ඒ නිසා ගරු ඇමතිතුමනි, මේක දැනට ලබා දීලා නැතිනම් ඉදිරියට ලබා දෙන්නත් එපාය කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම රත්නපුර දිස්ත්‍රික්කයේ දුම්බර කියන ප්‍රදේශයේ ඇති වී තිබෙන ඉඩම් ආශ්‍රිත සමාජ ගැටලුව සම්බන්ධයෙන් ඔබතුමාගේ විශේෂ අවධානයට යොමු කරන්න කැමැතියි. මේ කියන ඉඩම් ප්‍රමාණය අක්කර අටදහසකට ආසන්න ඉඩම් ප්‍රමාණයක්. මේවා බෞද්ධ විහාර දේවාලගම් පනත යටතට එන ඉඩම් නොවෙයි.

"වර්තමාන පාලනය බලයට එනකොට දුන් ප්‍රධාන ඡන්ද පොරොන්දුවක් තමයි, අම්පාර දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශයේ ජනතාවට මේ ඉඩම් නැවත ලබා දෙනවාය කියන එක. දැන් මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ? මේ ආණ්ඩුව ඒ ප්‍රදේශයේ සිටින දේශපාලන බලවතුන් එක්ක එකතු වෙලා අර පරණ රාජපක්ෂ පාලනය කරපු වැරැද්දම නැවත පානම ජනතාවට කරමින් ඉන්නවා."

ඔබතුමාගේ අමාත්‍යාංශයට අයත් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙනුත්, ඒ වාගේම බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවෙනුත් පැහැදිලිව සනාථ කර තිබෙනවා. මේ ඉඩම් කිසිම විහාරස්ථානයකට අයිති ඒවා නොවෙයි කියලා. මා මේ කියන අක්කර අටදහසක් පමණ සුවිශාල ඉඩම් ප්‍රමාණය එක්තරා ස්වාමීන් වහන්සේ නමක් තමන්ගේ බලහත්කාරය පාවිච්චි කරලා අල්ලා ගෙන. - ඒක බුද්ධාගමට සම්බන්ධ දෙයක් නොවෙයි. ඒකට විවිධාකාර ව්‍යාජ සන්නස් හදා ගෙන. ඉතාම අමාරුවෙන් ජීවත් වෙන ග්‍රාමීය ජනතාව සුවිශාල පීඩනයකට ලක් කර තිබෙනවා. ඔවුන්ට ඔප්පුවක් ලබා ගන්න පමණක් නොවෙයි. ඔවුන්ගේ ජන ජීවිතයට පවා මැර කණ්ඩායම් යොදා ගෙන, පොලිසියේ සමහර නිලධාරී මහත්වරු යොදා ගෙන තර්ජනය කරනවා. ගමේ මිනිසුන්ට ඉඩමට අදාළ කරන ඔප්පුව හෝ වෙනත් මොනවත් ලබා ගන්න බැරි වෙලාවකදී, ඒ ප්‍රදේශයේ ඉන්න පොලීසියේ ඉහළම නිලධාරීන්ට අක්කර 50, 150 දීලා තිබෙනවා. ඒ වාගේම විවිධාකාර මැර කණ්ඩායම් යොදා ගෙන මේ අහිංසක ගම්වාසින්ට තර්ජනය කරනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙන්, විශේෂයෙන් ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටින්න කැමැතියි, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස. මොකද, රටේ ඉඩම්වල අවසාන භාරකරුවා ජනාධිපතිවරයායි. ඒ නිසා රටේ ජනාධිපතිවරයාට වගකීමක් තිබෙනවා, රටේ අගමැතිවරයාට වගකීමක් තිබෙනවා, මේ ගැටලුව නිරාකරණය කිරීමට. මේක පැහැදිලිව ඉඩම් ප්‍රශ්නයක් සහ දේශපාලන ප්‍රශ්නයක්. මේක සමාජ ප්‍රශ්නයක්. සම්පූර්ණයෙන් එතැන දේශපාලන බලහත්කාරයකුයි තිබෙන්නේ. එතැන තිබෙන්නේ, සිළිඳු ගැන කියැවෙන 'බද්දේගම' නමැති පැරණි නවකථාවේ කියැවෙන කථාව වාගේ එකක්. අන්ත දුගී, අහිංසක මිනිස්සු වහල්ලු වශයෙන් සලකන සංඝයා වහන්සේ නමක් එතැන ඉන්නේ. ඒක බුද්ධාගමටත් කැලලක්. බුද්ධාගම කියන්නේ ඉඩම් ගොඩ ගසා ගන්නා ආගමක් නොවෙයිනේ. මේකට පොලිසියේ ඇතැම් ලොක්කෝ පවා සම්බන්ධයි. මේ කියන ස්වාමීන් වහන්සේ තමන්ගේ වැඩසටහන කර ගැනීමට අක්කර අටදහසින් අක්කර භාරපන්සියයක් බෙදනවා ප්‍රභූන්ට. බෙදලා අහිංසක මිනිස්සු යට කර ගෙන ඉන්නවා.

ඒ වාගේම තමයි අම්පාර දිස්ත්‍රික්කයේ 'පානම' ප්‍රදේශයේ ඇති ප්‍රශ්නය. මේ සාකච්ඡාවේදී 'පානම' ප්‍රදේශයේ ඇති ඉඩම් ප්‍රශ්නය විශාල වශයෙන් මතු වුණා. පසුගිය ආණ්ඩුව යම් කිසි දෙයක් හිතුවා නම්, එක කළා; දැක්කා නම්, ඒක කළා. නීතියක් බැලුවේ නැහැ. ඒ ගොල්ලන් සියලුම නීති කැඩුවා; ආයතන විනාශ කළා. රාජපක්ෂ ජනාධිපතිවරයා, ඔහුගේ පවුලේ උදවිය සහ ඊට ආසන්නව හිටපු කල්ලිය ඉඩම් පිළිබඳව කටයුතු කළේ තමන්ට ඕනෑ විධියටයි. ඒ ආකාරයට තමයි සංචාරක ව්‍යාපාරයට කියලා පානම ප්‍රදේශයේ තිබුණු සුවිශාල ඉඩම් අක්කර ප්‍රමාණයක් ඔවුන් අත්පත් කර ගත්තේ.

ඒ ප්‍රදේශයේ ජනතාව අවුරුදු ගණනාවක් තිස්සේ යුද්ධයෙන් බැට කෑවා. ඒ ප්‍රදේශයට ආසන්න ප්‍රදේශයක් නියෝජනය කරන මන්ත්‍රීවරයෙකු නිසා පානම ප්‍රදේශයේ ජීවත් වන්නේ කවුද කියලා මට වඩා හොඳට තමුන්නාන්සේ දන්නවා. 1818 උඩරට කැරැල්ලේදී සුදු අධිරාජ්‍යවාදීන් එක්ක යුද්ධ කරලා ඒ සුදු අධිරාජ්‍යවාදීන්ගේ මහා පරිමාණ ඝාතනවලට මුහුණ දිය නොහැකිව තමන්ගේ උපන් ගම් අත් හැරලා පලා ගිය සිංහල ජනතාව තමයි ඒ ප්‍රදේශවල ජීවත් වන්නේ. ඒ විධියට අවුරුදු 200කට කලින් තමන්ගේ උපන් භූමියෙන් පලවා හැරපු ජන කොටසක් තමයි, පානම ප්‍රදේශයේ ඉන්නේ. ඔවුන් ගත කරන්නේ ඉතා අමාරු ජීවිතයක්. කෘෂි කර්මාන්තය, පශු සම්පත් වාගේ දෙයක් පමණයි ඔවුන්ට තිබෙන්නේ. ඒ මිනිස්සුන්ට ගහලා බලහත්කාරයෙන් එළවා තමයි පසුගිය පාලනය හෝටල්වලට කියලා ඔවුන්ගේ ඉඩම් වෙන් කර ගත්තේ. වර්තමාන පාලනය බලයට එනකොට දුන් ප්‍රධාන ඡන්ද පොරොන්දුවක් තමයි, අම්පාර දිස්ත්‍රික්කයේ පානම ප්‍රදේශයේ ජනතාවට මේ ඉඩම් නැවත ලබා දෙනවාය කියන එක. දැන් මොකක්ද මේ ආණ්ඩුව කරන්නේ? මේ ආණ්ඩුව ඒ ප්‍රදේශයේ සිටින දේශපාලන බලවතුන් එක්ක එකතු වෙලා අර පරණ රාජපක්ෂ 15 වැනි පිටුවට

## කවුළුව හැරූ තබමි

# ඉතිහාසයේ ගැඹුරුම පාඩම!

එය එතෙක් නිදිගත් ලොව පුබුදු කළේය. මිනිස් වර්ගයාට නව මානවීය මාවතක් විවෘත කළේය. සමාජයේ රොඩු බොඩු ලෙස අහක දමා තිබූ මිනිසුන්ගේ ආත්මයන් දිරියෙන් අවුළුවාලූයේය. ලෝකයේ ඇති නැති පරතරය නැතිකර දැමීමට ප්‍රථම ප්‍රහාරය එල්ල කළේය. පරණ දින දර්ශනය අනුව එය ඔක්තෝම්බර් 23 සිදුවිය. නව දින දර්ශනය අනුව එය සිදු වුයේ නොවැම්බර් 07 දාය. මෙහිදී වැදගත් වනුයේ දිනය නොව සිදු වූ දෙයයි. එය ශ්‍රේෂ්ඨ රුසියානු සමාජවාදී විප්ලවයයි.

අද ඔක්තෝබර් විල්වය සිදුවූ රුසියාවේ සමාජවාදයක් නැත. ඊට හේතු වූ කරුණු වෙනම කථා කළ යුතු දෙයකි. එහෙත් සමාජවාදයේ අනිවාර්යභාවය රුසියාවේ සිදු වූ දෙයින් අකාමකා දැමිය නොහැක. සතුරා කොතරම් වලිකෑවද සත්‍යය එයයි. ඔක්තෝම්බර් විප්ලවය ශාස්ත්‍රීය පර්යේෂණයකට ලඝු කළ නොහැක. එය ඓතිහාසික ප්‍රවණතාවයකි. එහි පාඩම් අනාගතයටද ගලා යන්නේ දිනෙන් දින අලුත් වෙමිනි.

ඔක්තෝම්බර් විප්ලවය ඉක්මණින්ම දේශසීමා ඉක්මවා නොගියහොත් එය මුහුණ දෙන ඉරණම ලෙනින් කලින්ම පුරෝකථනය කළේය. ඔහුගේ මරණයෙන් පසු ඔක්තෝම්බර් විප්ලවයට නායකත්වය දුන් නායකයින්ගේ අඩුපාඩුකම්, ලෙනින්වාදයෙන් බැහැරවීම ඇතුළු අභ්‍යන්තර හා බාහිර හේතු රැසක් තුළ විප්ලවයේ සමස්ත වටිනාකම් පද්ධතියම ආපස්සට හැරවීමට කටයුතු කෙරිණි. ලෙනින් ජීවත්ව සිටි කාලය තුළම මෙම අනතුරු දැක තිබිණි. එහෙත් සතුරෙකුගේ වෙඩි පහරක් හේතුවෙන් ලද තුවාල ඔහුගේ මරණය ඉක්මන් කරවීය.



1917 වනවිට පක්ෂය දෘෂ්ටිවාදාත්මකව ප්‍රතිසන්නද්ධ කිරීමට ලෙනින් සමත් විය. එය පක්ෂය ලැබූ දැවැන්ත ජයග්‍රහණයකි. එහෙත් පසුකාලීනව ලෙනින් ප්‍රමුඛ බෝල්ෂෙවිකයන්ගේ ඉදිරි දැක්මෙන් පිටපිනූ පක්ෂයට අත්වූ ඉරණම සහ සමාජවාදී පාලනයට අත්වූ ඉරණම ලොවට කියාපාන්නේ, විප්ලවයේ ජයග්‍රහණය සඳහා පක්ෂය පංති නායකත්වය සහ වැඩපිළිවෙළ ජනනාත්මකව කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වුවහොත් සමාජවාදී රාජ්‍යයකට අත්වන ඛේදවාචකයය. කෙසේ වුවද පොව පළමු නිර්ධන පංති රාජ්‍යය නිර්මාණය කළ ඔක්තොබර් විප්ලවයේ වටිනාකම අවප්‍රමාණ නොවේ. කිසිවෙකුට කිසිලෙසකින්වත් ශ්‍රේෂ්ඨ ඔක්තෝම්බර් විප්ලවය ඉතිහාසයන් මකා දැමිය නොහැක.

# නොමැරෙන නොනිමෙන තරු!



"මිනිහා තනා තිබෙන්නේ පරාජයවීමට නොවෙයි. මිනිසෙකු විනාශකරන්න පුළුවනි. නමුත් පරාජය කරන්න බැහැ" මෙය අර්නස්ට් හෙමිංවේගේ 'මහල්ලා සහ මුහුද' නැමැත් කථාවේ මහල්ලාගේ මුවින් පිටවෙන වදන් පෙළකි.

ජනතාව වෙනුවෙන් සටන් වදින්නෝ සදා අමරණීය වෙති. ඔවුන් විනාශ කරනු ලැබිය හැක. එහෙත් මරා දැමිය නොහැකිය. අප මේ කථාකරන්නේද එවන් මිනිස් කැළක් පිළිබඳවය. ඔවුහු අන්කවරෙකුවත් නොව ඉල් මහා විරුවෝම වෙති. සතුරා ඔවුන් විනාශ කළෝය; පිළිස්සුවෝය. එහෙත් ඔවුන් කිසිදා දේශපාලනිකව මරා දැමිය නොහැකිවිය. ඔවුන් මුදා හළ ප්‍රාණ වායුවෙන් අදටත් ඔවුන් තැනූ ව්‍යාපාරය ධෛර්යයෙන් නැගී සිටින්නේ ඒ නිසාය. ඔවුන් සටන් කළේ මහජන දේපොළ කොල්ලකෑමට නොව එම දේපොළ කොල්ලකන කොල්ලකරුවන්ට එරෙහිවය. ඔවුන් තම ජීවිත මුදාහළේද ඒ සඳහාමය.

මෙලොව උපන් මිනිසෙකුට දෙආකාරයකට දිවිගෙවිය හැක. එකක් ජීව විද්‍යාත්මකවය. අනෙක සමාජ විද්‍යාත්මකවය. ජීව විද්‍යාත්මකව දිවිගෙවන්නා සතෙකු හා සමානය. කති. බොති. රමණය කරති. දේපොළ ගොඩ ගසා ගැනීමට දිවා රෑ වෙහෙසෙති. මියයති. එහෙත් ඉල්මහා විරුවන් ජීවත් වූයේ සමාජය වෙනුවෙනි. එය වෙනස් කොට වඩා උසස් තලයකට ඔසවා තැබීම වෙනුවෙනි. අවැසිනම් ජීවිතයෙන් වුවද ඒ සඳහා වන්දි ගෙවීමට ඔවුහු සූදානමින් සිටියහ. ඒ සඳහා ඔවුහු සටන් වැදුණහ. ඊට ප්‍රතිලාභ ලෙස ඔවුහු කිසිවක් ඉල්ලා නොසිටියෝය. ඔවුන් තම දිවි නොතකා සටන් වැදුණේ, නරක දෙයක් වෙනුවට වඩා හොඳ දෙයක් මේ සමාජයට ලබාදීමටය. එය ලොව අසීරුම කාර්යයි. එහෙත් එය අනභිබවනීයම කාර්යයයි. ඔවුන් කිසිදා නොමියන්නේ එනිසාය. ඔවුන් එක රැයින් පායා පසුදා නිවීයන තරු නොව සදාකල්හිම දිදුලන තරු වන්නේය.

# කම්බා හොරු රෙදි උනා දමති!

ස්වාධීන කොමිෂන් සභා සහ එහි නිලධාරීන්ගේ ක්‍රියාකලාපය හෙළා දකිමින් පසුගියදා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතා කළ ප්‍රකාශය පිළිබඳව මේ වනවිට රට තුළ මහත් ආන්දෝලනයක් ඇතිවී තිබේ. හොරුන් අල්ලා පරසක්වල ගසමි යයි පුරසාරම් දොඩමින් බලයට ආ මෛත්‍රීපාල ජනාධිපතිවරයා අංශක එකසිය අසූවක් අනෙක් පසට හැරී සිදු කළ ප්‍රකාශය රටේ මහ තැනම හොරු රැකීමට ඉදිරිපත්වීමක් ලෙස දේශපාලන විචාරකයෝ පෙන්වා දෙති.

හිටපු ආරක්ෂක ලේකම් ඇතුළු හමුදාපතිවරුන් FCID එකට කැඳවීම දේශපාලන න්‍යාය පත්‍රයකට අනුව සිදුවන බවත් තමාගේ අනුමැතියකින් තොරව සිදුකරන මෙවැනි ක්‍රියා දැඩි පිළිකුලෙන් හෙළා දකින බවත් මේවා කුමන්ත්‍රණ බවත් පවසමින් එම කමිටුවල නිලධාරීන්ට දැඩි ප්‍රහාරයක් එම ප්‍රකාශය හරහා ඔහු එල්ල කර තිබිණි.

ඌරන් කැකුණ තලනවිට හබන් කුකුළන්ට ජයමගුල් කීවාසේ මෙයින් වඩාත් අමන්දානන්දයට පත්වූ මහින්ද ප්‍රමුඛ දූෂිත නඩය විසින් දැන් වලිග ඔසවාගෙන කෑගසන්නට පටන්ගෙන තිබේ. එක අතකට මෛත්‍රී - රනිල්, මහින්ද කියන්නේ එකම වල්ලේ පොල් බව රටට පෙන්වාදීම ගැන ජනාධිපතිවරයාට ස්තුතිකළ යුතුය. දැන් වැරැදිකරුවන් රටේ මහජන දේපොළ ගැන කෑ හොරු නොව උන් ඇල්ලීමට සැබෑ ලෙසම කටයුතු කරන අයය.

රනිල් - මෛත්‍රී 'බඩ්' කළ ආණ්ඩුවේ හොරා පොලිස් සෙල්ලම දැන් රටටම ප්‍රදර්ශනය වී හමාරය. හොරු විසින් හොරුන්ව රැකීම පුදුමයට කරුණක්ද නොවේ. එහෙත් තම ගජමිතුරු හොරු රැකීමට රටේ ප්‍රධාන පුරවැසියාම ඉදිරිපත්වීම නම් පිළිකුල් සහගතය. ස්වාධීන කොමිෂන් සභාවල නිලධාරීන් අධෛර්යමත් කර හොරු පාරිශුද්ධත්වයට පත්කළ මෛත්‍රීගේ ප්‍රකාශය දැන් හොරුන්ට ආසිරි පැන් පොදකි. මේ හොර නඩවලට රැවටෙන ජනයා අවසානයේ වැටෙන්නේ කබලෙන් ලිපටය.

ආණ්ඩුවේ දේශපාලුවන් මෛත්‍රීගේ ප්‍රකාශයට සුදුහුණු ගා පිළියම් කිරීමට කොතරම් වෙර දැරුවද දැන් ඔවුන් ජනතාවගේ ඇස් ඉදිරියේ ගලේ පැහැරූ බළලුන්ගේ තත්වයට ඇදවැටී හමාරය.



# පොලිටිකල් පංතිය

පොලිටික්ක කවදාවත් නැතුව උදෙන්ම පංතියට ඇවිත් හිටියා.

"ගුඩ් මෝනිං" පංතියට එන ළමයින්ට පොලිටික්කම කිවුව.

"ආන් බලන්න ජනාධිපතිතුමා ජනතාවට සංවේදී වුණා." පොලිටික්ක කතාව පටන් ගත්තෙ කට්ටිය සෙටල් වෙනකම් ඉඳල.

"ඒකෙ කිසිම නිවුස් එකක් නෑනෙ සර්" මංජුව පටන් ගත්තෙම බාල්දියකින්.

"නිවුස් එකක්...? ඇයි ඒකෙ විශේෂයක් නැද්ද" පොලිටික්ක මඤ්ඤං.

"මොකද්ද සර් විශේෂෙ. සර් හැමදාම කියන්නෙ එයා එහෙම කෙනෙක් කියලනෙ" මංජුව කන්ඩෙම් කරන්නම හදනව.

"මං කලින් එහෙම කියල තියෙනවද" පොලිටික්කට තමන්වම විශ්වාස නෑ.

"සර් හැමදාම කියන්නෙ එයා තමයි සංවේදී නායකයා කියල. ජනාධිපතිතුමාට හරිම සංවේදී හදවතක් තියෙන්නෙ කියල" කනියත් කිවුවෙ කන් දෙකට ඇහිච්ච දේ.

"හත් දෙයියනේ මං ඒ කියන්නෙ මහින්ද මහත්තය ගැනනෙ." පොලිටික්කට යන්තම් කොණ අහුවුණා.

"ඉතිං සර් තාමත් ජනාධිපතිතුමා කියන්නෙ මහින්ද මහත්තයටනෙ. ඇයි සර් මුලින් ජනාධිපතිතුමා කිවුවෙ එයාට නෙමෙයිද?" අනුරුද්දිය බලන් ඉන්න බැරිම තැන ඇහුව.

"නැහැනෙ... ඔය ළමයි ටපලගෙන. මම දැන් සංවේදී වෙලා තියෙනව කිවුවෙ සිරිසේන මහත්තයට. අර සමහරු ආප්පය කිවුවෙ." පොලිටික්ක කිවුවෙ කිංඩි හිනාවකුත් එක්ක.

"සමහරු නෙමෙයි... සර්ලම තමයි එයාට ආප්පය කිවුවෙ. අපි නෙමෙයි." මංජුව කොක්කටම යනව.

"ඒ කතා වැඩක් නෑ ළමයිනේ. මම කියන්න හැදුවෙ එතුම කියපු හොඳ කතාවක්" පොලිටික්ක ට්‍රැක් එක පාදනව.

"අමතක කරලමු පැරණි කතා..." කවුරුහරි හීනියට කියල දැම්ම.

"විහිළු නෙමෙයි ළමයිනේ. එතුමටත් තේරිලා රණවිරුවන්ව උසාවි දක්කන එක වැරදියි කියල. ඔය අපූරුවට කිවුවෙ. දැන් මහින්ද මහත්තයල කියපු දේම කියනව." පොලිටික්ක හෙන හැපි එකේ කියනව.

"ඔබට සතුටුයිද දැන්..." පස්සෙ පේළියකින් කවුරු හරි කිවුව.

"ගෝඨාභය මහත්තයයි, නාවික හමුදාපතිවරුයි උසාවි ගෙනාපු එක මොනතරම් වැරදියිද?... ඒ මිනිස්සු කරපු දේට එහෙම කරන එක හරිද?" පොලිටික්ක කටු අතුවල පැටලෙන්නෙ නැතුව කියාගෙන යනව.

"එයාලා රාජකාරියෙ කරපු දේවලට නෙමෙයි නේද සර් කේස් එක?" මංජුව ආයෙත් පොල්ලක් දැම්ම.

"හරි එහෙමයි කියමුකො. ඒ මිනිස්සු රාජකාරියෙ කරපු දේවල්වල හැටියට ඒවා සුළු දේවල්නෙ," පොලිටික්කත් අරින්නෙ නෑ.

"නෑ... රාජකාරියෙ ඉන්නැද්දි කරපු දේවල්වලටත් දඬුවම් ඕනැ," සමන බිම් බෝම්බයක් පිපිරෙව්ව.

"ඈ... සමන් ඔයා කියන්නෙ සුදු කොඩි කතාවටත් දඬුවම් ඕන කියලද?" පොලිටික්ක බංකරේකට රිංගන්න බැලුව.

"නෑ මං කිවුවෙ ඒ ගැන නෙමෙයි. ඒවට දඬුවම් ඕනෙනම් වෙනම ඉල්ලගන්න. මම කිවුවෙ මෙයාලා ඇවන්ගාඩ් එකට සැපට නාගන්න ළිඳ කපල දෙන්නෙ තනතුරුවල ඉන්න කාලෙ... නාවික හමුදාවට... ඒ කියන්නෙ රටට... කෝටි ගාණක සල්ලි ආපු පාරක් ඇවන්ගාඩ් සමාගම පැත්තට හැරෙව්ව. ඒකට කළගුණ සලකන්න තමයි මෙයාල පැන්ෂන් ගියාම ලක්ෂ 25ක් පඩි දීල උපදේශකයො කරගත්තෙ. අනුමැතිය අස්සන් කරපු දමයන්ති මැඩම්ව ඕස්ට්‍රේලියා යැව්ව. ඒවා බැලුවාම සේනාධිපති මහත්තය හොඳට කළගුණ සලකන්න දන්නව. ගනුදෙනු වෙච්චි ගණන්වල හැටියට අපිටනම් මේවා පොඩි කේස් නෙමෙයි. මේව පොඩිනම් අපි නොදන්න මීට වඩා ලොකු කේස් තියෙන්න ඕන," සමන බඩ බොකු ඇද්ද.

"එතකොට මහ බැංකු කේස් එකට මොකුත් නැත්තෙ?" පොලිටික්ක හිටපු බංකරේ ගලෝල ගියාට පස්සෙ තව එකකට රිංගුව.

"බෑනගෙ පර්පෙචුවල් සමාගම තමයි මේ ආණ්ඩුවෙ ඇවන්ගාඩ්." සමන ඩෙස් එකේ කොණක හරිබැරි ගැහුණා. "ඒක ගැනත් පරීක්ෂණ ඉස්සරට යන්න ඕනැ. වැරදිකාරයින්ට දඬුවම් ඕනැ. ඔය කොයිකටත් මේ ආණ්ඩුවෙන් බැරිවුණොත් ඊළඟ ආණ්ඩුවෙන්නම් උත්තර ගන්නම වෙනව..." සමන මිට මොළවල ඩෙස් එකට ගැහැව්වට වැදුණෙ පොලිටික්කගෙ පපුවට.

## මේ රටේ මිනිස්සුන්ගේ...

13 පිටුවෙන්



පාලනය කරපු වැරැද්දම නැවත පානම ජනතාවට කරමින් ඉන්නවා. මේවා පැහැදිලි අසාධාරණකම්. ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට තිබුණු පැල්පත් ගිනි තියලා තමයි පසුගිය පාලන කාලයේදී මේ ඉඩම් අත්පත් කර ගත්තේ. එය නැවත සිදුවීම බරපතළ ගැටලුවක්. ඒ නිසා අපි මේ පිළිබඳව රජයේ අවධානය යොමු කරනවා. මිනිස්සුන්ගේ ඉඩම් බලහත්කාරයෙන් ගන්න ආණ්ඩුවකට අයිතියක් නැහැ.

කන්තලේ නගරය ගත්තොත්, 1940 ගණන්වල වාගේ සිට තමයි ඒ ජලාශයත් එක්ක ඒ ප්‍රදේශයේ ජනතාව ගොඩ නැගෙන්නේ. ඔවුන්ගේ දිගු කාලීන ඉල්ලීමක් තමයි, ඔප්පු ලබා දෙන්න කියන එක. මම හිතන්නේ රටේ ජනාධිපතිලා, අගමැතිලා ඔක්කොටම ඕක කියලා තිබෙනවා. හැබැයි, කවදාවත් ඒ ප්‍රශ්නය විසඳලා නැහැ.

ඒ වාගේම මොරගහකන්ද ජලාශයට ආසන්න ප්‍රදේශයේ තිබෙන ලග්ගල, හෙට්ටිපොළ නගරයේ ඔප්පු ලබා දීම පිළිබඳ ගැටලුව මේ පාර්ලිමේන්තුවේදී අනුර දිසානායක මන්ත්‍රීතුමාත් මතු කළා. නමුත් තවම ඔප්පු ලබා දීමේ කටයුතු අවසන් වෙලා නැහැ. දශක ගණන් මේ ප්‍රශ්න දිග්ගැස්සිලා තිබෙනවා. ඉඩම් expire වෙන්නේ නැති නිසා ඉඩම තිබෙනවා.

## ලෝකය විවිධත්වයේ...

11 පිටුවෙන්



කරති. කෙනෙක් තුළ හොඳ, නරක දෙකම පවතින බවත් ඒවයේ ප්‍රමාණය අඩු වැඩි විය හැකි බවත් තේරුම් ගෙන ඔහු ගැන කරන දිගු අධ්‍යයනයකින් නිගමනකට එන්නේ නම් එය නිවැරදි වේ. නැතිනම් අපි මුලාවට පත්වෙමු. බොහෝ විට තරුණ තරුණියන් එකිනෙකාට රැවටී තම ජීවිත පවා අවදානමට ලක්කර ගන්නේ මෙලෙස පොදු දෙය හා විශේෂ සහිතව යමක් වටහා ගැනීමට උත්සාහ නොකිරීම නිසාය. හොඳ සංවිධානයක් තුළ විශේෂයක් ලෙස නරක මිනිසුන් මෙන්ම වැරදි සංවිධානයක් තුළ විශේෂයක් ලෙස හොඳ මිනිසුන් සිටිය හැක. අප ඒ අනුව හොඳ මිනිසෙක් සිටි පමණින් එම සංවිධානයම 'හොඳ' යයි හෝ නරක මිනිසෙක් හමුවූ නිසා එම සංවිධානයම නරකයි හෝ යනුවෙන් වැරදි නිගමනයකට ආ යුතු නැත. එහි පොදු දෙය කුමක්ද? විශේෂය කුමක්ද යනුවෙන් වෙන් වෙන්ව තේරුම් ගැනීමට හැකියාව තිබිය යුතුය.

මේ අනුව ප්‍රකෘතියත් අප අවට සමාජය හා මිනිසාත් නිවැරදිව වටහා ගැනීමේදී මෙම රටාව හෙවත් ආකාරය අප වැදගත් වේ. ඉතිරි ආකාර ගැන සාකච්ඡා කිරීමට නැවත හමුවෙමු.

## ආණ්ඩුව හොරුන්...

05 පිටුවෙන්



පරීක්ෂණවලට බාධා කළේ ගාල්ලේ එ.ජා.ප. ඇමතිවරයෙකි. පාර්ලිමේන්තුව තුළ ඇවන්ට් ගාඩ් රැකීමට ගත් උත්සාහය නිසා මාරපන ඇමතිවරයාට ඉල්ලා අස්වීමටද සිදුවිය. අධිකරණ ඇමතිවරයා (එ.ජා.ප.) එම ආයතනය රැකීමට විශාල වෙහෙසක් දැරීය. එහිදී නීතියද තිබුණේ ගොලුවය. හිටපු නාවික හමුදාපතිවරුද මුදලට විකිණී තිබේ. හොරකම් කරන ලද කළු සල්ලිවලට ආණ්ඩු පවා සෙලවිය හැකි බව ඉන් තහවුරු විය. මේ සියලු කරුණුවලින් පැහැදිලි වන්නේ, ධනවාදී පාලනයක් තුළ වංචා හා දූෂණ යනු පිළිකා මෙන් පැතිර ඇති සුවකළ නොහැකි රෝගයක් බවය. එය හඳුනාගැනීමට බැරි තරම් සංකීර්ණය.

මෙහි තවත් බේදවාචකයක් තිබේ. ඒ පොදු ජනතාව දේශපාලන පක්ෂවල අන්ධ අනුගාමිකයන් වූ විට සිදුවන දෙයයි. එවිට ඔවුහු සත්‍ය දැකීමට අසමත් වෙති. රාජපක්ෂ කල්ලියේ හොරුන්ට වීරයින්ගේ භූමිකාව රඟපෑමට හැකිව තිබෙන්නේ මේ නිසාය. තමන්ගෙන් පළිගන්නේ යයි රාජපක්ෂවරු කරන සෝෂාව රාජපක්ෂ අනුගාමිකයෝත් අතාර්කිකවම පිළිගනිති. රාජපක්ෂවරුන් සතුව තිබී සොයා ගනිමින් තිබෙන, උපයාගත් ආකාරය පවා හෙළිකළ නොහැකි දේපළ ගැන ඔවුහු කිසිවක් නොසිතති. පසුගිය ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙක්ව සිටි බැසිල් රාජපක්ෂට අයත් මල්වානේ අක්කර 16ක ඉඩම හා විශාල නිවස වෙන්දේසියට දැමීමට අධිකරණය පසුගියදා නියෝග කළේ එහි අයිතිය බැසිල් ප්‍රතික්ෂේප කළ නිසාය. මෙහිදී ආණ්ඩුවටද පුදුම වැඩක් කළේය. ඒ එම ඉඩම නීත්‍යානුකූලව නමට ලියාගෙන තිබෙන එය තමන්ගේ නොව බව කියන පුද්ගලයාට නිදැල්ලේ සිටීමට ඉඩ දීමය. මෙයට පෙරද මෙලෙසම බැසිල්ට අයත් කඩුවෙල හා මාතර ඉඩම් දෙකක් රජයට පවරා ගත්තේද ඒවාට ඔහු අයිතිය නොකී නිසාය. කෝටි ගණන් වටිනා ඉඩම් හා නිවාස තුනක අයිතිය පිළිනොගැනීමට බැසිල්ට සිදුවූයේ ඇයි? එම දේපළ ගැනීමට යෙදූ මුදල් සම්භාරය උපයා ගත් ආකාරය පෙන්වීමට ඔහු අසමත් නිසාය. එනම් එම මුදල් හොරාකෑ මුදල් නිසාය. එහෙත් මේ සියල්ල මෙසේ තිබියදී ඔහු ජනමාධ්‍යවල වීරයෙක් වීමට උත්සාහ දරයි. අලුත් පක්ෂ හැදීමට කටයුතු කරයි. රාජපක්ෂවරු හොරකම් නොකළ බවත් මේ

පළිගැනීම් බවත් තවමත් විශ්වාස කරන අයද සිටිති. සැබෑ බේදවාචකය එයයි.

ධනවාදය හොරකම් කර තිබෙන්නේ මහජන දේපළ පමණක් නොවේ. මහජනතාවගේ නිදහස් චින්තනයද ඔවුන් විසින් හොරකම් කරනු ලැබ තිබේ. ධනවාදය තුළ වංචා දූෂණවලට ලක්ව තිබෙන්නේ මහජන දේපළ පමණක් නොවේ. ජනතාවගේ සිතිවිලිද වංචා දූෂණවලට ලක්වී තිබේ. එවැනි සමාජයක ධනවාදය පවතිද්දීම ධනපති පාලනයක් යටතේ වංචා දූෂණ වැළැක්වීමට හා හොරු ඇල්ලීමට නිතරම සීමාවන් තිබේ. සත්‍යය එයයි.

පසුගිය කාලයක් පුරා රට තුළ සිදුකර ඇති මහා පරිමාණ නාස්තිය හා දූෂණ ගැන, මූල්‍ය වංචා හා අපරාධ ගැන සැබෑ ලෙසම පරීක්ෂණ කළ යුතුය. මහජන මුදල් වංචා කළ අපරාධ සිදු කළ සියලු දෙනාට තරාතිරම නොබලා දඬුවම් දිය යුතුය. බහුතර ජනතාවගේ අවශ්‍යතාවය එයයි. එහෙත් එය වත්මන් ආණ්ඩුවෙන් ඉටුකරගත නොහැකි බව දැන් කාටත් පැහැදිලිය. විශේෂයෙන් මේ හවුල් ආණ්ඩුව යහපාලනය ගෙනෙන බවට විශ්වාසය තැබූ සිවිල් බලවේග දැන්වත් මෙම සත්‍යය තේරුම්ගත යුතුය. දැනට කෙරෙන පරීක්ෂණ අඩපණ නොවීම සඳහා සියලු දෙනා මැදිහත් විය යුතු බව සත්‍යයකි. එහෙත් ඉන් අවශ්‍ය ප්‍රතිඵල ලැබේ යැයි සිතීම අනුවණකමකි. එම නිසා සැබෑ ලෙසම වංචා දූෂණ නැතිකළ හැකි හොරු ඇල්ලිය හැකි පාලනයක් නිර්මාණය කළ යුතුය. එය පක්ෂමය වෙනසකින් කළ නොහැක. ඊට පංතිමය වෙනසක් අවශ්‍යය. එම වෙනස වෙනුවෙන් බලවේග එක්රැස් කිරීම සැබෑ ලෙසම යහපාලනය ප්‍රජාතන්ත්‍රවාදය අපේක්ෂා කරන අයගේ වගකීමය.

## ඉතිහාසය ඉල් මහ විරුවන්ට...

03 පිටුවෙන්



පෙරට ඇදෙමින් තිබෙනවා. මේ සමාජ වටපිටාව තුළ ජනතා විමුක්ති පෙරමුණට කවදා හෝ සම්බන්ධවී සිටි කෙනෙකුට දෑස් පියාගෙන දෑත් පොරවාගෙන සිටින්නට බැරුව යනවා. එදා තමන්ගේ දෑත්වලින් ගොඩනැගූ පක්ෂයට අද සක්‍රීයව යමක් කරන්නට බැරි වුණත්, මේ ව්‍යාපාරය පෙරට යනවා දකිනකොට ඔවුන්ට අසීමිත සතුටක් දැනෙන්න ඕනැ. එහෙම හිතන්නෙ අවංකව මේ දේශපාලන ව්‍යාපාරයෙ හිටපු අයට. ඔවුන් ජනතා විමුක්ති පෙරමුණට ආශීර්වාද කරනවා. තවත් පිරිසක් ඉන්නවා, එක වතාවක් අපි කට්ටකෑව. ආයි නම් ඕවට රෝල්වෙන්න අපට බැහැ. අපි අපේ වැඩක් බලාගෙන ඉන්නව කියලා හිතන. ඒ අය සක්‍රීයව දායකත්වය දෙන්න එන්නෙ නැති වුණත් පක්ෂය ජයග්‍රාහීව පෙරට යනව දැක්කාම ඔවුන්ටත් හිතටත් හීන් සතුටක් මෝදුවෙන එක වළක්වන්න බැහැ.

ඒ වගේම තවත් පිරිසක් ඉන්නවා. "හලෝ අපි 71 මෙහෙමයි පොලිසිවලට වැඩේ දුන්නෙ, අපි පොලීසි ගණනාවක් යටත් කරගෙන හිටිය. පස්සෙ අපි පසුබැස්සෙ සිංහරාජෙට, විල්පත්තුවට. අපි මෙච්චර කාලයක් කැලේ ඉඳන් සටන් කෙරුව. අපි අවසාන මොහොත දක්වාම සටන් කළා. හරිද?" කියල. ඒ විතරක් නෙවෙයි, අපි 88/89 භීෂණ කාලෙ ආණ්ඩුවත් එක්ක හැප්පුණෙ මෙහෙමයි. ඉන්දු - ලංකා ගිවිසුම කාලෙ තමයි අපි දුන්නෙ නියම ගේම් එක. ගිවිසුමට විරුද්ධව මී මැසි පොදි වගෙ මිනිස්සු පාරට බැස්සුවෙ අපි තමයි. CTB ස්ට්‍රයික් එක දිනවන්න අපි මොනවද නොකළෙ? දැන් මේ JVP එක මොනවද මේ කරන්නෙ? කියල අහන අයත් ඉන්නවා.

ජනතා විමුක්ති පෙරමුණේ යම් පසුබැසීමක් තිබුණ කාලවල මේ වහසිබස් කියන අය හිටියෙ ඔළු හංගගෙන. එම තත්වයන් යටතේත් කට්ට කාගෙන, පක්ෂෙ නිවැරදි වැඩපිළිවෙළ කෙරෙහි විශ්වාසය තබමින්, සියලු අභියෝග යන්ට මුහුණ දෙමින්, යහපත් පූර්වාදර්ශයන් සපයමින් දිවා රෑ නොබලා වෙහෙසෙමින් කටයුතු කළ සගයින් නිසා අද පක්ෂය ජනතා විශ්වාසය දිනාගෙන තියෙනවා. ජනතාවගේ ගෞරවයට පාත්‍රවෙමින් තියෙනවා. හොර මැරකම් වංචා දූෂණ නැති, ජනතාව වෙනුවෙන් අවංක මැදිහත් වීමක් කරන එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ බවට ජනතාව තුළ මතයක් තහවුරු වෙමින් තිබෙනවා. යහපත් ආදර්ශයන් සපයන එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ බව අද රටේ බහුතරයක් දෙනා පිළිගන්නවා. හිතේ කුහකකම් නැති අය දන්නවා ජනතා විමුක්ති පෙරමුණ නොතිබෙන්න, අද රට කොතනද නතර වෙන්නේ කියලා.

මෙන්න මෙවැනි තත්ත්වයක් තුළයි, අපි කලින් සඳහන් කළ ඇතැම් කණ්ඩායම්වල ක්‍රියාකාරිත්වය හොඳින් දැකබලාගන්න පුළුවන් වෙන්නේ. අද ජනතා විමුක්ති පෙරමුණ දේශපාලන කීර්තියක් අත්පත් කරගෙන තිබෙනවා වගේම, එම කීර්තියේ ආලෝකය මගින් ඉතිහාසයේ අඳුරු පටලවලින් වසා තිබූ ජනතා විමුක්ති පෙරමුණේ අතීතයත් ආලෝකමත් වෙනවා. මෙවැනි තත්වයක් තුළ ඇතැම් ජනමාධ්‍යවලට ප්‍රචාරක වාසිය ලබාගන්නට ජනතා විමුක්ති පෙරමුණේ අතීත ක්‍රියාකාරකයින් ඕනෑ කරනවා. ඔවුන් හොයාගෙන යනවා. ඔවුන්ගෙන් තොරතුරු ප්‍රමාණයක් අරගෙන හොඳට ආලවට්ටම් දාල ලියනවා. තොරතුරු දෙන ඇතැම් හිටපු ක්‍රියාකාරිකයොත් සාහිත්‍යය දාල කියනවා. නැහැ, ඇත්ත එහෙම නොවෙයි, කියන්න ඉතුරුවෙලා ඉන්නෙත් අතළොස්සක් දෙනායි. අරගොල්ලො "පාළුගෙයි වළං බිඳිනව". "එදා පවාදීම කරලා, CJC එක (අපරාධ යුක්ති විනිශ්චය කොමිෂන් සභාව) ඉදිරියෙ වරද පිළිඅරගෙන අද සමහරු 'පොරටෝක්' දෙනව කියලා එක සගයෙක් කිව්වා. ඇයි එහෙම වෙන්නෙ? ජනතා විමුක්ති පෙරමුණට හිමි වී තිබෙන කීර්තියෙන් කොටසක් කොල්ලකාගන්න.

පෞද්ගලික අපහසුතා හේතුවෙන් පැත්තකට වෙලා හිටියත්, පක්ෂය ජයග්‍රාහීව පෙරට ඇදෙනවා දැක්කම අවංකවම සතුටුවෙන, පක්ෂයේ ඉදිරිගමනට ආශීර්වාද කරන අය බොහොම දෙනෙක් ඉන්නවා. ඔවුන් අවංක හෘදය සාක්ෂියක් ඇති අයයි.

***නියමුවා:-* ඔබ කියන පරිදි පක්ෂයේ ගමන දෙස බලා සිටින විශාල පිරිසක් මේ සමාජයේ සිටිනවා. ජ.වි.පෙ. ඉතිහාසයේ දීර්ඝ කාලපරිච්ඡේදයක සජීව අත්දැකීම් ඇති ඔබට ඔවුන්ට ඇති පණිවිඩය කුමක්ද?**

**කිතුලගොඩ සහෝදරයා:-** මා ඉහතින් සඳහන් කළේ ඒ අය ගැනයි. අපේ පක්ෂයෙ හැම කෙනෙකුටම, පටන්ගත්දා සිට මිය යනතුරු එකවගේ එක දිගට පූර්ණ කාලීනව වැඩකරන්න බැරුව යාවි. අර රෝහණ සහෝදරයා කියපු ප්‍රසිද්ධ උදාහරණයක් තිබෙනවනෙ. "කොළඹ - කතරගම බස් එකට කොළඹින් නැගපු අය ඔක්කොම කතරගම දක්වා යන්නේ නැහැ. කොළඹ ඉඳලා පිටත් වුණාම ගාල්ලෙන් බහිනව, පිරිසක් ගාල්ලෙන් නගිනව, මාතරින් පිරිසක් බහිනව. ඒ වගේම මාතරින් පිරිසක් නගිනව. හම්බන්තොටෙනුත් එහෙමයි. කොටසක් බහිනව, කොටසක් නගිනව. කොළඹින් නැගපු අය කතරගමටම ගිහින් බහින්නෙ ටිකදෙනයි. ඒත් කතරගමට යන කොටස් බස් එක පිරිලා" කියලා රෝහණ සහෝදරයා කිවුවා. ඒක තමයි ඇත්ත තත්වෙ.

පක්ෂෙ මුලදී ක්‍රියාකාරීව වැඩකරපු සමහර අයට පැහැර හැරිය නොහැකි ඇතැම් ප්‍රශ්න නිසා ක්‍රියාකාරිත්වය අඩුව යන්න හෝ නැතුව යන්න පුළුවන්. පවුලේ බරපතළ ප්‍රශ්න නිසා, අසනීප තත්වයන් නිසා එහෙම වෙන්න පුළුවන්. ඒ කුමන තත්වයන් යටතේ වුවත්, පක්ෂයට - පංතියට ද්‍රෝහී නොවී සිටිතොත් ඔවුන් පක්ෂයේ අයයි. තමන්ගේ පෞද්ගලික හේතුන් මත වෙලාවක අකර්මණ්‍ය වුවත්, නැවත ඕනෑම මොහොතක ඔවුන්ට තමන්ගේ සක්‍රීය දායකත්වය පක්ෂයට ලබාදිය හැකියි.

තමන්ගේ අත්වැරදීමක් නිසා යම් මොහොතක නොමඟ යෑමක් සිදුවුණා නම් ඒ සම්බන්ධයෙන් ස්වයං විවේචනයක් කොට නැවත පක්ෂයට ආ හැකියි. වැරදි සිදුවීම ස්වාභාවිකයි, වැරදි අවබෝධකර ගැනීම හා එම වැරදි පිළිගැනීම විශිෂ්ට ගුණාංගයක්. එවැනි අයට පක්ෂය තුළ ඕනෑම මොහොතක ඉඩ විවරව තිබෙනවා. ජාතික හා ජාත්‍යන්තර වමේ ව්‍යාපාරයේ මෙවැනි අත්දැකීම් බහුලයි. අපේ පක්ෂය තුළත් මෙවැනි තත්වයන් බහුලයි. කලක් දුරස්ව හිටියත් එවැනි අවංක චරිතවල අත්දැකීම් අප පක්ෂයට අත්‍යාවශ්‍යයි. ක්‍රියාකාරී දේශපාලනයට නැවත එළැඹෙන්නට අපහසු නම් තරමක් දුරින් සිට හෝ එවැනි අයගේ ආශීර්වාදය වත්මන් ක්‍රියාකාරිකයන්ට ඉතා වටිනා දෙයක් වේවි. ඔවුන්ගෙන් ලැබෙන ධෛර්යය, සැබෑ ලෙංගතුකම, ආදරය, කරුණාව යන මේ සියල්ල අදටත් ලොකු වටිනාකමක් ගෙනෙනවා. එදත් එහෙමයි.

***නියමුවා:-* සාම්ප්‍රදායික පක්ෂ දෙකක පාලනයන් වෙන වෙනම අත්දුටු ජනතාව මේ වන විට එය ඒකාබද්ධව සිදුවන ආකාරය දකිමින් සිටිනවා. මේ ගමන තුළ රටටත් සමාජයටත් ඉදිරි ගමනක් නොමැති බව ඒත්තු ගනිමින් සිටින ජනතාවට 2020 වන විට විකල්ප දේශපාලන ගමනක් සඳහා සූදානම් වන ලෙස ජ.වි.පෙ. අවධාරණය කරනවා. මේ පිළිබඳව වැඩිදුරටත් පැහැදිලි කළොත්.**

**කිතුලගොඩ සහෝදරයා:-** ඇත්ත. වසර හැට අටක් මාරුවෙන් මාරුවට රට පාලනය කොට රට මහා බේදවාචකයක් කරා ගෙන ආ පක්ෂ දෙක, එකට එකතු වී රට අගාධයකට හෙළමිනුයි, මේ ඉන්නෙ. මෙම තත්වය ජනතාව තේරුම් ගනිමිනුයි ඉන්නෙ. තවම නොතේරුණු පිරිසක් සිටී නම් ඔවුනුත් නුදුරු අනාගතයේදී මෙය තේරුම් ගනීවි.

පසුගිය කාලය තුළ මැතිවරණවලදී අපි බලය ඉල්ලා සිටියෙ නැහැ. රටේ ප්‍රසිද්ධ දේශපාලන පක්ෂ දෙකක් කරට කර තරඟ කරද්දී අපට රටේ පාලන බලය දෙන්න යයි අප ඉල්ලා සිටියා නම් අපට බලයක් ලැබේ යයි ජනතාව විශ්වාස කරන්නෙ නැහැ. හැමදාම ආණ්ඩු පත්කරන්නෙ, පාවෙන ඡන්ද දායකයායි. ඔවුන්ගේ ස්වභාවය තමයි, පරදින්නට ඇති අකැමැත්ත. තමන්ගේ ඡන්දය දිනන ඡන්දයක් බවට පත්කරගන්න ඕන නිසා එවැනි අය බොහෝවිට ඡන්දය පාවිච්චි කරන්නෙ දිනාවි යැයි හිතන පැත්තටයි. පසුගිය මැතිවරණවලදී ජනතා විමුක්ති පෙරමුණට පාලන බලයක් ලැබේවි යයි ජනතාව හිතුවෙ නැහැ. ජනතා විමුක්ති පෙරමුණත් කිව්වෙ, හොරකම, වංචාව, දූෂණය හෙළිකරන්න ඕනැ. ඒවා නතර කරන්න ශක්තිමත් බලයක් ලබා දෙන්න කියලයි. පාවෙන ඡන්ද දායකයාට ඕන කරන්නෙ පාලන බලය ඉල්ලන පක්ෂයකට ඡන්දය දීල තමන්ගෙ ඡන්දෙ දිනවා ගන්න. ඒ නිසා අපේ පක්ෂයට ලැබුණු ඡන්ද ප්‍රමාණය අඩුවුණා.

එහෙත් අද අප කියන්නේ, වෙන වෙනම රට කරවලා රට අගාධයට ඇද දමපු පක්ෂ දෙක එකට එකතුවෙල රට කරවලා කරන්න පුළුවන් වන්නේ රට අගාධයට ඇද දමන ගමන ඉක්මන් කිරීම පමණයි. මේ රට හදන්න හැකියාවත් වැඩපිළිවෙළත් හැකියාවත් දක්ෂතාවත් පෙන්වා දී තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ඒ නිසා 2020දී ජනතා විමුක්ති පෙරමුණ ප්‍රමුඛ කරගත් බලවේගයකට පාලන බලය ලබා දෙන්න කියලා අපි ඉල්ලනවා. ඒ වෙනුවෙන් බිම් මට්ටමේ සංවිධාන ගොඩනගා ගොවි, කම්කරු, ධීවර, වතු කම්කරු, කුඩා තේ වතු හිමියන්, විද්වතුන්, වෘත්තික, මැද පංතික සියලු බලවේග ඒකරාශි කරන පුළුල් බහුජන පෙරමුණක් ගොඩනගන්න අපි බලාපොරොත්තු වෙනවා. සමස්ත සමාජයට කරන දැනුම්වත් භාවය මගිනුයි එම ප්‍රයත්නය අප දරන්නේ. අද සමාජයේ තියෙන රික්තයට - හිඩැසට අපේ ක්‍රියාමාර්ගය සාකල්‍යයෙන්ම ගැලපේ යැයි අපි විශ්වාස කරනවා. අපි මේ රටේ ඡන්දදායකයන් ඉල්ලා සිටිනව, පුළුල් පෙරමුණට ඔබත් එකතුවී රට නිවැරදි මඟට ගන්න ඔබ හැම දෙනාත් දායකවන්න කියලා.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




වැට් බද්දට එරෙහිව...



කියුබන් තානාපතිට සමුදී...



ත්‍රිකුණාමලයේදී චේ දිනය සමරමින්...



ලෝක තරුණ හා ශිෂ්‍ය උළෙළ වෙනුවෙන්...



පලස්තීනයට සහය පළකරමින්...



'අලුත් වැස්සකට' ඉඩදී...

## මර්මස්ථාන බිලිදීම වළක්වා ගැනීම සඳහා අත්වැල් බැඳගන්න

**ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා**



රනිල් මෛත්‍රී ආණ්ඩුව රටට කරන විනාශය නතර කළ යුතු බව අවධාරණය කළ ජ.වි.පෙ. නායක අනුර දිසානායක සහෝදරයා, එය වෘත්තීය සමිති සහ දේශපාලන ව්‍යාපාරයක් ලෙස හුදු ජනතා විමුක්ති පෙරමුණ කටයුත්තක් පමණක් නොවන බැවින් රටේ ආර්ථික මර්මස්ථාන බිලිදීම වළක්වා ගැනීම සඳහා අත්වැල් බැඳගන්නා ලෙස සමස්ත ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ, පසුගිය 03වැනිදා ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. වැඩිදුරටත් කරුණු දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මෛත්‍රී රනිල් ආණ්ඩුව හරියට ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිකරුවෝ වගේ. මේක ආණ්ඩුවක් නෙවෙයි. ජනතාව විසින් ආණ්ඩුවක් පත්කර ගන්නේ රටේ සම්පත් භාවිත කරලා නිසි කළමනාකාරිත්වයක් සහිතව මෙම සම්පත් රටේ ජනතාවගේ දියුණුව වෙනුවෙන් උපයෝගී කර ගන්නයි. නමුත් මේ ආණ්ඩුව රටේ වැදගත්ම සම්පත් විකුණමින් බිලිදෙමින් තිබෙනවා. පක්ෂයක් ලෙසත් වෘත්තීය සමිති ව්‍යාපාරයක් ලෙසත් ආණ්ඩුවේ විකිණීමට බිලිදීමට එරෙහිව පාරේ සටනක් ආරම්භ කරනවා. තෙල් සංස්ථාව, හම්බන්තොට තෙල් ටැංකි, ත්‍රිකුණාමලය තෙල් ටැංකි සංකීර්ණය, තෙල් පිරිපහදුව, කොළඹ වරාය, විකිණීමට එරෙහිව පුළුල්තම සටන් බලවේගයක් ගොඩනගා දැවැන්ත සටනක් දියත් කරනවා. හම්බන්තොට නැව් තෙල් සේවාව පෞද්ගලීකරණය කළොත් ආණ්ඩුව ලැබෙන ප්‍රතිලාභ අහිමි වෙනවා. එය අපිට නැවත ලබාගැනීමට පුළුවන්කමක් නැහැ. කොළඹ වරායේ නැගෙනහිර ජැටිය වසර 35ක් සඳහා පෞද්ගලික සමාගමකට ලබා දෙනවා. එම වසර 35 තුළම රජයට ප්‍රතිලාභයක් ලැබෙන්නේ නැහැ. තෙල් සංස්ථාව සතුව තිබෙන පිරිපහදුව පෞද්ගලීකරණය කළොත් එයින් රටට ලාභයක් අත්කරගන්න බැරිවෙනවා. එම ස්ථාන රටේ ආර්ථිකයේ වැදගත්ම ස්ථානයි." මෙම මාධ්‍ය හමුව සඳහා ජ.වි.පෙ. වෘත්තීය සමිති නායකයෝද එක්ව සිටියහ.

## මූල්‍ය වංචා විභාගයට වෙනම අධිකරණයක් ඕනෑ

**ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා**



මුදල් විශුද්ධිකරණය යටතේ සිදුවූ මූල්‍ය වංචා ගැන පරීක්ෂණ සාමාන්‍ය අධිකරණවල සිදුකිරීම හේතුවෙන් ඒවායේ අනෙකුත් නඩු කටයුතුවලටද බාධාවක් ඇති වන බැවින් මුදල් විශුද්ධිකරණ චෝදනාවලට එරෙහි නඩු විභාග කිරීම සඳහා වෙනම අධිකරණයක් පිහිටවිය යුතුව තිබේ යැයි ජ.වි.පෙ. යෝජනා කළේය.

මූල්‍ය වංචා පිළිබඳව විමර්ශන කඩිනම් කළ යුතුව තිබියෙදී එසේ නොකර ජනාධිපතිවරයා විසින් පසුගිය 12වැනි දින සිදු කරන ලද ප්‍රකාශය ඉතාම බරපතළ බව පෙන්වා දුන් ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, රටේ ප්‍රධානියා ලෙසත් ආණ්ඩුවේ ප්‍රධානියා ලෙසත් වංචා-දූෂණවලට එරෙහිව පරීක්ෂණ සිදුකරන ආයතන වගකිව යුතු ආයතන බවට පත්කිරීමට ජනාධිපතිවරයාට වගකීමක් ඇති බවත් පරීක්ෂණ නිලධාරීන්ගේ මානසිකත්වය බිඳවට්ටන ප්‍රකාශ සිදු නොකළ තිබූ බවත් පෙන්වා දුන්නේය. ඔහු මේ අදහස් පළ කළේ පසුගිය 16වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ විජිත හේරත් සහෝදරයා මෙසේද පැවසීය

"දැන් නීතිය ක්‍රියාත්මක වීමේදී විහිළුසහගත දේවල් සිදුවෙනවා. මේක හරියට ගමේ කෙසෙල් කැන් හොරෙක් පොලීසියෙන් අල්ලලා අධිකරණයට ඉදිරිපත් කළාම හොරා කියනවා, මම හොරෙක් නෙවෙයි, කව්දෝ කෙනෙක් ඇවිල්ලා කෙසෙල් කැන මගේ කරේ එල්ලුවා කියලා. එවිට අධිකරණය හොරා නිදහස් කරලා කෙසෙල් කැන වෙන්දේසි කරන්න කියනවා වගේ වැඩක්."

## මහ බැංකු වංචාවට සම්බන්ධ සියලු දෙනාට දඬුවම් ලබාදිය යුතුයි

**ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා**



මහ බැංකු වංචාව සම්බන්ධයෙන් හිටපු මහ බැංකු අධිපතිවරයා නිදහස් කරමින් ඔහුගේ බෑනාගේ සමාගමට අපරාධ නඩු ගොනු කරන බව කෝප් කමිටුවේ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කර ඇතැයි කී ජ.වි.පෙ. ජාතික සංවිධායක බිමල් රත්නායක සහෝදරයා ඒ වංචාවට අදාළ සියලු දෙනාට දඬුවම් ලබා දිය යුතු බවත් රටේ අධිකරණයට එම වගකීම පැවරෙන බවත් අවධාරණය කළේය.

ඔහු මෙසේ පැවසුවේ එ.ජා.ප. මන්ත්‍රීවරුන් විසින් වෙනම කෝප් වාර්තාවක් ඉදිරිපත් කිරීමට සූදානම්වීම සම්බන්ධයෙන් කරුණු දැක්වීම සඳහා පසුගිය 25වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවති මාධ්‍ය හමුවේදීය. වැඩිදුරටත් අදහස් දැක්වූ බිමල් රත්නායක සහෝදරයා මෙසේද පැවසීය.

"එජාප මන්ත්‍රීවරුන් අලුත් දෙයක් හොයාගෙන තියෙනවා. කොන්ත්‍රාත්තුව දුන්න කෙනා බේරලා කොන්ත්‍රාත්තුව ගත්ත කෙනාට දඬුවම් දෙන්න යනවා. එ.ජා.ප. 'බයිස්කෝප්' කමිටුව කරන්නේ කොන්ත්‍රාත්තුව දුන්න කෙනා බේරන එකයි. පර්පචුවල් ට්‍රෙෂරීස් අධ්‍යක්ෂ මණ්ඩලය මහ බැංකුවට පැනලා මිලියන 5000ක සල්ලි මලු අරන් ගියා කියලයි එ.ජා.ප. මන්ත්‍රීවරු කියන්නේ. මිලියන 321ක ප්‍රාග්ධනයක් හිමි බෑනාගේ සමාගම රුපියල් මිලියන 5000ක සියයට 1650ක ලාභයක් ලබන්නේ කොහොමද? කුඩු ව්‍යාපාරයටවත් එහෙම ලාභ ලබන්න බැහැ. ඒක කරන්න පුළුවන්කම ලැබිලා තිබෙන්නේ රනිල් වික්‍රමසිංහගේ අනුහසින් බැඳුම්කර ගනුදෙනු කළ හිටපු මහ බැංකු අධිපතිවරයාගේ බෑනාගේ සමාගමට පමණයි."

## පටු දේශපාලන අරමුණු වෙනුවෙන් රැකියා එපා! සුදුස්සන්ට රැකියා ඕනෑ!

**සමාජවාදී තරුණ සංගමය**



සජිත් ප්‍රේමදාස ඇමතිවරයා ඇතුළු ආණ්ඩුවේ ඇමතිවරුන් විසින් තමන්ගේ පටු දේශපාලන අරමුණු වෙනුවෙන් පුද්ගලයින්ට රැකියා ලබාදීම තමන් තරයේ හෙළාදකින බවත් තරුණ තරුණියන්ට රැකියා ලබාදීමේදී සුදුස්සන්ට රැකියා ලබාදිය යුතුව ඇති බවත් සමාජවාදී තරුණ සංගමය ආණ්ඩුවට බලකර සිටී.

මේ අදහස් පළ වූයේ ඇමතිවරුන්ගේ අවිධිමත් පත්වීම් ලබාදීම පිළිබඳව සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර සහෝදරයා විසින් ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවකදීය. වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද කීය.

"පටු දේශපාලන වුවමනාකම් වෙනුවෙන් රැකියා ලබාදීම පිළිබඳව පුළුල් පරීක්ෂණයක් සිදුකළ යුතු බව අපි අගමැතිවරයාට අවධාරණය කරනවා. රටේ ඇමතිවරු වෙළෙන්දන් වගේ රැකියා විකුණනවා. අපේ රටේ උපාධිධාරීන්ගේ තත්වය මොකක්ද? ඇමතිවරුන්ගේ මෙම ක්‍රියාකලාපය දැඩි පිළිකුලෙන් යුතුව හෙළාදැකිය යුතුයි. ඒ වගේම රටේ වගකිව යුත්තන් මේ සම්බන්ධයෙන් මැදිහත් විය යුතුයි. අපි මාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව ඇමතිවරයාගෙන් ප්‍රශ්න කරන්න කියලා."




**ඔක්තෝබර් විප්ලවය සහ සියවසක අත්දැකීම්!**
**සම්මන්ත්‍රණය හා ඉහත කෘතිය එළිදැක්වීම**
**නොවැම්බර් 08 සවස 3.30ට**
**ජාතික ලේඛනාරක්ෂක ශ්‍රවණාගාරයේදී.**


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.



ද්විමාසික කලා සංස්කෘතික
සඟරාමය අතිරේකය
සමාජවාදී කලා සංගමයේ ප්‍රකාශනයකි.
නව සංස්කරණය 2016 නොවැම්බර්
05 වන කලාපය

# රළ

## පාලකයන්ට කලාව ඇලර්ජික් ඇයි?



සාහිත්‍ය සහ කලාව අපට අවශ්‍ය ඇයි? වඩාත් ගැඹුරින් සාකච්ඡා කළ යුතු ප්‍රශ්නයක් ලෙස අද අප එය දකින්නෙමු. අද අපට ජීවත්වීමට සිදුව ඇත්තේ නරුම සමාජයකය. ඒ පිළිබඳ කිසිදු විවාදයක් නැත. වත්මන් සමාජය මේ තැනට ඇද දැමීමට වක්‍රව සහ ඍජුව සම්බන්ධ වූවෝද, කිඹුල් කඳුළු හෙළමින් ඒ බව පිළිගනිති.

සමාජය යහමගට ගැනීමේ කර්තව්‍ය තම අයිතියක් ලෙස පවරාගෙන ඒ මතින් යැපෙන පිරිසක්ද සමාජය තුළ සිටිති. අද ඔවුන් කරන්නේ කුමක්ද? අනිත්‍ය ගැන මෙනෙහි කරමින් ජනතාවට බණ දේශනා කරන්නෝ දේපළවලට ගහමරා ගනිති. කිසිදු හිරිකිතයක් නැතිව අලි බොරු තෙපළති. මිනීමරුවන්ට, තක්කඩියන්ට පිරිත් නූල් බඳිති. නීතියෙහි ආධිපත්‍ය දරන්නෝ තම මෙහෙකාරියන් දූෂණය කරති. අල්ලසට, කප්පමට නීතිය පාවා දෙති. අලි පැටව් හොරකම් කරති. අලි හොරු රකිති. නීතිය පසිඳලන්නෝ කුලියට මිනී මරති. කප්පම් ගනිති. මත්ද්‍රව්‍ය ජාවාරම් කරති. මත්ද්‍රව්‍ය නාශක අංශය විසින් එක්තරා ඇමතිවරයෙක්ගේ නිවස පරීක්ෂා කළ අවස්ථාවේ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඔහුගේ නිවසට ගියේ තම සුවච කීකරු ගෝලයා බේරාගැනීමටය. බැඳුම්කර වංචාව හෙළිදරව්වී තිබියදීත්, යහපාලනය පිළිබඳව පාරම් බාන වත්මන් පාලකයෝ සැබෑ ලෙසම කරන දේ අද මුළු රටම දනී.

මේ සමාජය යහමගට ගැනීමේ කර්තව්‍ය පවරාගත් ඊනියා පරහිතකාමීන්ගේ වත්මන් ස්වභාවයයි. සංස්කෘතියෙහි නියාමකවරුන් ලෙස පෙනී සිටිනවුන්ගේ සැබෑ ස්වරූපය මෙය නම්, එකිනෙකා මරාගන්නා පාතාලයන්, තම දියණිය දූෂණය කරන පියවරුන්, තම දරුවන් මරා වළලන මව්වරුන්, තම ආච්චි අම්මා දූෂණය කරන තරුණ දරුවන් බිහිවීම පිළිබඳ ව පුදුම විය යුතු නොවේ.

අද අප අත් විඳින්නේ අන්තයට ම පිරිහුණු ආර්ථිකයක සමාජමය ප්‍රකාශනයයි. එම ප්‍රකාශනය විනිවිද දකින සැබෑ කලාවක්, සැබෑ සාහිත්‍යයක් අද අපට අවශ්‍ය ය. මිනිස් අධ්‍යාත්මය පෝෂණය කිරීම සඳහා එවැනි කලාවකින්, එවැනි සාහිත්‍යයකින් කළ හැකි මෙහෙය සුළුපටු නොවේ. එහෙත් පාලකයින්ට අවශ්‍ය එවැනි කලාවක් නොවේ. සමාජයේ සිදුවීම් තුලනාත්මක දෘෂ්ටියකින් යුතුව අගයන ජනතාවක් පාලකයන්ට අවශ්‍ය නැත. පාලකයින්ට අවශ්‍ය ස්වර්ථකාමී ලෙස හිතන පතන ජනතාවකි. සාධාරණය, අසාධාරණය පිළිබඳ නිවැරැදි දැක්මක් සහිත මිනිසුන් පාලකයින්ට අවශ්‍ය නොවේ. පාලකයින්ට අවශ්‍ය ඕනෑම අසාධාරණයක් ඉවසා දරා ගැනීමට හැකි ජනතාවකි. සහජීවන හැඟීමෙන් පෝෂිත මිනිසුන් පාලකයින්ට අවශ්‍ය නැත. සිය අසාධාරණ පාලන ක්‍රමයේ ස්ථාවරත්වය සඳහා ඔවුනට අවශ්‍ය සිය ආගම, ජාතිකත්වය වෙනුවෙන් ගහමරාගන්නා ජනතාවකි. "සාහිත්‍ය කන්නදැ"යි මෙරට ප්‍රථම විධායක ජනාධිපති ප්‍රශ්න කළේ නිකරුණේ නොවේ. රටට අවශ්‍ය ඉංජිනේරුවරයන් නොව මේසන් බාස්ලා සහ වඩුබාස්ලා යැයි දෙවන විධායක ජනාධිපතිවරයා කීවේද එම අදහසින්මය. සිව්වෙනි විධායක ජනාධිපතිවරියද කලා උපාධිය හෑල්ලු කරමින් කතා කළේ අරමුණු සහගතවය. පාලකයන්ට කලාව ඇලර්ජික් වී ඇත්තේ නිකරුණේ නොවේ. ඒ පසුපස ඇත්තේ පැහැදිලි දේශපාලන අවශ්‍යතාවයකි. කලාතුරකින් ප්‍රදර්ශනය කරන කැරට් අලයකට මුළා නොවී, පාලකයන්ගේ සැබෑ අරමුණු තේරුම් ගැනීමත්, ජනතාවගේ අධ්‍යාත්මික පෝෂණය සඳහා අත්‍යවශ්‍ය සැබෑ කලාව රැකගැනීමත්, කලාකරුවන්ගේත්, සාහිත්‍යවේදීන්ගේත් මෙන්ම, කලාවට, රටට, ජනතාවට ආදරය කරන සැමගේත්, යුතුකමක් සහ වගකීමක් ලෙස අපි දකිමු.

## නැතුව බැරි මිනිහෙක්

නාට්‍යකරුවකු විසින් ස්වීය අත්දැකීමක් හෝ වෙනයම් සිද්ධියක් මත පාදකව ලබාගත් අත්දැකීම් හෝ අත්දැකීමක් මත කරන ලද පරිකල්පනීය ප්‍රතිඵලයක් ලෙස අපූර්ව ස්වතන්ත්‍ර නාට්‍යයක් බිහිවේ. මෙලෙස නිපදවූ 'නැතුව බැරි මිනිහෙක්' නම් නාට්‍ය මෙරට වේදිකාව තුළ තම ප්‍රතිභාව ප්‍රකට කරන ලද වේදිකා නාට්‍ය නිෂ්පාදකයෙකු සේම අධ්‍යක්ෂකයෙකු වන රාජිත දිසානායකයන්ගේ නවතම නාට්‍ය නිෂ්පාදනය ලෙස නැතුව බැරි මිනිහෙක් ප්‍රේක්ෂාවට බඳුන්වේ. පාදඩ දේශපාලනයේ ගොදුරක් වෙමින් උඩුගං බලා පිහිනිය නොහැකි වසර පහෙන් පහට මෙරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පාට මාරුකරන්නා වූ කටුසු ස්වරූපයක් ඇත්තෙකු මෙහි ප්‍රධාන චරිතය වේ. පීඩිතයෙකු ලෙස පෙකණි වැල කැපූ දා සිට බහ තෝරන වයස තෙක් පැමිණි ගමන් මඟ තුළ ලත් අවබෝධය වී ඇත්තේ තම පංතියේම ජනයා මත පා තබා නැගිටීමේ කලාවයි.

මේ නිසාම සමකාලීන සමාජ පිළිබිඹුව තුළ ඇති යථාර්ථය සාධනීයව වේදිකාව මත දිගහරින ලද නාට්‍යෝචිත සිදුවීම් පෙළක් තුළ ඇති කථා සාරය මේ ප්‍රහසානාත්මක ලක්ෂණයෙන් පොහොසත්ය. පොරකකා ජීවත්වන නූතන ක්‍රමවේදයේ අතිධාවනකාරී ඩෝසර්කරණයට තම පවුලද හසුවන තෙක් නොදන්නා මනෝභාවයකින් යුත් ප්‍රධාන චරිතය වටා ගොඩනැගුණු කථා පුවතේ මෙරට දේශපාලන ඉතිහාසයේ දරුණුතම ප්‍රපාතයට තල්ලුවී ඇද වැටුණු රාජපක්ෂ රෙජීමයේ හපන්කම් හා එම පිරිසේ ක්‍රියාකාරිත්වය තිව්‍ර ලෙස වේදිකාව මත ගෙනහැර දක්වයි.

තාරුණ්‍යය සතු අයිතීන් උදුරා හිරගත කරන්නට වෙර දරන පියකුගේ හිස් බව නාට්‍ය අවසානයේ ප්‍රේක්ෂාවට එක් කරන්නේ සංවේග ජනිත අවසානයක් තුළ රඳවමින්ය. ප්‍රවීණ රංගන ශිල්පීන් හා ශිල්පිනියන්ගේ දායකත්වය හා අපූර්ව අනුශාංගික අංගයන්ගේ සංකලනය මත මෙය පෙළ ගැස්වෙන අතර ලාංකේය ප්‍රධන දේශපාලන ප්‍රවාහයන් දෙකෙහි කෙරුවාව තුළ අසරණ වන ජීවිත පිළිබඳව කියැවෙන නාට්‍යාත්මක අත්දැකීමක් මෙරට වේදිකාවට එක්වී ඇත්තේ නැතුව බැරි මිනිහෙක් ලෙසින්ය.



# කලාව, කලාකරුවා හා ජනතාවගේ රසවින්දනය

**2016 සැප්තැම්බර් 08වැනි දින පාර්ලිමේන්තුව තුළ කල්තැබීමේ විවාදය අවස්ථාවේ "කලාවේ වත්මන් අර්බුදය" පිළිබඳව ජ.වි.පෙ. නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර දිසානායක සහෝදරයා විසින් කරන ලද කථාව තුළින් උපුටා ගන්නා ලද කොටස් කිහිපයක් පහත දැක්වේ.**



"අපේ රටේ සාහිත්‍යය, ටෙලි නාට්‍ය, චිත්‍රපට, වේදිකා නාට්‍ය ඇතුළු කලා ක්ෂේත්‍රය තුළ පැන නැගී ඇති ගැටලු ගණනාවක් නිසා නිර්මාණ බිහිවීමට කලාකරුවා පෙළඹවීම වෙනුවට, එකී ක්ෂේත්‍රයන් තුළින් ඔවුන් පිටමන් කිරීමේ තත්වයක් වර්තමානයේ පැනනැගී ඇත. ආණ්ඩු පත්කිරීමේදී ඔවුන් වෙතද බලාපොරොත්තු ඇති කර මැතිවරණ ප්‍රකාශනවලට ප්‍රතිපත්ති, පොරොන්දු, වැඩපිළිවෙළවල් ඇතුළත් කරන පාලකයන් විසින් කර ඇත්තේත්, වර්තමාන පාලනය විසින් සිදු කරන්නේත්, නිසි විසඳුම් සඳහා ආණ්ඩුවක කාර්යභාරය කරනු වෙනුවට ආණ්ඩුවක් විසින් යොමු කළ යුතු අවධානයද යොමු නොකර මගහැර සිටීමයි. මෙම තත්වය නිසා රටක ජනතාවකට ලැබිය යුතු කලා රසවින්දනය අහිමි වී ඇත. ඒ මගින් නූතන පරපුර නිර්මාණාත්මක කලා නිර්මාණයක් පරිශීලනයට නොලැබෙන ; විශේෂයෙන්ම තම නිවසේ රූපවාහිනියෙන් කැමති වුවත් නැතත් නැරඹීමට සිදුවන බාල වර්ගයේ ටෙලි නාට්‍ය හෝ හඬ කවන ලද විදේශීය ටෙලි නාට්‍ය නරඹන, අතර මං වූ නරඹන්නන් පිරිසක් බවට පත්ව ඇත.

මෙම තත්වය වෙනස් කොට නිර්මාණකරුවන් ඇතුළු කලා ක්ෂේත්‍රයේ සියලු ශිල්පීන්ගේ, ඔවුන්ගේ නිර්මාණ හා නියැලි භූමිකා ආරක්ෂා කිරීමටත්, උසස් රසවින්දනයකට ජනතාවට ඇති අයිතිය තහවුරු කිරීමටත්, ආණ්ඩුව විසින් ජාතික වගකීමක් ලෙස සලකා ප්‍රතිපත්ති තීරණ ඇතුළු අවශ්‍ය පියවරයන් ගෙන නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වයට අවශ්‍ය ඉඩකඩ සලසා දිය යුතු බවට යෝජනා කර සිටී."

අපි අද මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් කරනු ලබන්නේ අපේ රටේ සමාජය යහපත් අතට යොමු කිරීම සඳහා එහි අධ්‍යාත්මික වර්ධනය කිරීම සඳහා බලපෑම් කරනු ලබන සාහිත්‍ය කලා ක්ෂේත්‍රය පිළිබඳව සහ එම ක්ෂේත්‍රය මුහුණ දී තිබෙන ගැටලුත්, එම ක්ෂේත්‍රයේ නියැලී සිටින නිර්මාණකරුවන් මුහුණ දී සිටින ගැටලුත්, ප්‍රේක්ෂකයන්ට ඇති වී තිබෙන තත්වයත් පිළිබඳවයි. හැබැයි, මුළු සමාජයක් බිඳ වැටී තිබෙන මොහොතක මේ ක්ෂේත්‍රය පමණක් ආලෝකමත් කුළුණක් ලෙස වැජඹේ යැයි අපි විශ්වාස කරන්නේ නැහැ. අප ඉදිරිපිට තිබෙන්නේ නියෝජ්‍ය පොලිස්පතිවරු කප්පමට මිනී මරණ සමාජයක් නම්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරු ඝාතකයන් සොයනවා වෙනුවට ඝාතකයන් ආරක්ෂා කරන සමාජයක් නම්, අලි හොරකම් කරන විනිසුරුවරුන් සිටින සමාජයක් නම්, ගෙදර මෙහෙකරුවන් දූෂණය කරන විනිසුරුවරුන් ගොඩනැගෙන සමාජයක් නම්, අවුරුදු 80ක ආච්චි අම්මලා දූෂණය කරන අවුරුදු 17-18 දරුවන් නිර්මාණය වෙලා තිබෙන සමාජයක් නම් සියලු මානව සබඳතා බිඳ වැටෙනවා. ගායකයින් යැයි කියා ගන්නා සමහර අය වේදිකාවට නැගලා 'අම්මට' 'අම්මට' කියන කොට ඒකට අත්වැල් අල්ලන ප්‍රේක්ෂකයන් සිටින සමාජයක් අද අප ඉදිරිපිට තිබෙනවා නම් අද මේ සමාජය නරුම සමාජයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේ සියල්ල බිඳ වැටී තිබෙන තැනක, කලා, සංස්කෘතික ක්ෂේත්‍රය පමණක් ආලෝකමත් කුළුණක් ලෙස ආරක්ෂා වනවා යැයි අපි කිසිසේත්ම විශ්වාස කරන්නේ නැහැ. "බුලත් කොක්කණයට හෙණ ගැහැවාට පස්සේ කිල්ලෝටය බලන්නේ නැතිවම විසි කරන්න" කියනවා. මේ විදියට මුළු සමාජයම නරුම සමාජයක් බවට පරිවර්තනය වෙලා තිබෙන වෙලාවක එක ක්ෂේත්‍රයක් පමණක් ආරක්ෂා වේවි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒකට අපිට ප්‍රතිපත්තිමය අදහසක් තිබෙනවා.

1848දී කොමියුනිස්ට් ප්‍රකාශනය කාල් මාක්ස් මෙහෙම කියනවා:

**"... ආගමික භක්තියද, ධීර - වීර උනන්දුවද, අවරසිකවාදී අනුරක්තතාවද අරහයා වූ ස්වර්ග මය ආනන්දයත් ආත්මාර්ථකාමී ගණන් බැලීම නැමති අයිස් වතුරේ ගිල්වා දමන ලදී. එය පෞද්ගලික අගය හුවමාරු වටිනාකම බවට පෙරළන ලදී. එමෙන්ම සංඛ්‍යා විරහිත, උදුරාගත නොහැකි, වර සහිත නිදහස් අයිතීන් වෙනුවට හෘදය සාක්ෂියට කොහෙත්ම එකඟ නොවන එකම නිදහස වන වෙළඳාම් කිරීමේ නිදහස පිහිටුවාලීය.."**

ඒක තමයි තමුන්නාන්සේලා අනුගමනය කරන ප්‍රතිපත්තිය. එකම නිදහස, වෙළඳාම් කිරීමේ නිදහස.

ඒ විතරක් නොවෙයි. තවදුරටත් මෙහෙම කියනවා:

"නිෂ්පාදනයේ ඇති වන ස්ථාවර විප්ලවීය වෙනස්වීම්, සියලු සමාජීය සබඳතාවල ඇති වන නිරන්තර කැළඹවීම්, සදාකාලික අවිනිශ්චිතතාව සහ ගාමකත්වය විසින් ධනවාදී යුගය අන් සියලු යුගවලට වඩා වෙනස් වේ. සියළු පෞරාණික වූත්, පූජනීය වූත් ප්‍රාග් විනිශ්චයන් සහ මත සහිත පාෂාණීභූත යකඩ මල බැඳුණු සියලු සබඳතාවයන් විනාශ වී යන අතර, අලුතින් ඇති වන සියලු සබඳතාවයන් අස්ථිකරණයට භාජනය වීමටත් පෙර ඒවා යල් පැන යයි. ඝන වූ හැම දෙයක්ම උණු වී වාතය බවට පෙරළේ. ශුද්ධ වූ හැම දෙයක්ම කෙලෙසෙන්නේය. අවසානයේදී මිනිසාට, තම ජීවිත තත්වය සහ තම වර්ගයා සමග ඇති අන්‍යෝන්‍ය සබඳතාවයන් දෙස සන්සුන් සිතින් බැලීමට අවශ්‍යතාවක් ඇති වේ."

අද ඇති වී තිබෙන තත්වය ඒක. පන්සල සහ දායක සභාව අතර සබඳතාව බිඳවැටී තිබෙනවා නම්, ගුරුවරුන් සහ දරුවන් අතර සබඳතාව බිඳවැටී තිබෙනවා නම්, දෙමාපියන් හා දරුවන් අතර සබඳතාව බිඳවැටී තිබෙනවා නම්, සියලු මිනිස් සබඳතා බිඳවැටී තිබෙනවා නම්, මිනිස් සමාජයටත් තම වර්ගයාටත් බලකර තිබෙනවා, "මේ තත්වය පිළිබඳව සන්සුන් සිතින් බලන්න" අද මේ සමාජයේ ඇති වී තිබෙන මේ ඛේදවාචකය අප හැම දෙනාටම බලකර සිටිනවා. "මේ ඇති වී තිබෙන ඛේදවාචකය දෙස විවෘත, සන්සුන් මනසින් බලන්න." කියලා. ඒ සඳහා අපි තමුන්නාන්සේලාට ආරාධනා කරනවා. මා දන්නේ නැහැ තමුන්නාන්සේලා ඒකට සූදානම් වෙයිද කියලා. මොකද, සන්සුන් වීමට හෝ විවෘත වීමට හෝ මොනතරම් සූදානම්ද කියන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. හැබැයි, අපි සන්සුන් මනසින් විවෘතව මේ ඛේදවාචකය දෙස බැලිය යුතු වෙනවා. මිනිස් ආධ්‍යාත්මය පෝෂණය කිරීමේදී, වඩාත් ගුණවත් සමාජයක් නිර්මාණය කිරීමේදී, අපේ රටේ සාහිත්‍යයට කලාවට විශාල කාර්යභාරයක් පැවරී තිබෙනවා.

හැබැයි, වෙළඳාම පමණක් නිදහස් වූ සමාජයක තමුන්නාන්සේලා ඒකට දීපු අර්ථකතන මොනවාද? අපට මතකයි, අපේ රටේ පළමු විධායක ජනාධිපතිවරයා කිව්වා, ඔහුට සාහිත්‍ය වැඩක් නැහැ. එය මුදල් හම්බ කිරීමේ මාධ්‍යයක් නෙවෙයි කියලා. අපට මතකයි අපේ රටේ දෙවැනි විධායක ජනාධිපතිවරයා කිව්වා, ඔහුට ඉංජිනේරුවන් අවශ්‍ය නැහැ. වඩුකාර්මිකයන් - වඩු බාස්ලා - හිටියොත් ඇති. කියලා. අපට මතකයි, අපේ රටේ හතර වැනි ජනාධිපතිවරිය කිව්වා, කලා උපාධිය වැඩක් නැහැ. කියලා. ඒ අනුව රාජ්‍ය මට්ටමින්ම සාහිත්‍යය පිළිබඳව කලාව පිළිබඳව, මිනිසාගේ ආධ්‍යාත්මික පෝෂණය පිළිබඳව තමුන්නාන්සේලාගේ වටිනාකම්, තමුන්නාන්සේලාගේ ඇගයීම්, තමුන්නාන්සේලාගේ නායකයන් විසින් ඉදිරිපත් කර තිබෙනවා. ඊට වඩා අලුත් එකක් නොවෙයි මේ ආණ්ඩුව. අපි කිසිසේත්ම මේ ආණ්ඩුවෙන් ඊට වඩා අලුත් දෙයක් බලාපොරොත්තු වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා අලුත් දෙයක් ඇති කරන්න සූදානම් වෙන බවක් පෙන්නුම් කරන්නේවත් නැහැ.

මේ අමාත්‍යංශය රටේ ප්‍රබල අමාත්‍යංශයක් බවට පත් කරනවාය කිවුවා. අයවැය ලේඛනයෙන් විශාල මුදල් ප්‍රමාණයක් මේ අමාත්‍යංශයට යොමු කරනවාය කීවා. රටේ සංවර්ධනයේදී සැලකිය යුතු දායකත්වයක් ලබා ගන්නා ක්ෂේත්‍රයක් බවට මේ ක්ෂේත්‍රය පත් කරනවාය කියලා ජනාධිපතිවරණයේදී කීවා. හැබැයි මොකක්ද කළේ. සංස්කෘතික අමාත්‍යංශයට ඇමතිවරයෙක් පත් කළා. ඇමතිතුමනි, තමුන්නාන්සේ ළඟ තිබෙන්නේ, ඒකේ පිට පොත්ත පමණයි. එහි මදය ගලවලා තමන්ගේ හිතවාදී අමාත්‍යවරුන්ට පවරන තත්වයක් නිර්මාණය කරලා තිබෙනවා. ගරු එස්.බී. නාවින්න ඇමතිතුමනි, තමුන්නාන්සේගේ ආමාත්‍යංශය මොකක්ද? සංස්කෘතික අමාත්‍යංශයත්, ආගමන විගමන අමාත්‍යංශයේ කොටසකුත්, වයඹ සංවර්ධනයත් තමයි තමුන්නාන්සේට දීලා තිබෙන්නේ. ඒක හරියට සිමෙන්ති, ෆැන්ටා, ගස්ලබු එකතු කරලා හදපු 'සැලඩ්' එකක් වගෙයි. මොකක්ද තමුන්නාන්සේගේ මේ අමාත්‍යංශය? මේ ක්ෂේත්‍රය පිළිබඳව වැදගත් අවධානයක් යොමු කොට මෙහෙය වීම සඳහා මධ්‍යගත ආයතනයක අවශ්‍යතාව තිබුණා. මේ ක්ෂේත්‍රය මොන ආකාරයෙන් වර්ධනය කළ යුතුද, මොන ආකාරයෙන් ආරක්ෂා කළ යුතුද කියන එක පිළිබඳව මේ අමාත්‍යංශ වෙන් කිරීම මගින් තමුන්නාන්සේලාගේ දැක්ම පෙන්නුම් කරලා තිබෙනවා. ඒ අනුව, පරණ නායක කාරකාදීන්ට වඩා අබමල් රේණුවකින් වත් තමුන්නාන්සේලා වෙනස් වෙලා නැති බවයි පෙන්නුම් කර තිබෙන්නේ. මේ ක්ෂේත්‍රය අතිශය වැදගත් බව අපි දන්නවා. අපි සංවර්ධනය කියලා කියන්නේ ගොඩනැගිලි, පාලම්, මහ පාරවල් ගොඩනැගීම පමණක් නොවේ. මිනිසුන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය කිරීමකින් තොරව, සමාජයේ මානව බැඳීම් ශක්තිමත් කිරීමකින් තොරව, ඒ සමාජය යහපත් සමාජයක් බවට පරිවර්තනය කිරීමකින් තොරව, ඒ සමාජය ලාභ හා මුදල් හඹා ගෙන යන අධි පරිභෝජනවාදී සමාජයකට පත් කිරීමෙන් මේ රට ඉදිරියට ගෙන යන්න බැහැ. ඒ නිසා වැදගත් ලෙසම අපේ සමාජයේ මානව බැඳීම් ශක්තිමත් කරන, ආධ්‍යාත්මික බැඳීම් වර්ධනය කරන ප්‍රවේශයකට අප අවතීර්ණ විය යුතු වෙනවා.

මේ සමාජය වෙනස් කිරීමේදී කලාවට, සාහිත්‍යයට කළ හැකි කාර්යභාරය අති මහත් කියලා අපි කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. ඒ නිසා සමාජය සුවපත් කිරීමේදී, ආධ්‍යාත්මික වශයෙන් මිනිසා පෝෂණය කිරීමේදී,ආධ්‍යාත්මික වශයෙන් මිනිසා ඉදිරියට ගෙන ඒමේදී අත් හළ නොහැකි වගකීමක් මේ ක්ෂේත්‍රයට පැවරී තිබෙනවා. නිර්මාණකරුවකු සමාජය වෙත ගෙන යන තමන්ගේ නිර්මාණ පිළිබඳ සංකල්පය නිර්මාණකරුවාගේ මොළයේ ඇති වන්න පුළුවන්. හැබැයි, එම නිර්මාණය සමාජය වෙත ගෙන යන ප්‍රධාන මාධ්‍යයන් කිහිපයක් තිබෙනවා. ඒ මාධ්‍ය අතරින් එකක් තමයි චිත්‍රපට නිර්මාණය. මේ සමාජය වෙත එම නිර්මාණයන් ගෙන යන තව මාධ්‍යයක් තමයි ටෙලි නාට්‍ය. ඒ වගේම වේදිකා නාට්‍ය, පත පොත යනාදිය තවත් මාධ්‍යයයන්. ඒ වගේම වීදි නාට්‍ය වැනි විකල්ප ධාරාවේ අංගෝපාංගද මේ නිර්මාණයන් සමාජය වෙත ගෙන යෑම වෙනුවෙන් උපයෝගී කර ගෙන තිබෙනවා.

**මේ සමාජය වෙනස් කිරීමේදී කලාවට, සාහිත්‍යයට කළ හැකි කාර්යභාරය අති මහත් කියලා අපි කවුරුත් පිළිගත යුතුව තිබෙනවා. ඒ නිසා සමාජය සුවපත් කිරීමේදී, ආධ්‍යාත්මික වශයෙන් මිනිසා පෝෂණය කිරීමේදී,ආධ්‍යාත්මික වශයෙන් මිනිසා ඉදිරියට ගෙන ඒමේදී අත් හළ නොහැකි වගකීමක් මේ ක්ෂේත්‍රයට පැවරී තිබෙනවා.**

සංගීතය ඇතුළු හැම ක්ෂේත්‍රයක්ම උපයෝගී කර ගන්නවා. විවිධ මාධ්‍යයයන් උපයෝගී කර ගන්නවා මේ නිර්මාණ සමාජය වෙත ගෙනයන්න. දැන් මොකක්ද සිදු වී තිබෙන්නේ. චිත්‍රපටයක් වේවා, ටෙලි නාට්‍යක් වේවා, වේදිකා නාට්‍යක් වේවා, සංගීත ප්‍රසංගයක් වේවා, විකල්ප ධාරාවේ ක්‍රියාමාර්ග වේවා ඒ මාධ්‍ය සියල්ල ක්ෂේත්‍රයක් හැටියට අද අර්බුදයකට මුහුණ දී තිබෙනවා. ඒවා ක්ෂේත්‍රයක් හැටියට අර්බුදයකට මුහුණ දී තිබෙනවා පමණක් නොවෙයි, එම ක්ෂේත්‍රයේ නිර්මාපයකයන්ද, නිර්මාණකරුවන්ද විශාල අර්බුද ගණනාවකට මුහුණ දී සිටිනවා. ඒ විතරක් නෙවෙයි. නිර්මාණ රසවිදින ප්‍රේක්ෂකයිනුත් අද තමන්ට සිදුවන විශාල අසාධාරණයකට, අයුක්තියකට මුහුණ දී සිටිනවා. ඒ නිසා මේ ක්ෂේත්‍රයත්, එහි නිර්මාණකරුවනුත්, ප්‍රේක්ෂකයිනුත් ඇති වී තිබෙන මේ ඛේදවාචකයෙන් මුදා ගැනීම වෙනුවෙන්, ගොඩනැගීම වෙනුවෙන් වැඩපිළිවෙලක් සකස් කළ යුතුව තිබෙනවා.

සංවර්ධනය කියන්නේ ගොඩනැගිලිද, පාරවල්ද, මංමාවත්ද? සංවර්ධනය කියන්නේ ඒවා විතරක් නොවෙයි. මිනිස් සමාජය අධ්‍යාත්මයෙන් පෝෂණය කිරීමකින් තොරව සමාජයක් පවතින්නේ නැහැ. අද සමාජයට ඇතිවී තිබෙන ඛේදවාචකය මේකයි. විශේෂයෙන් 1977න් පස්සේ අපේ සංවර්ධනය පිළිබඳ නිර්ණායක වෙනස් වුණා. ඒ අනුව සංවර්ධනය කියන්නේ ගොඩනැගිලි බවට, සංවර්ධනය කියන්නේ පාරවල් බවට, සංවර්ධනය කියන්නේ ලයිට්, වතුර බවට ඒ නිර්ණායක වෙනස් වුණා. ඒවා අවශ්‍ය නැහැයි කියලා නොවෙයි මම කියන්නේ. හැබැයි, ඒ හා සමගාමීව මිනිසුන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය කෙරෙහිත් අවධානය යොමු කළ යුතුව තිබෙනවා. ඒ සියල්ල අත්හැරපු ගමනකට තමුන්නාන්සේලා යොමු වෙලා තිබෙනවා. අයවැය ලේඛනය දිහා බැලුවාම පෙනෙනව, අයවැය ලේඛනයේ මුළු ක්‍රියාවලියේම මොකක්ද තිබෙන්නේ කියලා. මුළු ක්‍රියාවලියෙන්ම වැඩිපුර අවධානය යොමු කරලා අයවැය ලේඛනය ගොඩනැගලා තිබෙන්නේ, පාරවල්. මංවාවත්වලටයි. හැම ඇමතිවරයාම, හැම ජනාධිපතිවරයාම පුරාජේරු ගහන්නේ මොකක් කියලාද? ඒ අය, "මම පාරවල් හැදුවා. මම පාලම් හැදුවා." කියනවා. හැබැයි, "මම රඟහල් හැදුවා" කියලා කිසි කෙනෙක් කියනවාද? කවුරුවත් එහෙම කියන්නේ නැහැ. හිටපු ජනාධිපතිතුමාට "නෙළුම් පොකුණ රඟහල හැදුවා." කියලා කියන්න පුළුවන්. හැබැයි, ඒකේ නාට්‍යකරුවන්ට නාට්‍යයක් පෙන්වන්න බැහැ. ඒකේ ව්‍යාපාරිකයන්ට Function තියන්න පුළුවන්. රඟහලට පමණක් රුපියල් ලක්ෂ අටක් ඕනැ. රුපියල් ලක්ෂ අටක් දීලා රඟහල අරගෙන නාට්‍යයක් පෙන්වන්නේ කොහොමද? ඔක්කොම වියදම් එකතු කළොත් ඒ රඟහලට රුපියල් ලක්ෂ 10ක් පමණ යනවා. එතකොට එතන නාට්‍යයක් පෙන්වන්න පුළුවන්ද?

මම අවසාන වශයෙන් මෙන්න මේ කාරණයත් කියනවා. දැන් ඇතිවෙලා තිබෙන තත්වය පිළිබඳව තමුන්නාන්සේලා මීට වඩා අවධානය යොමු කරලා මේ ක්ෂේත්‍රය වර්ධනය කරන්නත් මේ ක්ෂේත්‍රයේ අනාගතය පිළිබඳව කල්පනා කරල මේ ක්ෂේත්‍රය වඩාත් හොඳ දිශාවකට යොමු කිරීම කෙරෙහි අවධානය යොමු කරන්න ඕනැකම තියෙනවා. 1965දී සාහිත්‍ය පිළිබඳ නොබෙල් ත්‍යාගය ලබාගත් සෝවියට් දේශයේ අග්‍රගණ්‍ය සාහිත්‍යවේදී මිහායිල් ෂොලහොව් එම ත්‍යාගය ලබා ගනිද්දී ඉතා වැදගත් ප්‍රකාශයක් කළා. එය මෙසේයි.

**"මානව වර්ගයාගේ බුද්ධියට හා හදවතට බලපෑම් කිරීමට සමත් විශිෂ්ට හැකියාවක් කලාව සතුව ඇත්තේය. මා අවංකවම අදහන පරිදි යමෙකුට තමා කලාකරුවෙක් යැයි හඳුනා ගැනීම සඳහා පූර්ණ හිමිකමක් ඇත්තේ, ඔහු මෙම ශක්තිය මිනිසුන්ගේ හදවත් තුළ අලංකාර ලෝකයක් නිර්මාණය කිරීම සඳහා යොදා ගන්නේ නම් පමණි. මගේ කෘති මානව වර්ගයාගේ සිත් සතන් වඩාත් නිර්මල කිරීමට, වඩාත් යහපත් වීම සඳහා මග පෙන්වීමට ඉවහල් වන්නේ නම් මම ඒ පිළිබඳව හුදෙක්ම සතුටු වෙමි. එසේ මාගේ කෘති මගින් තම සගයන් වෙත ආදරය දැක්වීමට, මානව වර්ගයාගේ අභිවෘද්ධිය උදෙසා සටන් වැදීමට මිනිසා පොළඹවනු ලබන්නේ නම් මම ඒ පිළිබඳව අවංකවම සතුටු වෙමි."**

මම මගේ කතාව අවසන් කරන්නේ "නිර්මාණකරුවන්ගේ නිර්මාණය සහ නිර්මාණකරුවන්ගේ ස්වාධීනත්වය" පිළිබඳ ප්‍රශ්නය අවධානයට යොමු කරමින්. අපි දන්නවා නිර්මාණකරුවන්ට තමන්ගේම වූ දේශපාලනයක් තිබෙනවා කියලා. ඒ කිසිවෙක් කවර හෝ දේශපාලන වේදිකාවකට නැගීම විවේචනයට ලක් නොවිය යුතුයි. ඒ තමන්ගේ දේශපාලන දැක්ම. ඔහු නාට්‍යකරුවෙක් වෙන්න පුළුවන්. චිත්‍රපටකරුවෙක් වෙන්න පුළුවන්. වෙනත් නිර්මාණය ක්ෂේත්‍රයක සිටින කෙනෙක් වෙන්න පුළුවන්. ඔහු මේ සමාජයේ පුද්ගලයෙක්. එනිසා ඔහුට අනන්‍ය දේශපාලනයක් කිරීමේ අයිතිය තිබෙනවා. එනිසා කවර හෝ රංගන ශිල්පියෙක් කවර හෝ වේදිකාවකට නැගුණාය කියා අපට ඔවුන් කෙරෙහි කිසිම දේශපාලන විවේචනයක් නැහැ. හැබැයි අපට විවේචනයක් තිබෙනවා. ඔවුන් තමන්ට ගොඩනැගී තිබෙන සමාජ වටිනාකම ඉතා අඩුවට ලංසු තබමින් විකිණීම පිළිබඳව තමයි අපට ගැටලුවක් මතුවෙලා තිබෙන්නේ.

අපේ රටේ සාහිත්‍ය ක්ෂේත්‍රයට පරිවර්තන විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළ සිරිල් සී. පෙරේරා ලේඛකයා ඊයේ පෙරේදා අපෙන් සදහටම සමුගත්තා. අපි කාටත් මේ සමාජය පිළිබඳව අලුතින් හිතන්න, සමාජය පිළිබඳව අලුත් දිශාවකින් කල්පනා කරන්න, ඔහු කරන ලද දායකත්වය ඉතාමත් වැදගත් කියා කල්පනා කරනවා. ඒ නිසා ඔහුට අපේ ගෞරවය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. අපේ කලාකරුවන්ගෙනුත්, රටේ මහජනතාවගෙනුත් මේ ඉල්ලීම කරමින් මගේ කතාව අවසන් කරනවා. මැක්සිම් ගෝර්කිගේ "ඉසර්ගී මැහැල්ල" කතාවේ මෙහෙම සඳහන් වෙනවා. **"අප කල්පනා කළ පමණින් පාරේ තිබෙන කළු ගල් ඉබේ ඉවත් වෙන්නේ නැහැ. අපි මේ කැලෑව මැදින් ඉදිරියට යමු. කොහේ හෝ මේ ඝන කැලෑවට අවසානයක් තිබෙන්නට ඕනැ"** සහතිකයි.

මේ ඝන කැලෑවට කොහේ හෝ අවසානයක් තිබෙනවා. හැබැයි අපි නිකං කල්පනා කරමින් හිටියාට පාරේ තිබෙන කළු ගල් ඉබේ ඉවත් වෙන්නේ නැහැ. මේ කැලෑව මැදින්ම පීරන්න ඕනැ. අපි සහතික වශයෙන්ම දන්නවා, මේ ඝන කැලෑවට අවසානයක් තිබෙන බව. ඒ අවසානය වෙනුවෙන් සැම දෙනාටම එකතු වන්නයි කියන ආරාධනය කරමින් මම නතර වෙනවා.

**Traffic.. >>04 පිටුවෙන්**

දෙයක් වෙනස් වෙන්නේ නෑ. හැම දවසක් වගේම අද දවසත් ගෙවිලා යාවි. අමතක වෙලා යාවි. හැබැයි ඔයා පුළුවන් කියලා කිව්වොත්, මුළු ඉතිහාසයම වෙනස් වෙන්න පුළුවන්. ඒක උදාහරණයක් වේවි හැම දුෂ්කර අවස්ථාවකම කෙනෙකුට පුළුවන් කියන්න හැකි වෙන විදිහේ ආදර්ශයක් දෙන්න.'

දිනය නිමා කර නිවසට යන ගොඩ්බුලේට වාහන ආරවුලක් නිසා මහ මඟ වාදයකට පටලැවුණු මිලියන ගණනක් වන මිනිසුන්ගෙන් දෙදෙනෙකු හමුවේ. ඔහු පොලිස් කොස්තාපල් කෙනෙකු නොව දාර්ශනිකයෙකුගේ වේෂයෙන් ඔවුන් අමතා මෙසේ පවසයි.

'කවුද නවතින්නේ, කව්ද යන්නේ කියන එක තීරණය කරන්නේ පාට දෙකක්. ඒ වෙනකං, එක මොහොතකට අපි බලාපොරොත්තු පොදි බැඳගෙන මාවතේ නතර වෙලා ඉන්නවා'

සැබෑ වීරයන් යනු ඉතිහාස පොතේ හමුවන මිනිසුන් නොව, අතිශය දුෂ්කර හා අවාසිසහගත අවස්ථාවල තමන් අමතක කර අනුන් වෙනුවෙන් තීරණ ගන්නා මිනිසුන් බව මෙම කෘතිය අපට පසක් කරයි. අප මුහුණ දී සිටින්නේ එවැනි මිනිසුන් වැඩි වැඩියෙන් අවශ්‍ය යුගයකටය.

# ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාව




සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු සහ ප්‍රවීන රංගන ශිල්පියකු සහ නාට්‍ය අධ්‍යක්ෂවරයකු වන ප්‍රසන්නජිත් අබේසූරිය මහතා විසින් 'ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාව' යන මැයෙන් වීදි නාට්‍ය කලාවේ ප්‍රභවය විකාශනය හා වර්තමාන තත්වය පිළිබඳව විමර්ශනාත්මක කෘතියක් 2016.10.26 දින සෞන්දර්ය කලා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදී එළි දක්වන ලදී. 71 අරගලයෙන් පසු එතෙක් පැවති රසාස්වාදය පමණක් අරමුණු කරගත් කලා මාධ්‍යයන් යථාර්ථය පිළිබිඹු කරන වඩාත් ජනතාවාදී කලා භාවිතයන් ස්පර්ශ කරන දිසාවකට යොමුවිය. කවිය, ගීතය, වේදිකාව හා සිනමාව මෙම දශකයේදී ප්‍රබලව නැගී සිටියේ 71 අරගලයෙන් පසු අවධි වූ ජන සමාජය තුළය.

එතෙක් පැවැති සම්ප්‍රදායික නාට්‍ය ආකෘතීන් පුපුරුවා හරිමින් 1974 වසරේ විකල්ප නාට්‍ය කලාවක් ලෙස වීදි නාට්‍ය කලාව ආරම්භ වීමේ සමාජ දේශපාලනික පරිසරය ගොඩනැගෙන්නේ එලෙසිනි. දෙස් විදෙස් රංග කලාවන් පිළිබඳව මනා අධ්‍යනයකින් හා හසල දැනුමකින් හෙබි ආචාර්ය ගාමිණී හත්තොටුවේගම යන් ප්‍රමුඛ "විවෘත" වීදි නාට්‍ය කණ්ඩායම 1974 සිට දශක හතරකට වැඩි කාලයක් අද දක්වාම වැඩ බිමේ, බස් නැවතුමේ, පොළ බිමේ, වීදියේ, අරගල බිමේ හත්තොටුවේග මයන්ගේ අභාවයෙන් නොනැවතී සිය ජනතාවාදී කලා මෙහෙවර ඉටුකරමින් සිටී. පසුගිය දශක හතරකට වැඩි කාලය තුළ වීදි නාට්‍ය කණ්ඩායම් කලා මාධ්‍යයක් ලෙස විකල්ප කලා සංස්කෘතියක් බවට පත්වී ආචාර්ය ගාමිණී හත්තොටුවේගම ප්‍රමුඛ විවෘත වීදි නාට්‍ය කණ්ඩායම සමග 80 දශකයේ මුල සම්බන්ධ වන ප්‍රසන්ජිත් අබේසූරිය දශක දෙකකට වැඩි කලක් සිය ජනතා මෙහෙවර ඉටුකර "පහුර" නමින් වීදි නාට්‍ය කණ්ඩායමක් ගොඩනගා අද වනතුරුත් මෙම විකල්ප නාට්‍ය කලාව තුළ සිය මෙහෙවර ඉටුකරන නිර්මාණකරුවෙකි. වර්තමාන සමාජ දේශපාලනික පසුබිම තුළ වඩ වඩාත් විකල්ප කලා භාවිතයන්ගේ අවශ්‍යතාවය මුළු මහත් සමාජය ඉල්ලා සිටින මොහොතක ශ්‍රී ලංකාවේ වීදි නාට්‍ය කලාව පිළිබඳව සංවාදය ග්‍රන්ථයක් මගින් කරළියට ගෙන ඒම සුවිශේෂී මෙහෙයකි.

# සැණකෙළියක්ද ප්‍රදර්ශනයක්ද?

18 වන වරටත් කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය සැප්තැම්බර් මාසයේ පවත්වා මාසයකට වැඩි කාලයක් ගෙවී ගොස් තිබේ. මෙවර පොත් ප්‍රදර්ශනය සඳහා ප්‍රකාශකයන් 300ට වැඩි පිරිසක් සම්බන්ධ විය. පොත් කියවන, පොත් මිලදී ගන්නා පාරිභොගිකයන් හා පාඨකයන් සැප්තැම්බර් මාසයේ දිනක් හෝ දෙදිනක් මෙම ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයට පැමිණීමට කාලය වෙන්කරගෙන සිටී.



පරිශයක් දැරීමට සිදුවිය. එමෙන්ම එහි පැමිණි පිරිසට පොත් මිල දී ගැනීමට මෙන්ම කෙටිකෑම, අයිස්ක්‍රීම්, පැණි බීම වර්ග හා කෘත්‍රිම රසකාරක යෙදූ ආහාර විකිණීමට තිබුණේ පොත් වලටත් වඩා වැඩි තරඟකාරී ලෙසය.

කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය තුළ කුඩා පොත් ප්‍රකාශකයෝ හට සැමදාමත් සිදුවූ පරිදි තමන් යෙදූ කුලී මුදල හා අනිකුත් වියදම් පියවා ගැනීමට නොහැකිව අසරණවූ බවයි. ශ්‍රී ලංකාවේ ලියාපදිංචි පොත් ප්‍රකාශකයන් 800ටත් වැඩි ප්‍රමාණයක් දිවයින පුරා විසිරී සිටිති. එහෙත් පොත් ප්‍රකාශකයන් 300ට ආසන්න පිරිසක් මෙම ප්‍රදර්ශනය හා සම්බන්ධවීම ඊට හේතුවේ. කෙසේ වෙතත් පොත් ප්‍රකාශකයන්ගේ සංගමය මුදලාලි කරනයට හසුවී තිබීම නිසා පාඨකයන්ට මීට වඩා වට්ටමක් සහිතව ගුණාත්මක පොතක් මිලදී ගැනීමට ඇති අවස්ථාව ඔවුන් විසින් වලක්වා තිබේ. ජනතාවට ගුණාත්මක පොතක් කියවීමට හා මිලට ගැනීමට ඇති පුරුද්ද වර්ධනය කිරීම වෙනුවට ඔවුන් ගුණාත්මක පොත් කියවීමෙන් ඈත් කිරීම මෙම ප්‍රදර්ශනය හරහා ක්‍රමක් ක්‍රමයෙන් සිදුවන බවට නිරීක්ෂණය කරන ඕනෑම කෙනෙකුට වැටහේ.

මෙම පොත් ප්‍රදර්ශනය අද වන විට ප්‍රදර්ශනයකින් එහා ගිය සැණකෙළියක් දක්වා වර්ධනයවී තිබේ. විවෘත ආර්ථිකය ශ්‍රී ලංකාවට පැමිණි මුල් දශකයේ සිට සැණකෙළි වලින් පිරී ගියේය. මහපොල, ගම්උදාව වැනි රාජ්‍ය මැදිහත් වීම් සහිත සැණකෙළි වල සිට පුද්ගලික අංශය හා විවිධ සංවිධාන මගින් ද සැණකෙළි පැවැත්වීම ඇරඹුනේය.

කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය ද 2016 වර්ෂයේ 18 වන වරටත් පැවැත්වූ අතර එයට සහභාගී වු පිරිස දළවශයෙන් කාණ්ඩ තුනකට වර්ගී කරනය කර ගත හැක. පාඨකයන්, පාරිභෝගිකයන් හා තරුණයන් ලෙසය. එහිදී පැමිණෙන සියලු දෙනාහට එම පරිශ්‍රයට ඇතුල්වීමේදී ගාස්තුවක් අය කරනු ලැබේ. තවද පොත් මිලදී ගැනීමේදී හා පොත් තේරීමේදී යම් රැල්ලකට එම පොත් අලෙවි වූ බවට නිරීක්ෂණය කළ හැක. සැබෑ පාඨකයන්ට ගුණාත්මක පොතක් තෝරා ගැනීමට මහත්

මෙම පොත් ප්‍රදර්ශනය තුළට පාඨකයන්ට අමතරව පාරිභෝගිකයන් හා තරුණයන් අද්දවා ගැනීමට නම් එය සැණකෙළියක ස්වභාවයක් ගතයුතු බවට එහි සංවිධායකයන්ගේ මතය වේ. ගුණාත්මක පොත පත ජනතාව තුළට ගෙනයාමට මෙම පොත් ප්‍රදර්ශනයෙන් වැඩි අවස්ථාවක් උදාකර නොමැති නිසා මෙය කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය නොව, කොළඹ ජාත්‍යන්තර පොත් සැණකෙළිය ලෙස මෙහි නම වෙනස් කර 2017 වසරට 19 වරටත් පවත්වන්නේ නම් එය වඩාත් සුදුසු බව හැඟේ.

## මාක්ස්වාදී ඇසින්

# කලාවේ උපත හා ගමන්මග

මෙයට වසර මිලියනයකට පමණ පෙර රුක්මත ජීවත් වූ වානර ප්‍රභේදයක් ස්වභාව දහමේ ඇති වූ පාරිසරික වෙනස්කම් නිසා රුක් මතින් බිමට බැස තැනිතලා ප්‍රදේශවල ජීවත්වීම ආරම්භ කරයි. රුක් මත ගමන් කිරීමේදී ඉදිරිපස හා පසුපස ගාත්‍රා හතරම යොදා ගැනීම සිදු කළත් තැනිතලාවේ ජීවිතයට පැමිණීමෙන් පසු විටින් විට දෙපයින් සිට ගැනීම නිසාත්, පසුපස ගාත්‍රාවලින් ඇවිදීමට පුරුදු වූ නිසාත් ඉදිරිපස ගාත්‍රා නිදහස් වෙයි. ඉන් පසු වසර ගණනාවක පරිණාමීය ක්‍රියාවලියක් තුළ ඉදිරිපස ගාත්‍රා අත් බවට පත්ව දෙපයින් ඇවිදින සිරුර සෘජුව තබාගත් මානවයෙක් (හෝමෝ ඉරෙක්ටස්) නිර්මාණය වෙයි. නිදහස් වූ දෑත්වලින් විවිධ දේ කිරීමට යාමේ ප්‍රතිඵලයක් ලෙස "ශ්‍රමය" බිහි වෙයි. ඒ සමග මීට වසර ලක්ෂයකට පමණ පෙර නූතන මිනිසා (හෝමෝ සේපියන්) බවට ඉහත මානවයින් පරිණාමය වෙයි. ඔවුන් විසින් පළමු වරට යැපීමේ මාධ්‍යයන් නිර්මාණය කර ගැනීම හෙවත් නිෂ්පාදනය ඉතාම සරල ස්වරූපයෙන් ආරම්භ කරයි. ඒ සඳහා ශ්‍රමය නම් හැකියාව ඔවුන් තුළ බිහි වෙයි. ශ්‍රමයේ උපකරණය බවට අත් පත් වෙයි. වානරයාගේ සිට මිනිසා දක්වා පරිනාමයේදී ශ්‍රමයත් ඒ සඳහා උපකරණය වූ දෑතත් තීරණාත්මක සාධක වෙයි.

කලාව පිළිබඳව කථා කිරීමට සූදානම්ව මානව පරිණාමය පිළිබඳව විස්තර කරන්නේ ඇයිදැයි දැන් ඔබ සිතනවා ඇති. කලබල වියයුතු නැත. කලාව ආරම්භ වූයේ මෙතැනින් නිසා ඉහත සරල පැහැදිලි කිරීම අපට අවශ්‍ය විය.

ඇත්තෙන්ම කලාව බිහිවුණේ මිනිසා බිහිවීමත්, මිනිසා මානව සමාජයක් ලෙස සංවිධානය වීමත් සමගයි. ඊට මොහොතකටවත් පෙර නොවේ. ශ්‍රම හැකියාවක් සහිත නිදහස් වූ දෑත් නොවුණිනම් කලාවක් බිහිනොවනු ඇති. මතක තබා ගැනීම හා තාර්කික චින්තනය සහිත ද්‍රව්‍යමය ඉන්ද්‍රියක් බවට මිනිස් මොළය වර්ධනය නොවුණි නම් කලාව බිහි නොවුනු ඇත. සත්‍යය එයයි. ඒ අනුව කලාව ශ්‍රමයේ හා සෞන්දර්යාත්මක චින්තනයේ ඵලයක් වේ.

කලාව බිහි වූයේ මිනිසා තුළය යන්න තවදුරටත් තහවුරු කර ගැනීමට සත්ව රංචුවක් හා මිනිස් සමාජය අතර ඇති වෙනස තේරුම් ගැනීමට අපට සිදු වේ. සත්ව රංචුවක බැඳීම පවතින්නේ ජීව විද්‍යාත්මක සාධක මතයි. එහෙත් මානව සමාජය යනු නිපදවීම, බෙදාහැරීම, පරිභෝජනය නැවත නිෂ්පාදනය යන සාධක මත එකිනෙකා හා බැඳුණු ප්‍රජාවකි. මෙහිදී මිනිසා සතුන්ගෙන් වෙනස් වන ප්‍රධාන කරුණු තුනක් තිබේ. ඒවා කලාවටද වැදගත්ය. ඒවා නම් ශ්‍රම හැකියාව, තාර්කික චින්තනය හා භාෂාවක් කථා කිරීමේ හැකියාවයි. කලාව බිහිවූයේ මෙම හැකියාවන් සහිත මිනිසා බිහිවීමත් සමග ඔහු තුළය. මිනිසා යනු සිය යැපීමේ මාධ්‍යන් නිෂ්පාදනය කර ගන්නා හා ඒවා පරිභෝජනය කරන සත්වයෙක් පමණක් නොව සෞන්දර්යාත්මකව සිතන හා සෞන්දර්යය වින්දනය කරන සත්වයෙක්ද විය. ආදි කාලීන මිනිසා තුළ අනෙකුත් හැකියාවන් මෙන්ම සරලව හා ප්‍රාථමිකව පැවති සෞන්දර්යාත්මක හැකියාවන්ද මානව ඉතිහාසය තුළ ක්‍රමිකව වර්ධනය වී වර්තමානයේ පවතින දියුණු කලාවක් බවට පත් වූ බව පැහැදිලිය.

කලාව යනු අහම්බයක්වත් දෙවියන්ගේ නිර්මාණයක්වත් නොව මිනිසා තුළ නිර්මාණය වූ හා පවතින විශේෂ සෞන්දර්යමය හැකියාවක ප්‍රතිඵලයක් බව මෙයින් ද පෙනෙයි. එය මිනිස් මොළයේ විශේෂ ගුණයකි. විශේෂ හැකියාවකි.

මානව ඉතිහාශයේ අපට මුණ ගැසෙන ඉපැරණි හා ප්‍රාථමික කලාවන් සියල්ල මිනිසාගේ නිෂ්පාදන ක්‍රියාවලිය සමග බැඳුණු ඒවා වේ. ප්‍රාථමික මිනිසා තුළ වර්ධනය වූ ප්‍රාථමික කලාවක් වූයේ ගල්ලෙන් චිත්‍ර, ගෝත්‍රික නැටුම්, ගායනා හා කැටයම්ය. දැනට ලොව සොයාගෙන තිබෙන පැරණිම චිත්‍ර ලෙස සැලකෙන ස්පාඤ්ඤයේ අල්ටිමීරා ගුහාවලින් සොයාගත් චිත්‍රවල ඇත්තේ හා වෙනත් ගුහා තුළ චිත්‍රණය කර තිබෙන්නේත් සතුන්ගේ රූපය. ඈත අතීතයේ දඩයමෙන් ජීවත් වූ මිනිසුන් තම අත්දැකීම් අන් අය වෙත සම්ප්‍රේෂණය කිරීම සඳහාත් තමා තුළ වූ හැඟීම ප්‍රකාශ කිරීම සඳහාත් මෙම සත්ව රූප චිත්‍රයට නගන්නට ඇත. එසේම මුල්ම ගීත හා නැටුම්ද, නිෂ්පාදන ක්‍රියාවලියට සම්බන්ධ විශේෂයෙන්ම දඩයම හා බැඳුණු ඒවා බව පෙනෙයි.

මානව සමාජ සංවර්ධනයේදී මිනිසා වැඩිම කාලයක් දිවිගෙවා ඇත්තේ ප්‍රාථමික සාමූහික සමාජය නම් සමාජ ක්‍රමය තුළය. එම සමාජය සංවර්ධනය වූයේ ඉතා හෙමිනි. එහි නිෂ්පාදන උපකරණ ඉතාම නොදියුණු ප්‍රාථමික ඒවා විය. නිෂ්පාදනය ඉතාම සරල විය. ආහාරයට යමක් සොයාගැනීම සඳහා හැම දෙනාම වැඩකළ යුතු විය. එකල මානව ශ්‍රමය අතිරික්ත වටිනාකම් ඉපදවීමට තරම් සමත් නොවුණු නිසා සූරාකෑම නොවීය. පංති නොපැවතිනි. ඒ නිසා රජයක් පැවතුණේද නැත.ජීවිකාව කරගෙන යාම සඳහා හැම දෙනාම වැඩ කළ යුතු වූ නිසා අන් අයගේ ශ්‍රමයේ අතිරික්තයෙන් යැපෙන "කලාකරුවන්" ප්‍රාථමික සාමූහික සමාජය තුළ දක්නට නොවීය. කලාකරුවා වූයේ නිෂ්පාදකයාමය. දඩයමේ යන කෙනාම තම අත්දැකීම ගල්ලෙනක චිත්‍රයට නැගූවේය. ඔහුම සතෙක් දඩයම් කර ගෝත්‍රයට ගෙනාවිට ඇති වූ ප්‍රීතිය පළකිරීමට ගෝත්‍රයේ සියලු දෙනා එක්ව ගිනිමැලයක් වටා එක් රැස්වී නැටුමක් නැටූහ. ගී ගැයූහ. ඊට අනුකරණය කළේ සතුන්ගේ ගමන් විලාශය හා හඬවල්ය. මුල්ම "සංගීතය" වූයේද සත්ව හමකට පහර දීමෙන් හෝ සත්ව කටු එකට ගැටීමෙන් මතු කරගත් ඒවාය. ඒ අතර සිය සිරුර විවිධ වර්ණවලින් හැඩ කර ගැනීමද, අභරණ ලෙස විවිධ දේ පැළඳීමද කළේය.

මෙලෙස මිනිසා බිහිවීමත් සමග බිහිවූ ප්‍රාථමික කලාව ප්‍රාථමික සාමූහික සමාජය තුළ හෙමින් වර්ධනය වූ අතර එය විෂයක් ලෙස වර්ධනය වීමට අදාළ පිම්මක් පැන්නේ මානව සමාජය පංති සමාජයට පරිවර්තනය වීමත් සමගයි. පංති සමාජය තුළ කලාවේ ගමන් මග විමසා බැලීමට යළි හමු වෙමු.

# Traffic

## ජීවිතයක් ගලවා ගැනීමට සිය ජීවිත කාලයෙන් මිනිත්තු 150ක් වැය කළ ඓතිහාසික මිනිසුන්ගේ කතාව




කුසගින්න තරමටම ලෝකයේ මිනිසුන් පිරිසක් දෛනිකව පීඩාවට පත් කරන සංසිද්ධියක් වේ නම් එය මාර්ග තදබදයයි. පළමුව තමාට, දෙවනුව තමා මෙන්ම පිඩාවට පත්ව සිටින තමා වැනිම වූ මිනිසුන්ටද වෛර කරමින්, පළමුව තමාගේද, දෙවනුව තමා මෙන්ම වූ සෙසු වින්දිතයන්ගේද ජීවිත අනතුරට හෙළමින් මහ මඟ ගමන් ගන්නා කිසිවෙක්, මාර්ග තදබදය යනු ක්‍රමයේම නිර්මාණයක් බව සිතන්නේ නැත. ඒ වෙනුවට, සමීපයේ සිටින අනෙකාට වෛර කරමින්, ඔවුන් මතින් තමන්ගේ පීඩනය පිට කරමින් මාර්ගයේ ගමන් ගන්නා දහසක් මිනිසුන්ගේ ජීවිතවල හෙළිදරව් නොවූ අනන්‍යතාවක් සිනමාරූපීව කියාපෑමට ගත් උත්සාහක් වශයෙන් රාජේෂ් පිල්ලේ විසින් අධ්‍යක්ෂණය කළ Traffic පෙන්වා දිය හැකිය. 2016 වර්ෂයේ ඉන්දියාවේ සිදුවූ සත්‍ය සිදුවීමක් පදනම් කර ගනිමින් නිපදවූ මෙය ඇතැම් විට, මරණය විසින් පමණක් පසක් කරන ජීවිතයේ සියුම් සෞන්දර්ය සිනමාවට නැඟූ අවස්ථාවක් වශයෙන්ද මෙය පෙන්වා දිය හැකිය. 2011 වර්ෂයේ එම නමින්ම මලයාලම් භාෂාවෙන් නිපදවුණු කෘතියේ හින්දි නිර්මාණය වශයෙන් මෙය නිපදවිණි.

කතාව ආරම්භ වන්නේ වර්තමාන දිනයට සති දෙකකට පෙර සිදුවූ සිදුවීම් දාමකිනි. ලොව දෙවෙනියට විශාල ජනගහනයක් සිටින ඉන්දියාවේ ප්‍රදේශ කිහිපයක එකිනෙකට සම්බන්ධ නැති සිදුවීම් පෙළක් සිනමාකරු මුලින්ම අප හමුවේ තබයි. එහි සහසම්බන්ධයෙන් 2008 ඔක්තෝබර් 25 වෙනිදාව ඇරඹේ.

සිය නැඟණියට රැකියාවක් ලබා ගැනීමට අවශ්‍ය මුදලක් සෙවීමට ජීවිතයේ පළමු වතාවට අල්ලසක් ලබා ගන්නා වාහන හැසිරවීමේ පොලිස් අංශයට අනයුක්තව සේවය කරන ගොඩ්බුලේ දේශපාලඥයෙකුගේ අනුග්‍රහයෙන් නැවතත් රස්සාව ලබාගෙන පළමු වරට සේවයට වාර්තා කරන දිනයයි. ඔහුගේ දියණිය සිය පියා ගැන බෙහෙවින් ලජ්ජාවට පත්ව සිටින්නී, ඔහු සමග බයිසිකලයේ ගමන් කිරීම පවා ප්‍රතික්ෂේප කරයි.

ආධුනික රූපාවාහිනී ශිල්පියෙකු වන රෙහාන් සිය වෘත්තීය ජීවිතය ආරම්භ කිරීමට ඉන්දියාවේ ජනප්‍රියතම නළුවෙකු වන දේව් කපූර් සමග සම්මුඛ සාකච්ඡාවක යෙදීමට නියමිත දිනයද එදාය. රෙහාන් සිය දික්කසාද වූ ගැහැණියක වන ආදිතීට ආදරය කරයි. සිය පළමු සම්මුඛ සාකච්ඡාවට යාමට පෙර ආදිතීව දැක ගැනීමට ඔහුට අවශ්‍ය වේ. මෘදු හිතක් සහිත මවක් හා දැඩි දයාබර හිතක් සහිත පියෙකුගේ එකම පුතා වන රෙහාන්ගේ ඉරණම මේ හමුවට ඇතිවූ කැමැත්ත මත තීරණය වේ.

සුපර්ස්ටාර් නළුවෙකු වන දේව් කපූර්ගේ නව යොවුන් දියණිය වන රියා දරුණු හදවත් රෝගයකින් පීඩා විඳියි. අතිශය අවිවේකී ජීවිතයක් ගත කරන දේව් කපූර්ට පියෙකු වශයෙන් සිය යුතුකම් ඉටු කිරීමට අවස්ථාවක් නොලැබෙනවා පමණක් නොව, වෘත්තීය කරුණුවලට හැර එවන් දේ සම්බන්ධයෙන් ඔහු තුළ උනන්දුවක්ද නැත. එහෙත් මේ නිශ්චිත 25 වෙනිදා රියා රෝහල්ගත කරන අතර දිනය තුළ හදවත් බද්ධයක් සිදු නොවුණහොත් ඇය මිය යන බව වෛද්‍යවරු ප්‍රකාශ කරති.

හදවත් රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු වන ඇබල්ගේ විවාහයේ පළමු සංවත්සරය 25 වෙනිදාට යෙදී ඇත. සිය බිරිඳට බෙහෙවින් ආදරය කරන ඔහු විවාහ සංවත්සරය වෙනුවෙන් ඇයට තෑගි දීමට අලුත්ම මෝටර් රථයක් මිලදී ගනී. ඔහු එය රැගෙන සිය බිරිඳට තෑගි කිරීමට යන අවස්ථාවේ දී සිය කළණ මිතුරාගේ පෙම්වතිය සිය බිරිඳ බව අහම්බෙන් මෙන් දැන ගනී. ඒ සමගම මොහොතට පෙර ඇය අමතා සිය මිතුරා කී දෙබසක් ඔහුගේ සිතට නඟී. 'අද හම්බ වෙන්න බෑ පැටියෝ. මං මේ ඒබල් එක්ක ඉන්නේ. අද එයාගේ විවාහ සංවත්සරේ. එයා, එයාගේ බිරිඳ පුදුම කරවන්න යන්නේ. හැබැයි, අනිවාර්යයෙන්ම අපි හෙට මුණ ගැහෙනවා. අනික හෙට බදාදා නේ. ආරක්ෂාවට ඕන දේවල් ඔයා ගේනවද, මම ගේන්නද?'

මේ සියල්ලෝම නගරයේ රතු පැහැයෙන් දැල්වී තිබෙන එකම මාර්ග සංඥා ලාම්පුවක් අබිමුව එකිනෙකාට හමුවේ. ඒ තත්පරයේ සිදුවීම සියල්ලන්ගේම ජීවිත කෙරෙහි විශාල බලපෑමක් එල්ලකරයි. එනම්, ඒ සියල්ලන්ට, තමා ගැන නොසිතා අනුන් ගැන සිතා තීරණයක් ගැනීමට බලකෙරෙන ආකරයේ සිදුවීමකි.

ට්‍රැෆික් සිනමා කෘතියේ සියල්ලෝම වීරයෝය. ඔවුන් වීරයන් වන්නේ වට්ටෝරු හින්දි සිනමාවේ අර්ථයෙන් නොවේ. ජීවිතයේ තීරණාත්මක මංසන්ධියකදී තමා වෙනුවෙන් නොව, අනුන් වෙනුවෙන් සිතා තීරණයක් ගන්නා මිනිසුන් බවට පත්වීමෙනි. නිසැකවම එහි ආත්මාර්ථයක් තිබුණේ වුවද, ශ්‍රේෂ්ඨ මිනිසුන් තීරණාත්මක මොහොතක තමන් අමතක කර අනුන් ගැන සිතන බවට ප්‍රත්‍යක්ෂ කරන තීරණ ගැනීමකි. එනයින්, ඔවුන්ගේ තීරණ අනුන්ගේ යහපත පිණිස හේතු වේ. සමස්ත සිනමා කෘතියම අපිට එක් පැහැදිලි පණිවුඩයක් ලබා දෙයි. එනම්, ජීවිතයේ එක් වරක් තමන් ගැන නොව අනුන් ගැන සිතා තීරණයක් ගන්න. ඉතිහාසය විසින් ඔබ නිසැකවම වීරයෙකු බවට පත් කරනු ඇත. සිනමා කෘතියේ සමස්ථාර්තයම මිනිත්තුවක දර්ශනයකට පෙනී සිටින මුම්බායි හි ආදිත්‍ය බිර්ලා රෝහලේ අධ්‍යක්ෂවරයා වන වෛද්‍ය සයිමන් ඩිසූසාගේ මුවට නඟන මේ දෙබසින් ප්‍රකාශ කරයි.

'හැබැයි කොමසාරිස් මහත්තයෝ තීරණයක් ගන්න කලින් එක දෙයක් මතක තියා ගන්න. ඔයා බෑ කිව්වා කියලා කිසිම

>>ඉතිරිය 03